// # ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 14,873 — 1969 සැප්තැම්බර් 26 වැනි සිකුරාද — 1969.9.26

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)

## I වැනි කොටස: (II) වැනි ඡේදය—පලකිරීම්

(වෙන වෙනම ගොනුකර ගතහැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොද ඇත)


| | පිට | | පිට |
|---|---|---|---|
| තනතුරු—ඇබෑර්තු ... ... ... | 1643 | කොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම ... ... | 1673 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 1659 | ආණ්ඩුවේ නොවන දැන්වීම් ... ... ... | — |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම ... ... ... | 1663 | රට බීම විකිණීමේ බලපත්‍ර සඳහා වූ අයදුම් පත් ... ... | — |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම ... ... | 1670 | වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම ... ... | 1674 |
| බඩු බාහිරාදිය විකිණීම ... ... ... | 1671 | විවිධ දැන්වීම ... ... ... | 1674 |


සැලකිය යුතුයි.—මෙවර ප්‍රසිද්ධ කරණු ලබන ගැසට් පත්‍රයේ VI වැනි කොටසේ ජූරි සභිකයන්ගේ සහ උපදේශකවරුන්ගේ නාම ලේඛනයක් පළවේ.

## තනතුරු—ඇබෑර්තු

### ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළ කෙරෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත් කිරීම් සම්බන්ධයෙන් අදාලවන පොදු කොන්දේසි

**දීමනා.**—ගෙවල් කුලී දීමනාව, තාවකාලික ජීවන දීමනාව, තාවකාලික විශේෂ දීමනාව යන මෙම දීමනා ඒ සම්බන්ධයෙන් අන්‍යාකාරයෙන් සඳහන් කොට නැති අවස්ථාවන් හිදී ආණ්ඩුවේ රෙගුලාසි අනුව ගෙවනු ලැබේ.

2. **සේවා කොන්දේසි.**—පත්වීම් වූ කලී රාජ්‍ය සේවා කොමිෂන් සභා ව්‍යවස්ථා, මුදල් රෙගුලාසි, කාර්ය සංවිධාන සංග්‍රහ රෙගුලාසි, දෙපාර්තමේන්තු විධාන හෝ රෙගුලාසි, යන මේවාට සහ ආණ්ඩුවෙන් කලින් කල නිකුත් කෙරෙන සෙසු විධිවිධානවලට හෝ රෙගුලාසිවලට යටත් වන්නේ ය.

3. **සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි.**—(i) විශ්‍රාම වැටුප් රහිත සංස්ථාවලට කරන පත් කිරීම්වල දී (දවස් පඩි ලබන්නන් හැර), ඒ තනතුරුවලට පත්වන්නන්ට තම පඩියෙන් සියයට 5ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට ගෙවීමට නියම කරනු ලැබේ. මීට අතිරේක වශයෙන් ස්වකීය මනාපය පරිදි තවත් සියයට 5ක් එක් කිරීමට ඔවුන්ට ඉඩ දෙනු ලැබේ. නිලධාරියා මේ දෙකෙන් කවරක් ගෙව්වත් එක් එක් මුදල් අවුරුද්ද අවසානයේ දී ඔහුට ගෙවා ඇති සම්පූර්ණ වැටුපෙන් සියයට 7 1/2 කට සමාන වන මුදලක් ඒ අරමුදලට සම්මාදම් වශයෙන් ආණ්ඩුවෙන් ද ගෙවනු ලැබේ.

(ii) ඒ ඒ තනතුරුවලට පත්වන්නන් විසින් "ඇප තැබීම කළ යුතුය" යි ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් තීරණය කරනු ලැබුවහොත් එවිට ආණ්ඩුවේ නිලධාරීන්ගෙන් (ඇප) ආඥාපනත අනුකූලව ඇප තබන ලෙස ඔවුන්ට නියම කෙරෙනු ඇත.

(iii) තනතුරුවලට පත්වන්නන් අතුරෙන් දැනටම රාජ්‍ය සේවා වෙහි සිටින්නන්ට හැර සෙස්සන්ට ලංකාවේ කවර පෙදෙසක වුවත් සේවය කිරීමට ඔවුන් සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම සඳහා ආණ්ඩුවේ වෛද්‍ය නිලධාරියකු විසින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටීමට නියම කරනු ලැබේ.

4. **රාජ්‍ය සේවයට බැඳෙන නව ප්‍රවේශකයෝ.**—(i) යම් තනතුරක් සඳහා වඩා දීර්ඝ කාලයක් නියම කොට ඇත්නම් මිස, අදාලවන පරිදි විශ්‍රාම වැටුප් සහිත/විශ්‍රාම වැටුප් රහිත තනතුරුවලට පත් කරන ලද නව ප්‍රවේශක නිලධාරීන්ගේ ආධුනික/පරීක්ෂා සේවා කාල පරිච්ඡේදය අවුරුදු තුනක් විය යුතුය.

---

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ**

**විශේෂ නිවේදනයයි**

**ඉදිරියට පලවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දැන්වීම් බාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි පළකර ඇති විශේෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. යථෝක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියළුම දැන්වීම් ඒවා එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ.**

1968 දෙසැම්බර් මස 14 වැනි දින,
**ආණ්ඩුවේ මුද්‍රණාලය.**
**කොළඹ.**

ඇල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

(ii) සියළුම නව ප්‍රවේශක නිලධාරීන් 1956 අංක 38 දරණ රාජ්‍ය භාෂා පනතේ විධිවිධානවලටත්, රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනටමත් පනවා ඇති සියලුම නීතිරීති හා ව්‍යවස්ථාවලටත් මතුවට පනවනු ලබන නීතිරීති හා ව්‍යවස්ථාවලටත් අනුකූලව ක්‍රියා කළ යුතුය යන කොන්දේසිය පිළිගත යුතුය.

(iii) (අ) ඔවුන් ස්වකීය රාජකාරි කාර්යක්ෂම ලෙස ඉටුකිරීම සඳහා අත්‍යවශ්‍යක නොවන්නාවූ අති විශේෂ අවස්ථාවන්හිදී හැර ඔවුන්ගේ ආධුනික පරීක්ෂා සේවා කාල පරිච්ඡේදය තුළදී රාජ්‍ය භාෂාව වන සිංහලය පිළිබඳ ක්‍රියාත්මක දැනුමක් ලබාගත යුතුය.

(ආ) ආධුනික/පරීක්ෂා සේවා කාලය අවසානයේදී ඔවුන්ගේ පත්වීම් ස්ථිර කිරීම, වෙනත් කරුණු අතර කණිෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයේ තත්ත්වයට වඩා උසස් නොවන තත්ත්වයක් දක්වා යොමුවන නියමිත සිංහල ප්‍රවීණතා පරීක්ෂණ, නියමිත කාල පරිච්ඡේදයක් තුළදී සමත්වීම උඩ රඳා පවතිනු ඇත. නියමිත කාල පරිච්ඡේදයන් ඇතුළත මේ ප්‍රවීණතා පරීක්ෂණවලින් සමත්වීමට අපොහොසත් වුවහොත් ඒවා සමත්වන තෙක්, ලැබිය යුතු වැටුප් වැඩිවීම් නොගෙවා හැරීම එහි ප්‍රතිඵලය වන්නේ ය. ස්වකීය ආධුනික/පරීක්ෂා සේවා කාල පරිච්ඡේදය අවසාන වන විට අවශ්‍ය සිංහල ප්‍රවීණතා තත්ත්වය ලබා නොගන්නා නිලධාරීන්ගේ සේවය නතර කරනු ලැබීමට ඉඩ ඇත්තේ ය.

**සංලක්ෂ්‍යය.**—රාජ්‍ය සේවයට බැඳීම සඳහා සිංහල මාධ්‍යයෙන් සුදුසුකම් ලබන අය, පත්වීම් ස්ථිර කිරීමේ පූර්ව නියමයක් වශයෙන් මේ සිංහල ප්‍රවීණතා පරීක්ෂණයන්ගෙන් සමත්වීමෙන් නිදහස් කරනු ලබති.

5. **අවශ්‍ය සුදුසුකම්.**—(i) තමා ලාංකිකයෙකු වූ බවට සෑහෙන සාක්ෂ්‍ය සෑම ඉල්ලුම්කරුවෙකු විසින්ම ඉදිරිපත් කළ යුතුය. ලාංකික යනුවෙන් සඳහන් කෙරෙනුයේ පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ රටවැසියකු වූවෙකි.

(ii) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකපත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට උසස් විභාගයකින් සමත්ව සිටීම අඩුම අධ්‍යාපනික සුදුසුකම ලෙස නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන්නකු සිංහල මාධ්‍යයෙන් අධ්‍යාපනය ලත් සිංහලයකු වෙතොත් ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකපත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් සිංහල භාෂාව විෂයයෙන් හෝ ඊට සමාන විෂයයකින් හෝ සාමාර්ථය ලබා තිබිය යුතුය. (වර්ෂ 1961 ජනවාරි 1 වෙනිදාට පෙර සිට රාජ්‍ය සේවයේ යෙදී සිටියාවූ ද රාජ්‍ය සේවයේ වෙනත් තනතුරු ලබනු කැමැත්තාවූ ද නිලධාරීන් සම්බන්ධයෙන් මෙම නියමය අදාළ නො වන්නේ ය.)

6. **යුද්ධ සේවා අනුග්‍රහය.**—මෙම තනතුරු සඳහා අන්‍ය සෑම අයුරෙකම සුදුසුකම් ලැබ සිටින්නාවූ, මහා රැජිණියන් වහන්සේගේ යුද්ධ හමුදාවන්හි යෙදී සිටි සේවාමුක්ත වූද අයට සහාය ගිනි නිවන සේවාව, ගගන ප්‍රහාර නිවාරණ සේවාව, මහාජනාරක්ෂක සේවාව යන මෙම සේවාවන්හි සම්පූර්ණ කාල සේවයෙහි යෙදී සිටි සිය කැමැත්තෙන් ම සේවයෙන් අස්වූවන් හැර) සෑම කෙනෙකුටමද ඔව්හු 1945 අගෝස්තු මස 15 වෙනි දිනට පෙර එම හමුදාවන්ට බැඳී සතුටුදායක ලෙස නොකඩවා සේවය කළෝ නම් වයස පිළිබඳ සුදුසුකම් ලබාගැනීම සඳහා පමණක් ඉතා ඈතින් 1939 සැප්තැම්බර් 3 වැනි දිනත් ඉතා මෑතින් 1949 දෙසැම්බර් 31 වැනි දිනත් යන මේ දෑතුර තමන් සේවයෙහි යෙදී සිටි කාල පරිච්ඡේදය තම වයසින් අඩු කර ගැනීමට ඉඩදෙනු ලැබේ.

7. **වෙනත් අවශ්‍ය කරුණු** (i) දැනට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සුදුසුකම් ඇති නිලධාරීන් මෙම තනතුරුවලට ඉල්ලුම් පත් එවිය යුත්තේ ස්වකීය දෙපාර්තමේන්තුවල ප්‍රධානයන් මාර්ගයෙනි. එතෙකුදු වුවත්, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් තැන විසින් ප්‍රසිද්ධ කරන ලද තනතුරක් පිළිබඳව ඉල්ලුම් කරන සෑම රජයේ සේවයේ නිලධාරියෙකු විසින් ම, තම ඉල්ලුම් පත්‍රය එසේ එව්වේ කවදාදැයි, ඒ සඳහා සපයා ඇති "ආ" සලකුණ දරණ මුද්‍රිත තැපැල් පතේ ලියා, ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසාන දින හෝ ඊට කලින් හෝ ලැබෙන ලෙස, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් තැන වෙත කෙළින්ම එවිය යුතුය. රාජ්‍ය සේවාවේ ස්ථිර තනතුරු දරණ නිලධාරීන් විසින් එවන ලද ඉල්ලුම් පත් ඉදිරිපත් කිරීමේදී, ඒ ඒ දෙපාර්තමේන්තු ප්‍රධානීහු එම ඉල්ලුම්කරුවන් (තෝරාගනු ලැබුව හොත්) කාර්ය සංවිධාන සංග්‍රහයේ 109 වැනි පාලන රෙගුලාසියට අනුකූලව ඔවුන්ගේ නිලවලින් මුදා හැරීමට තමන් සූදානම්ව සිටිත්ද, නැද්දැයි සඳහන් කොට එවිය යුතුය.

(ii) සම්මුඛ පරීක්ෂණයක් සඳහා නියමිත වේලාවක දන්වනු ලබන තැනට පැමිණෙන ලෙස අපේක්ෂකයන්ට නියම කරනු ලැබිය හැකිය. මේ සම්බන්ධයෙන් කිසිම ගමන් වියදමක් හෝ අන්කිසි වියදමක් හෝ ගෙවනු නොලැබේ.

(iii) කිසියම් අපේක්ෂකයකු ගැන නිර්දේශයක් කිරීමට යමෙකුට වුවමනා නම් ඔහු එසේ කළ යුත්තේ එම අපේක්ෂකයාට සහතික පත්‍රයක් දීමෙනි. යම් අපේක්ෂකයකු තෝරා ගැණුම සම්බන්ධයෙන් කවර අන්දමකින් වුවත් අයථා අනුග්‍රහයක් ලබා ගැනීමකට හෝ බලපෑවැත්මකට හෝ උත්සාහයක් දරනු ලැබුවහොත් ඒ හේතුවෙන්ම ඒ අපේක්ෂකයා නුසුදුසු බවට පත් වන්නේ ය.

(iv) යම් අයදුම්කරුවකුගේ ඉල්ලුම් පත්‍රයෙහි යම්කිසි අසත්‍ය තොරතුරක් සඳහන් කොට තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන්ම ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණිනම් රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

(v) මේ දැන්වීමේ සඳහන් නිගමනයන්ට කවර ලෙසකින් වුවත් නොගැළපෙන ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂෙප කරනු ලැබේ.

8. **සුදුසුකම් ලැබීම සඳහා වැටුප් යන්නෙහි විග්‍රහය.**—සුදුසුකම් ලැබීම සඳහා වැටුප් යනුවෙන් අදහස් කරනුයේ මූලික ස්ථිර තනතුරේ වැටුප් පමණි. වැඩ බැලීම සඳහා ගෙවන වැටුප් දීමනා ආදිය කිසිවක් ඊට ඇතුළත් නොවේ.

---

අංකය : ඒජ්. 87/එක්ස්. 2150/69

## කොළඹ වරාය කොමිෂන් සභා දෙපාර්තමේන්තුවේ විදුලි ඉංජිනේරු තනතුර

කොළඹ වරාය කොමිෂන් සභා දෙපාර්තමේන්තුවේ විදුලි ඉංජිනේරු තනතුර සඳහා ඉල්ලුම් පත් එවන ලෙස ආරාධනය කරනු ලැබේ. මෙම කාර්යාලය මගින් සපයන මුද්‍රිත ආකෘති පත්‍රයන්හි වූ ඉල්ලුම් පත් පහත සඳහන් දිනයට හෝ ඊට පෙර කොළඹ 1, තැ.පෙ. 500, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ලැබෙන සේ එවිය යුතුයි :—

(ඒ) මෙරට අයදුම්පත්—1969 ඔක්තෝබර් මස 9 වැනිද.

(බී) විදේශීය අයදුම්පත්—1969 ඔක්තෝබර් මස 17 වැනිද.

**සටහන් :**

(i) මුද්‍රිත ඉල්ලුම් පත්‍ර පෝර්ම තැපැලෙන් එවන ලෙස ඉල්ලුම් කරන විට අයදුම්කරු රාජ්‍ය සේවයේ නියුතු නිලධාරියෙක්ද නැද්ද යනු ඉතාමත් පැහැදිලිව සඳහන් කරමින් 9″ × 4″ ප්‍රමානයට කුඩා නොවූද තම ලිපිනය ලියන ලද්දවූද මුද්දර නොගැසුවාවූද, ලියුම් කවරයක් එවිය යුතුයි.

(ii) ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ හා සම්බන්ධිත ලියමනක් තැපැලේදී නැතිවූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සළකා බැලිය හැකි නොවේ. අවසාන දිනයන් දක්වා ඉල්ලුම් පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභහානි අයදුම්කරුවන් විසින්ම විඳ දරාගත යුතුයි.

(iii) පිටරටවල අයදුම්කරුවන්ට මුද්‍රිත ඉල්ලුම් පත්‍ර පෝර්ම විදේශයෙහි සිටින ලංකා නියෝජිතයන්ගේ කාර්යාල වලින් ලබාගත හැකිය. තම ඉල්ලුම් පත්‍ර රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත එවනු සඳහා තමන් පදිංචි හෝ තමන්ට ආසන්නම හෝ රටට පත් කොට සිටින ලංකා නියෝජිතයන්ගේ කාර්යාලයට නියමිත කාල සීමාව ඇතුළතදී බාරදීමට අයදුම්කරුට සිය අභිමතය පරිදි පිළිවන.

(iv) **වෛද්‍ය පරීක්ෂණය සහ නැව් ගාස්තු.**—ලංකාණ්ඩුව යටතේ සේවය සඳහා පත් කරනු පිණිස විදේශයෙන් තෝරාගනු ලබන ලාංකික නිළධාරීන්, ඔවුන් සේවය සඳහා ශාරීරික වශයෙන් යෝග්‍යදැයි දැනගනු පිණිස, පිළිගත් වෛද්‍යවරයකු ඉදිරියෙහි පරීක්ෂණයක් සඳහා පෙනී සිටිය යුතුය. එම පරීක්ෂණය සඳහා ගාස්තුවත්, ලංකාවට පැමිණීමට සඳහා ඔවුන්ගේ නැව් ගාස්තුවත් ඔවුන් විසින්ම ගෙවිය යුතුය.

2. **සේවයෙහි නියුක්ත කරවීමේ වගන්ති හා කොන්දේසි.**—(i) තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය.

(ii) තෝරා ගන්නා ලද අයදුම්කරුට කෙටි දැනුම්දීමකින් තනතුර භාර ගැනීමට සිදුවනු ඇත.

3. **වැටුප් සහ දීමනා.**—මෙම තනතුරට හිමි වාර්ෂික වැටුප් ක්‍රමය මෙසේය—වර්ෂයකට රුපියල් 5,160—360 × 3—6,240/6,960—360 × 4—480 × 10—රු. 13,200 යන වැටුප් ක්‍රමය මේ තනතුරට අයත්ය. මේ වැටුප් ක්‍රමයෙහි රුපියල් 11,280 වැටුප් පියවරෙහි දෙවර්ෂයක නැවතීමක්ද රුපියල් 6,960 සහ රුපියල් 11,280 යන වාර්ෂික වැටුප් වලට පළමු කාර්යක්ෂමතා කඩඉම්ද තිබේ.

සටහන:—(i) ඉහත සඳහන් වැටුප් ක්‍රමයෙහි රුපියල් 10,800 වාර්ෂික වැටුප ඉක්මවා වැටුප් ලැබීමට හිමිවන්නේ ලංඩන්හි විදුලි ඉංජිනේරු ආයතනයේ සාමාජිකත්වය ලබාගත් පසුවයි.

(ii) මෙම සාමාජිකත්වය ලබාගත් දින සිට එවකට රුපියල් 7,320 ක වැටුප හෝ ඊට වඩා උසස් වැටුපක් ලබමින් නොසිටියහොත් ඉහත සඳහන් වැටුප් ක්‍රමයෙහි වර්ෂයකට රුපියල් 7,320 ක වැටුපක් එදින සිට ලැබීමට අයදුම්කරුවා හිමිවේ.

4. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවෙකුම පහත සඳහන් කරුණු සනාථ කිරීමට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(ඒ) විශිෂ්ඨ චරිතයෙන් හා හොඳ ශාරීරික සනීපයෙන් යුක්ත බව.

3. **වැටුප් සහ දීමනා.**—මෙම තනතුරට හිමි වාර්ෂික වැටුප් ක්‍රමය මෙසේය : රු. 16,800—600 × 2—රු. 18,000.

4. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවකුම පහත සඳහන් කරුණු සනාථ කිරීමට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(ඒ) විශිෂ්ඨ චරිතයෙන් හා හොඳ ශාරීරික සනීපයෙන් යුක්ත බව.

(බී) (i) ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ සාමාජිකත්වය ;

(ii) ගණකාධිකරණ විෂයෙහි වෘත්තීය සුදුසුකම් ලැබීමෙන් පසු, ගණන් තැබීම/මුදල් කළමනාකාරිත්වය සහ/හෝ ගණන් පරීක්ෂාව පිළිබඳ දස අවුරුද්දකට වැඩි පළපුරුද්දක්.

(සී) 1969.10.9 වැනි දිනට වයස අවුරුදු 45 ට නොවැඩි විය යුතුයි. (දැනටමත් රජයේ සේවයේ නියුක්ත අපේක්ෂකයින් කෙරෙහි මෙම වයස් සීමාව බලපානු නොලැබේ.)

5. පහත සඳහන් ලියකියවිලි එකක් හෝ සියල්ලම අවශ්‍ය විටෙක ඉදිරිපත් කිරීමට සෑම අපේක්ෂකයෙකුම සූදානම් විය යුතුය :—

(ඒ) උප්පැන්න සහතිකය (සැ.යු.—අධ්‍යාපන රෙගුලාසි පරිදි උපකෘත පාසැලක ප්‍රයෝජනය සඳහා ඉදිරිපත් කරන ලද සහතික හෝ බවුතීස්ම සහතික භාරගනු නොලැබේ.)

(බී) උපාධි හෝ උසස්ම අධ්‍යාපනික සහතිකය.

(සී) චරිත සහතික දෙකක්—මින් එකක් අධ්‍යාපන අධ්‍යක්ෂක තැනගෙන් හෝ විද්‍යාලයීය ආචාර්යවරයාගෙන් හෝ මහාචාර්යවරයාගෙන් විය යුතුය.

(ඩී) වෘත්තීය සහ/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතික.

(ඊ) සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් සමත් උසස්ම විභාග පිළිබඳ සහතික.

සැළකිය යුතුයි :

(i) අයදුම් පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් හෝ නොඇමිණිය යුතුය.

(ii) ඉල්වූ අවස්ථාවක ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකි වන අපේක්ෂකයින්ගේ අයදුම්පත් සලකා බලනු නොලැබේ.

6. රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් විසින් තම තමන්ගේ ඉල්ලුම්පත්‍ර ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. එසේකුදු, වුවත්, තම ඉල්ලුම් පත්‍ර එසේ එව්වේ කවදදැයි ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසාන දිනදී හෝ ඊට පෙර හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැනගන්නට ලැබෙන සේ ඔහු වෙත කෙලින්ම ලියා එවිය යුතුය. ඉල්ලුම් පත්‍ර පෝර්මය සමග තමන්ට එවන ලද (''බී'' සලකුණ දරන) මුද්‍රිත තැපැල්පත මේ සඳහා භාවිතා කළ හැකිය.

7. අයදුම් පත් හෝ ඒ සම්බන්ධ අනෙක් ලියකියවිලි සියල්ලක්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් තැනට හැර මෙම දෙපාර්තමේන්තුවේ කිසියම් නිලධාරියකුගේ නමට පුද්ගලිකව නොඑවිය යුතුය.

8. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වන ඡෙදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාලවන පොදු කොන්දේසිවලට අවධානය යොමු කරනු ලැබේ.

9. අයදුම්කරුවන් විසින්, ඉල්ලුම් පත්‍ර පෝර්මය සමඟ තම තමන්ට නිකුත් කරන ලද (''ඒ'' සලකුණ දරන) මුද්‍රිත තැපැල් පත, එහි සඳහන් කොට ඇති පරිදි සම්පූර්ණ කොට ආපසු එවිය යුතුය. එවිට ඉල්ලුම් පත්‍ර පෝරමය මේ කාර්යාලයට ලැබුණු බව ඔවුන්ට දන්වනු ලැබේ. මේ නියමය නොපිළිපදින අයදුම්කරුවන්ගේ ඉල්ලුම්පත් ලැබුණ බව ඔවුන්ට දන්වනු නොලැබේ. මේ නියමය පිළිපදින්නාවූ ද ඉල්ලුම්පත්‍ර භාරගන්නා අවසාන දිනයේ සිට සති තුනක් ඇතුළත, තම ඉල්ලුම් පත්‍රය ලැබුණු බවට දැන්වීමක් නොලැබෙන්නාවූ ද අයදුම්කරුවන් විසින් ඒ බව වහාම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැනුම් දිය යුතුය. මේ විධානය ඉටුකිරීම පැහැර හැරියොත් අයදුම්කරුවකු ගැන සලකා බලනු ලැබීම සම්බන්ධයෙන් ඔහුට ඇති අයිතිය අහිමි වේ.

ඩී. ආර්. ඇල්. බාලසූරිය,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1969 සැප්තැම්බර් මස 19 වැනි දින,
කොළඹ 1, ගාලුමුවදොර මහ ලේකම් ගොඩනැගිල්ලේ,
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේ දී ය.
තැ.පෙ. 500.

9–1006/3—69.9.26 දින අංක 14,873 දරන ගැසට් පත්‍රය

---

## ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ ගමනාගමන පිරිවැය නිලධාරි තනතුර

අංක : ඒබී. 75/එක්ස්. 2131/69.

ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ ගමනාගමන පිරිවැය නිලධාරි තනතුර පිළිබඳ අංක 14,867 හා 1969 අගෝස්තු මස 15 වැනි දිනැති රජයේ ගැසට් පත්‍රයේ පළ කළ අංක ඒබී. 75/එක්ස්. 2131/69 හා 1969 අගෝස්තු මස 8 වැනි දින දරණ නිවේදනය සම්බන්ධවයි.

2. යටකී නිවේදනයේ පළමු වැනි ඡෙදයේ දක්වන පදවි නාමයෙහි '' ගමනාගමන '' යන වචනයට ඉදිරියෙන් ඇති '' ප්‍රධාන '' යන වචනය ලොප් කළ බව මහජන දැනගැනීම පිණිස මෙයින් දැනුම් දෙනු ලැබේ.

3. මෙම තනතුර සඳහා ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසාන දිනය 1969 ඔක්තෝබර් මස 2 වැනි දින දක්වා දීර්ඝ කර ඇත.

ඩී. ආර්. එල්. බාලසූරිය,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1969 සැප්තැම්බර් මස 19 වැනි දින.
කොළඹ 1, ගාලු මුවදොර මහ ලේකම් ගොඩනැගිල්ලේ,
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේ දීය.
තැ.පෙ. 500.

9–860—69.9.26 දින අංක 14,873 දරන ගැසට් පත්‍රය

---

## රාජකීය ලංකා නාවික හමුදව

### සහකාර ගබඩා භාරකාර තනතුර

රාජකීය ලංකා නාවික හමුදවේ සහකාර ගබඩා භාරකාර තනතුරක් සඳහා ඉල්ලුම් පත් ලාංකිකයින්ගෙන් කැඳවනු ලැබේ.

2. **වැටුප්.**—මෙම තනතුරට අදල වැටුප් ක්‍රමය වසරකට රු. 1,320—72—රු. 2,688 කි.

3. **අධ්‍යාපනික සුදුසුකම් හා වෙනත් සුදුසුකම්.**—සෑම අයදුම්කරුවෙකුම පහත සඳහන් සුදුසුකම් ඇති බවට සහතික ඉදිරිපත් කළ යුතුය:—

(i) (අ) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකය හෝ,

(ආ) සිංහල/දෙමළ භාෂාව සහ ගණිතය/අංක ගණිතය ඇතුලුව දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයය 6 කින් ලද පොදු අධ්‍යායන (සාමාන්‍ය පෙල) සහතිකය

හෝ

(ඇ) ඊට සමාන උසස් විභාගයකින් හෝ ලත් සාමාර්ථය.

(ii) ගබඩා භාරකාරත්වය හා ගණන් තැබීම පිළිබඳ හොඳ දැනුමක් ද ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක හෝ සැලකිය යුතු පෞද්ගලික ව්‍යාපාරයක යටත් පිරිසෙයින් අවුරුදු 5 ක් කල් ගබඩා භාර කටයුතු වල යෙදී සිට ලත් පලපුරුද්දක් ද තිබිය යුතුය. නාවික හා ඉංජිනේරු බඩු බාහිරාදිය පිළිබඳ පළපුරුද්ද විශේෂ සුදුසුකමක් සේ සලකනු ලැබේ.

4. **අවශ්‍ය වෙනත් සුදුසුකම්.**—පහත සඳහන් සුදුසුකම්ද ලබා ඇති බවට සෑම අයදුම්කරුවෙක්ම සාක්ෂි සැපයිය යුතුය:—

(i) 1969 ඔක්තෝබර් 10 දිනට වයස අවුරුදු 35 ට නොවැඩි විය යුතුය. (රජයේ සේවයේ නියුක්ත වූවන් කෙරෙහි මෙම වයස් සීමාව බල නොපානු ඇත).

(ii) යහපත් චරිතයකින් හා හොඳ ශාරීරික සෞඛ්‍යයෙන් සමන්විත විය යුතුය.

5. **සේවා නියමයෝ.**—(i) තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් ද සහිතය. තෝරාගනු ලබන අපේක්ෂකයා වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය.

(ii) තෝරාගත් අයදුම්කරු කෙටිකාල දැන්වීමකින් රාජකාරි භාරගත යුතුවාක් මෙන්ම ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටද සූදානම්ව සිටිය යුතුය. දැනට මෙම ඇබෑර්තුව ඇත්තේ ත්‍රිකුණාමලයේ නාවිකාංගණයේය.

6. **සේවා කොන්දේසි.**—තෝරා පත්කර ගනු ලබන අපේක්ෂකයා රජයේ භාෂා ප්‍රතිපත්තිය පිළිබඳ රාජ්‍ය සේවයේ නව ප්‍රවේශකයකු නම්—

(i) ආධුනික කාලය අවුරුදු 3 ක් වේ.

(ii) 1956 වර්ෂයේ අංක 33 දරණ රාජ්‍ය භාෂා පනතෙහි විධිවිධාන ක්‍රියාත්මක කිරීම විශේෂ කොට ඇතිව රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම් වස් මෙතෙක් පනවා ඇත්තාවූද මතුවට පැනවිය හැකිවූද සියලු ව්‍යවස්ථා වලට අවනත විය යුතුය.

7. මෙම ගැසට් පත්‍රයේ I වන කොටසේ (II) වන ඡෙදයේ ආරම්භයේ පලකර තිබෙන රජයේ සේවයේ තනතුරුවලට පත්කිරීම සම්බන්ධයෙන් යෙදෙන සාමාන්‍ය කොන්දේසිවලට සැලකිල්ල යොමු කරනු ලැබේ.

8. මුද්‍රිත අයදුම් පත්‍ර සපයනු නො ලැබේ. ආකෘති පත්‍ර පහත පෙනෙන ආදර්ශ ආකෘති පත්‍රයෙන් පිටපත් කරගත යුතුය.

9. දැනට රජයේ සේවයේ යෙදී සිටින නිලධාරීන්ගේ අයදුම්පත් ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළයුතුය. නියමිත දිනයෙන් පසු මෙම කාර්යාලයට ලැබෙන අයදුම්පත් භාරගනු ලබන්නේ ඒවා නියමිත දිනයට කලින් දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත ලැබී තිබුණ හොත් හා අයදුම්පත් පමාවීමට සෑහෙන හේතූන් දක්වමින් එම අයදුම්පත් භාර ගන්නා ලෙස දෙපාර්තමේන්තු ප්‍රධානීන් නිර්දේශ කළහොත් පමණකි.

10. සියලුම අයදුම් පත්‍ර ලැබුණ බව දන්වා එවනු ලැබේ. අයදුම් පත්‍ර භාරගැනීම අවසන් කොට සති 3 ක් ඇතුළත එසේ දන්වා එවනු නොලැබූ අයදුම්කරුවන් විසින් ඒ බව සාමාන්‍ය පරිපාලන ශාඛාවේ ස්ථිර ලේකම් තැනට වහාම දන්වා එවිය යුතුය. මෙම නියමය නො පිළිපදින අයදුම් කරුවෙකු ගැන සලකා බැලීම සඳහා ඇති අයිතිවාසිකම් නැතිවීමට හේතු වනවා ඇත.

11. ඉහත සඳහන් තනතුරු සම්බන්ධයෙන් 1968.11.29 වන දින පලකරන ලද අංක 14,830 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ සඳහන් දැන්වීම අවලංගු කළ බව සලකන්න.

ස්ථිර ලේකම්,
අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය.

සාප/22/128.
1969 සැප්තැම්බර් මස 13 වැනි දින,
කොළඹ 2, මැලේ වීදියේ,
අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ දී.

## ආදර්ශ ආකෘති පත්‍රය

### උඩරට නැටුම් පරීක්ෂක තනතුරු පිළිබඳ ඉල්ලුම් පත්‍රය

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන්) :————.
2. ලිපිනය :————.
3. 1969 ඔක්තෝබර් මස 11 වැනි දිනට නිවැරදි වයස :—
   අවු. :————, මාස :————, දින :————.
4. ජාතිකත්වය හා එය ලද අන්දම :————.
5. උපන් ස්ථානය :—
   (අ) ඉල්ලුම්කරු :————.
   (ආ) ඔහුගේ/ඇයගේ පියා :————.
   (ඇ) පියාගේ පියා :————.
   (ඈ) පියාගේ පියාගේත් පියා :————.
6. ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍රය හෝ ඊට සමාන වූ හෝ උසස් පරීක්ෂණයකින් ඔබ සමත්වී සිටින්නේද? (එසේ නම් එය සමත්වූ මාධ්‍යයත්, සහතික පත්‍රයේ නමත් සඳහන් කරන්න. එහි පිටපතක් ඇමිණිය යුතුය) :————.
7. උඩරට නැටුම් පිළිබඳ ලබා ඇති සුදුසුකම් (සහතික පත්‍රවල පිටපත් ඇමිණිය යුතුය) :————.
8. සිංහල භාෂාව පිළිබඳ දැනුම :————.
9. ඉගෙනීම ලැබූ පාසැල් හා විද්‍යාල :————.
10. දැනට යෙදී සිටින රක්ෂාව විස්තර සහිතව (ගුරුවරයෙකු නම් ලියාපදිංචි කළ අංකය, පාඨශාලාවේ නම, දැනට ලබන වාර්ෂික වැටුප් ක්‍රමය හා මීළඟ වැටුප් වැඩිවීමේ දිනය) :————.
11. උඩරට නැටුම් ඉගැන්වීමේ පළපුරුද්ද (මෙහි පහත දක්වෙන ෆෝර්ම යෙහි විස්තර සඳහන් කරන්න) :—

| පාඨශාලාවේ හෝ විද්‍යාලයේ නම | දරූ තනතුරු | ඇතුළත් වූ දිනය | අස්වූ දිනය | සේවා කාලය | | | අස්වීමට හේතුව |
|---|---|---|---|---|---|---|---|
| | | | | අවු. | මා. | දි. | |
| | | | | | | | |

12. යුද සේවාවට බැඳී සිටියේ නම් සේවා කාලය (අස්වීමේ සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුය) :————.
13. චරිත සහතික ලබාගත් අයගේ (ඥාතීන් නොවේ) නම් හා නිලතල සහිත සහතික තුනක පිටපත්, (මුල් පිටපත් නොවේ) ඇමිණිය යුතුය. රජයේ සේවකයන් සම්බන්ධයෙන් මෙය අනවශ්‍යය : ————.
14. වෙනත් විස්තර :————.

මෙම අයදුම් පත්‍රයෙහි සඳහන් කරන්නට යෙදුන විස්තර සත්‍ය හා නිවැරදි බවට මම මෙයින් සහතික කරමි. මේ අයදුම් පත්‍රයෙන් යම්කිසි අසත්‍ය හෝ වැරදි දෙයක් ලියා තිබෙන බව තේරීමට කලින් අනාවරණය වුවහොත් මා මෙම තනතුරට පත්වීමට නුසුදුස්සෙකු බවට පැමිණෙනවා පමණක් නොව, තේරීමෙන් පසුව ඒ බව දැනගන්නට ලැබුණහොත්, කිසිම වන්දි ගෙවීමක් රහිතව, මා රාජකාරියෙන් පහකර දැමීමට යටත්වන බව මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

9–823—69.9.26 දින අංක 14,873 දරන ගැසට් පත්‍රය

## ලංකා යුද හමුදාවේ ශිෂ්‍ය භට නිලධාරි තනතුරු

1. ලංකා යුද හමුදාවේ ශිෂ්‍ය භට නිලධාරි තනතුරු සඳහා ඉල්ලුම් පත් කැඳවනු ලැබේ. තෝරාගනු ලබන අයදුම්කරුවන් ලංකාවේ පුහුණු කරවනු ලැබේ.

2. ලංකා පුහුණුවීමේ කාලසීමාව සාර්ථක ලෙස නිම කිරීමෙන් පසුව, ශිෂ්‍ය භට නිලධාරීන්ව දෙවැනි ලුතිනන් වන ආරම්භක නිලයේ අධිකාරයට පත් කොට ශිෂ්‍ය භට නිලධාරියාගේ යෝග්‍යතාවයන් මෙන්ම යුද හමුදාවේ අවශ්‍යතාවයන්ද අනුව ඔවුන් යුද හමුදාවේ බලකායකට හෝ සේවාවකට ඇතුලත් කරණු ලැබේ.

3. **යෝග්‍යතාවය.**—අයදුම්කරුවන්—

(අ) ලංකා පුරවැසියන් විය යුතුය ;

(ආ) 1969 ඔක්තෝබර් 15 වැනි දිනට වයස අවුරුදු 18 ට නොඅඩුවද 22 ට නොවැඩියද විය යුතුයි ;

(ඇ) සිංහල, දෙමල හෝ ඉංග්‍රීසි භාෂාව සහ අංක ගණිතය හෝ ගණිතය සමග, යටත් පිරිසෙයින් සම්මාන සාමාර්ථ හතරක් සහිතව, දෙවරකට නොවැඩි ගණනකින් ලංකා අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය) විභාගයේදී විෂයයන් හයකින් සමත් විය යුතුය.

**සැලකිය යුතුයි.**—සාමාන්‍ය සුදුසුකම්වලට යටත්ව, භෞතික විද්‍යාවෙන් සහ ගණිතයෙන් සම්මාන සාමාර්ථ ලබා ඇති අයදුම්කරුවන් කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

(ඈ) අයදුම්කරුවන් අවිවාහකයන් විය යුතුය. පුහුණුවීම ලබන කාලය තුළදී ශිෂ්‍ය භට නිලධාරියෙකුට විවාහ වීමට අවසර දෙනු නොලැබේ.

(ඉ) අවශ්‍ය සෞඛ්‍ය තත්ත්වයෙහි සිටිය යුතුවේ. අවසාන සම්මුඛ පරීක්ෂණය සඳහා තෝරාගනු ලබන සියළුම අයදුම්කරුවන් එම සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීමට පෙර, ලංකා යුද හමුදාව මගින් පිළියෙල කරණු ලබන වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරණු ලැබේ.

4. **සේවා කොන්දේසි.**—

(අ) තෝරාගනු ලබන අපේක්ෂකයින් ශිෂ්‍ය භට නිලධාරීන් වශයෙන් බඳවා ගනු ලබන අතර, නිත්‍ය සේවයේ අවුරුදු 5කට සහ උප සේවයේ අවුරුදු 7 ක කාලසීමාවකට බඳවා ගනු ලැබේ.

(ආ) 1961 යුද හමුද වැටුප් සංග්‍රහයේ 16 වැනි රෙගුලාසිය අනුව, පුහුණුවීම ලබන කාලසීමාව තුළදී ශිෂ්‍ය භට නිලධාරියෙකුගේ වාර්ෂික වැටුප රු. 2,700 කි. ශිෂ්‍ය භට නිලධාරියෙක් වශයෙන් සේවය කරණ කාලය තුළදී ඔහුට කිසිම වැටුප් වැඩිවීමකට හිමිකමක් නොමැත.

(ඇ) යුද හමුදාධිපති විසින් නියම කරණු ලබන පරිදි ලංකාවේ පුහුණුවීම්වල නිරත වීම ශිෂ්‍ය භට නිලධාරීන්ට අවශ්‍ය වේ. පුහුණුවීමේ කාල සීමාව මාස 18 ක් පමණ වේ.

(ඈ) පුහුණුවීමේ කාල තුළදී ශිෂ්‍ය භට නිලධාරීන්ගේ තරාතිරම සෙසු නිලයන් හා සමාන වන අතර, ඔවුන් යුද හමුද නීතියට යටත් වනු ඇත.

(ඉ) (i) පුහුණුවීමේ කාලසීමාව තුළදී ශිෂ්‍ය භට නිලධාරියෙකු සිය කැමැත්තෙන්ම අධිකාරය සඳහා වූ තම අපේක්ෂකත්වය හමාර කළහොත්, එතෙක් එම ශිෂ්‍ය භට නිලධාරියා වෙනුවෙන් ලංකාණ්ඩුව මගින් දරන්නට යෙදුන සියළුම වියහියදම් දෙමව්පියන් හෝ භාරකරු විසින් ලංකාණ්ඩුවට ආපසු ගෙවිය යුතුය.

(ii) ශිෂ්‍ය භට නිලධාරියෙක් පාඨමාලාවේ නියුතුව සිටින කාලය තුළ කිනම් අවස්ථාවක වුවත්, විෂමාචාරය හේතුන් නිසා හෝ තමන් විසින්ම වලක්වා ලිය හැකි හේතුන් නිසා හෝ අධිකාරය පිරිනැමීමට නුසුදුසුයැයි බලධාරීන් විසින් වාර්තා කරණු ලැබුවහොත්, ලංකාණ්ඩුව මගින් ඔහු වෙනුවෙන් දරන්ට යෙදුන සියළුම වියහියදම් දෙමව්පියන් හෝ භාරකරු විසින් ලංකාණ්ඩුවට ආපසු ගෙවිය යුතුය.

(ඊ) අධිකාරයට පත්කිරීමේදී, ශිෂ්‍ය භට නිලධාරියෙකු වශයෙන් නිත්‍ය බල හමුදවට ඇතුලත් වූ බැඳීමෙන් ශිෂ්‍ය භට නිලධාරීන්ව මුද හරිනු ලැබේ.

(උ) නිලධාරීන් වශයෙන් අධිකාරයට පත් කිරීමෙන් පසුව අඩු වශයෙන් අවුරුදු 7 ක් යුද හමුදවේ සේවය කළ යුතුවේ.

(ඌ) වැටුප්, මතු බලාපොරොත්තු හා සේවා කොන්දේසි සම්බන්ධයෙන් පහත සඳහන් රෙගුලාසිවලින් නිලධාරීන්ට බලපවත්වනු ලැබේ :—

(1) 1961 අප්‍රේල් මස 28 වැනි දින අංක 12,395 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරණු ලැබ, කලින් කල සංශෝධිත 1961 යුද හමුද වැටුප් සංග්‍රහය.

(2) 1949 ඔක්තෝබර් මස 10 වන දින අංක 10,028 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරනු ලැබ, කලින් කල සංශෝධිත 1949 නිලධාරීන්ගේ රෙගුලාසි.

(3) 1961 සැප්තැම්බර් මස 28 වැනි දින අංක 12,680 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරණු ලැබ, කලින් කල සංශෝධිත 1961 විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික දීමනා සංග්‍රහය.

(එ) සන්නද්ධ සේවා වැන්දඹු හා අනත්දරු විශ්‍රාම අරමුදල සඳහා තම දායක මුදල වශයෙන් තම මූලික වැටුපෙන් සියයට 4 ක මුදලක් අඩුකර ගැනීම ගැන තම කැමැත්ත ප්‍රකාශ කරණ ලියවිල්ලක් යුද හමුදවට බැඳීමේදී ශිෂ්‍ය භට නිලධාරියෙක් විසින් දිය යුත්තේය.

5. මෙහි පහත 6 වැනි ඡේදයෙහි දක්වා ඇති පරිදි දෙමව්පියන් හෝ භාරකරුවන් විසින් ප්‍රකාශ පත්‍රයකට අත්සන් කළ යුතු වන අතර එය අයදුම් පත්‍රයත් සමග ඉදිරිපත් කළ යුතුවේ. අපේක්ෂකයන්ගේ දෙමව්පියන් හෝ භාරකරුවන් විසින් එකී අපේක්ෂකයින් පත්කිරීමට පෙර ප්‍රකාශ පත්‍රයෙහි අඩංගු කරුණුවලට අනුව, ලංකාණ්ඩුවත් සමග ඇපකරයකට අත්සන් කළ යුතුය.

6. **අයදුම්කරුගේ මව, පියා හෝ භාරකරු විසින් අත්සන් කළ යුතු ප්‍රකාශය.**—

(අ) ලංකා යුද හමුදවේ ශිෂ්‍ය භට නිලධාරි ඉල්ලුම්කරුවෙකු වන..............................ගේ පියා/මව/භාරකරු මම වෙමි.

(ආ) ලංකාවේ පුහුණුවීමේ පාඨමාලාවක් හැදෑරීම සඳහා පහත නම සඳහන් අයදුම්කරු තෝරා ගනු ලැබුවහොත්, මෙහි පහත සඳහන් කරුණු සම්බන්ධව වගකීම මම භාරගනිමි :—

(i) පුහුණුවීමේ කාලසීමාව තුළදී, අයදුම්කරු හට, දරන්නට වන සියළුම පෞද්ගලික වියදම් දැරීමට ;

(ii) පුහුණුව ලබන කාලය තුළ ඉහත නම සඳහන් අයදුම්කරු සිය කැමැත්තෙන්ම අධිකාරය සඳහා වූ තම අපේක්ෂකත්වය හමාර කළහොත්, ඔහු වෙනුවෙන් දරන්ට වූ සියළුම වියදම් ලංකාණ්ඩුවට ආපසු ගෙවීමට ;

(iii) පුහුණුව ලබන කාලය තුළ ඉහත නම සඳහන් අයදුම්කරු කිනම් අවස්ථාවක වුවත් (විෂමාචාරය හෝ ඔහුට තමන් විසින්ම වළක්වා ලිය හැකි හේතුන් හෝ නිසා) අධිකාරිය ලැබීමට නුසුදුසු යයි බලධාරීන් විසින් වාර්තා කරනු ලැබුවහොත් ලංකාණ්ඩුව මගින් ඔහු වෙනුවෙන් දරන්නට වූ සියළුම වියහියදම් ලංකාණ්ඩුවට ආපසු ගෙවීමට ද වේ.

————————,
අත්සන.

නම සහ ලිපිනය (පැහැදිලි අකුරෙන්) :————.

දිනය :————.

සාක්ෂිකරුගේ අත්සන :————.

නම සහ ලිපිනය (පැහැදිලි අකුරෙන්) :————.

7. **භාෂා අවශ්‍යතා.**—ලංකාණ්ඩුවේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීම සඳහා විශේෂයෙන්ම වර්ෂ 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනතේ විධිවිධාන ක්‍රියාවේ යෙදවීම සඳහා දනට පනවා ඇති ව්‍යවස්ථාවලට මෙන්ම, මින් මතු පනවනු ලබන ව්‍යවස්ථාවලට ද, අනුකූලව තෝරාගත් අපේක්ෂකයින් ක්‍රියා කළ යුතු වේ.

8. රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන්ගේ ඉල්ලුම්පත්‍ර, අපේක්ෂකයා තෝරාගත හොත් මුදලිය හැකි බවට සහතිකයක්ද සහිතව, දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා මගින් එවිය යුතුය.

9. **ඉල්ලුම් පත්‍ර.**—ඉල්ලුම් පත්‍ර පහත දක්වෙන ආකෘතියට අනුව ලියා 1969 ඔක්තෝබර් 15 වැනි දින දහවල් 12 ට හෝ එයට පෙර ලැබෙන සේ ''යුද හමුද මූලස්ථානය, තැ. පෙ. 553, කොළඹ'' යන ලිපිනයට එවිය යුතුය. අයදුම්පත බහාලන කවරයේ ''යුද හමුදවේ ශිෂ්‍ය භට නිලධාරි තනතුර සඳහා ඉල්ලුම් පත්‍රය'' යනුවෙන් සඳහන් කළ යුතුවේ. අයදුම් පත් භාරගනු ලබන දිනයට හා වේලාවට පසුව මෙම මූලස්ථානයට ලැබෙන අයදුම් පත් භාරගනු නොලැබේ. අයදුම් පත්‍ර නිකුත් කරනු නොලැබේ.

10. ඉල්ලුම් පත්‍ර සමග පහත සඳහන් සහතිකවල පිටපත් එවිය යුතුය :—

(අ) උප්පැන්නය ලියාපදිංචි කිරීමේ සහතිකය.

(ආ) දක්වා ඇති අධ්‍යාපන සුදුසුකම් සනාථ කිරීමේ සහතිකය.

(ඇ) අයදුම්කරුවා පුද්ගලිකව දන්නා හඳුනන වගකිව යුතු පුද්ගලයින්ගෙන් මෑතකදී ලබාගන්නා ලද චරිත සහතික. යටත් පිරිසෙයින් දෙකක්. මින් එක් සහතිකයක් අයදුම්කරු අවසාන වරට ඉගෙනීම ලැබූ පාසැලේ ප්‍රධානාචාර්ය තුමාගෙන් විය යුතු වේ.

11. ඉහත සඳහන් අවශ්‍යතාවයන් සපුරාලන අයදුම්කරුවන්ව මූලික තේරීම්වලට භාජනය කරණු ලැබේ. එසේ තෝරාගනු ලබන අයදුම්කරුවන්ට යුද හමුදපති විසින් නියම කරණු ලබන පරිදි පරීක්ෂණවලට පෙනී සිටීමට සිදු වන්නේය. රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශය මගින් පත් කරණු ලබන තේරීම් මණ්ඩලයක් ඉදිරිපිට තෝරාගනු ලබන අපේක්ෂකයින්ට සම්මුඛ පරීක්ෂණයකට භාජනය කිරීමෙන් අවසාන තේරීම කරණු ලැබේ.

12. තේරීම් මණ්ඩල මගින් සම්මුඛ පරීක්ෂණය සඳහා තෝරාගනු ලබන අපේක්ෂකයින්ට සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලබන ස්ථානය, වේලාව හා දිනය ලිපියකින් දනුම් දෙනු ලැබේ. සම්මුඛ පරීක්ෂණය කොළඹදී පවත්වනු ලැබේ. මේ සම්බන්ධයෙන් දරණු ලබන ගමන් වියදම් හෝ වෙනයම් වියදම් කිසිවක් ලංකාණ්ඩුව මගින් ගෙවනු නොලැබේ.

එම්. ඒ. ජයවීර,
බ්‍රිගේඩියර්,
යුද හමුදපති වෙනුවට.

1969 සැප්තැම්බර් මස 19 වැනි දින.

**ලංකා යුද්ධ හමුදවේ ශිෂ්‍ය භට නිලධාරි තනතුර සඳහා ඉල්ලුම් පත්‍රය**

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන්) :————.

2. ලිපිනය :————.

3. පුරවැසි බව (ලාංකික වනුයේ පරම්පරාවෙන්ද, නැතහොත් ලියා පදිංචිවීමෙන් දැයි දක්වා, ලියා පදිංචිවීමෙන් නම් සහතිකයේ අංකය හා දිනය සඳහන් කරන්න) :————.

4. (i) උපන් දිනය (උප්පැන්න සහතිකයකින් සනාථ කළ යුතුය. බෞතීස්ම සහතිකය හෝ අධ්‍යාපන සංග්‍රහය යටතේ නිකුත් කරනු ලබන සහතිකය පිළිගනු නොලැබේ) :————.

(ii) 1969 ඔක්තෝබර් 15 වැනි දිනට වයස :—අවුරුදු :————, මාස :————, දින :————.

5. ආසන්න පොලිස් ස්ථානය :————.

6. පියාගේ නම සහ උත්පත්තියේදී ජාතිය : (පුරවැසි බව ලැබුවෙකු නම්, සහතිකයේ දිනය හා අංකය සඳහන් කරන්න) :————.

7. මවගේ නම සහ උත්පත්තියේදී ජාතිය :————.

8. ඔබේ පාසැල් සමයේ පහත සඳහන් විස්තර සපයන්න :—

| පාසැලේ නම | ඇතුල් වූ දිනය | අස් වූ දිනය | සමත් කළ ප්‍රසිද්ධ විභාග සහ විෂයයන් |
|---|---|---|---|
| | | | |

9. ඔබ පාසැලේදී ලැබූ ක්‍රීඩා පිළිබඳ විශිෂ්ඨතාවයන් :————.

10. ඔබ විසින් පාසැලේදී ලැබූ වෙනත් සැලකිලිමත් ජයග්‍රහණ :————.

11. ලංකා ශිෂ්‍ය භට බලකායේ, බාලදක්ෂ ව්‍යාපාර, ලංකා ස්වේච්ඡා බල හමුදුව යනාදී ස්වේච්ඡා සංවිධානවල කළ සේවය :————.

12. කිසියම් සන්නද්ධ සේවාවකට කලින් ඉල්ලුම් කර ඇත්නම්, එහි ප්‍රතිඵලය දක්වන්න :————.

13. පාසැලෙන් අස්වූ තැන් පටන් කළ රැකියාව :————.

14. චරිත සහතික දුන් පුද්ගලයන්ගේ නම් සහ ලිපිනයන් :—

(අ) ————.

(ආ) ————.

15. වෙනත් අදාල කරුණු :————.

ඉහත දක්වෙන ප්‍රකාශයන්ට ම විසින් සපයන ලද පිළිතුරු මගේ දැනීමේ හැටියට සත්‍ය බැව් ගෞරව පූර්වකව ප්‍රකාශ කර සිටිමි. යුද්ධ හමුදු ශිෂ්‍ය භට නිලධාරී තනතුර සඳහා තෝරා ගනු ලබන අපේක්ෂකයින්ට බලපාන සේවා කොන්දේසි මෙන්ම නිලධාරින්ට බලපාන වැටුප්, මතු බලාපොරොත්තු හා සේවා කොන්දේසි ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කර ඇති පරිදි ම විසින් කියවා ඇති අතර එය මම අවබෝධ කර ගතිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

9–1004—69.9.26 දින අංක 14,873 දරන ගැසට් පත්‍රය

---

අංකය : විආ 3/136.

## අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශය

### 1970 ජගත් තරුණ සමුළුව—නිව්යෝක්

1970 ජනවාරි සිට මාර්තු දක්වා කාලය තුළ නිව්යෝක් නුවරදී පැවැත් වෙන 1970 ජගත් තරුණ සමුළුවට නියෝජිතයෙකු තේරීම සඳහා රජයේ සහ අනුමත පාසල්වල අ. පො. ස. (උසස් පෙළ) පළමු වසරේ ශිෂ්‍යයින් ගෙන් (ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයෙන්ම) අයදුම් පත් කැඳවනු ලැබේ.

2. **පරමාර්ථ හා අභිලාෂයන්.**—ප්‍රසිද්ධ සාකච්ඡා, සම්මේලන, පාසල් සංචාර, රූප වාහිනී වැඩ සටහන් ආදිය ඇතුලත් වැඩ සටහන්වලට ක්‍රියාශීලී ලෙස සහභාගිවීමට සාමාජිකයින්ට අවස්ථාවක් සළසාදීමත්, සමුළුවට සහභාගිවන සාමාජිකයින්ගේ පෞද්ගලික, බුද්ධිමය හා සංස්කෘතික පසුබිම අගය කිරීමෙහිලා විවිධ ප්‍රෙක්ෂක සමූහයනට අවස්ථාවක් ලබා දීමත්, මේ සම්මේලනයේ ප්‍රධාන අරමුණ වන්නේය. අමෙරිකානු ගෘහයක පදිංචිව සිටිමින්, අමෙරිකානු අධ්‍යාපන හා ආණ්ඩු ක්‍රම නිරීක්ෂණය කිරීමටත්, තමාගේ රට පිළිබඳව ප්‍රසිද්ධ සාකච්ඡාවලදී කථා පැවැත්වීමත්, ලෝකයේ වෙනත් රටවලින් පැමිණෙන තරුණ නියෝජිතයින් සමග කණ්ඩායම් හා සාමූහික කටයුතුවල යෙදීමෙන් අත්දැකීම් ලබා ගැනීමටත් ඔවුනට අවස්ථාව සලසා දෙනු ඇත.

රටවල් 30–40 කින් නියෝජිතයින් සහභාගිවන 1970 සම්මේලනයට, දිවයිනපුරා පැවැත්වෙන තරඟයකින් තෝරාගනු ලබන එක් නියෝජිතයෙකු ලංකාව වෙනුවෙන් යැවීම අපේක්ෂා කැරේ. එක රටකින් යවනු ලබන්නේ එක් නියෝජිතයෙකු බැගින් පමණක් වන හෙයින්, තෝරාගනු ලබන්නා අවශ්‍යයෙන්ම ඒ රටේ හොඳම නියෝජිතයා විය යුතු වන්නේය. ඒ නිසා, ඔහු ලංකාවේ ඉතිහාසය හා සිරිත් විරිත් ද, සමාජීය, ආර්ථික, සංස්කෘතික හා දේශපාලනමය කරුණුද පිළිබඳව පුළුල් අවබෝධයක් පෞද්ගලික වශයෙන් ඇත්තකු විය යුතුය. ඉතා චතුර ලෙස ඉංග්‍රීසි කථා කිරීමේ පුළුවන් කමක් තිබීමද අවශ්‍යය.

3. **වැඩ සටහන හා කාලය.**—1970 ජනවාරි 5 වැනිද සිට පැවැත්වෙන හැඳින්වීමේ හා සංස්ථාපිත කිරීමේ සතියකින් ආරම්භවන මේ සම්මේලනය 1970 මාර්තු මස 16 වැනි දින අවසාන වේ. සම්මේලනය අවසානයේ, යුරෝපය හරහා ආපසු පැමිණෙන නියෝජිතවරු ජිනීවා නුවර ජාත්‍යන්තර ආයතනයේ පැවැත්වෙන වැඩ සටහනක් සඳහා මාර්තු 17 සිට 25 දක්වා නතරවනු ඇත.

4. **ප්‍රතිලාභයන්.**—තෝරාගනු ලබන නියෝජිතයා සඳහා ලංකාව හා නිව්යෝක් නගරය අතර ගුවන් ගමන් පහසුකම් සලසා දෙනු ලැබේ. නවාතැන් හා කෑම්බීම්, අමෙරිකාවේදී ඔහුට ආගන්තුක සත්කාර සලසන ගෘහයක් මගින් සැපයෙනු ඇත.

5. **සුදුසුකම්.**—සෑම අයදුම්කරුවෙක් විසින්ම පහත සඳහන් සුදුසුකම් ලබා සිටිය යුතුයි:—

(i) ලාංකිකයෙකු විය යුතුයි.

(ii) රජයේ හෝ අනුමත පාසලක, අ.පො.ස. (උසස් පෙළ) පන්තියේ ප්‍රථම වර්ෂයේ පංතියක දනට ඉගෙනීම ලබන්නෙකු විය යුතුයි.

(iii) පන්තියේ ශිෂ්‍යයින් අතරින්, ඉගෙනීමේ කටයුතු අතින්, මුල් හතරෙන් කොටසට ඇතුළත් අයෙකු විය යුතුයි.

(iv) 1951.9.30 හා 1953.10.1 අතර උපන් අයකු විය යුතුයි.

(v) අ. පො. ස. (සාමාන්‍ය පෙළ) විභාගයේදී ''අ'' නිර්දේශ පත්‍රය යටතේ ඉංග්‍රීසි සඳහා යටත් පිරිසෙයින් සම්මාන සාමාර්ථයක්වත් ලබා සිටිය යුතුයි.

(vi) ඉංග්‍රීසි භාෂාවෙන් ලිවීමට උසස් ප්‍රවීනත්වයක් හා කථා කිරීමට උසස් චතුරත්වයක් ඇත්තකු විය යුතුයි.

(vii) විවිධ බාහිර වැඩවල ක්‍රියාශීලීව නිරත වන්නකු විය යුතුයි.

(viii) ප්‍රසිද්ධ සම්මේලන, රැස්වීම්, ටෙලිවිෂන් වැඩ සටහන් හා පන්ති කාමර සාකච්ඡාවලට සහභාගිවීමට පුළුවන් අයකු විය යුතුයි.

(ix) ලෝක තතු පිළිබඳව හොඳ දැනීමක් හා සැලකිල්ලක්ද, වර්තමාන ජාත්‍යන්තර ප්‍රශ්න පිළිබඳ මනා අවබෝධයක්ද, ලංකාව හා ලෝකයේ සෙසු රටවල් අතර සම්බන්ධය ගැන හොඳ අවබෝධ යක්ද, වෙනත් ජාතීන්, වෙනත් රටවල් හා වෙනත් ජීවන විධි ගැන කුතුහලයක්ද ඇත්තකු විය යුතුයි.

(x) විශිෂ්ඨ චරිතයක් හා විශ්වාසදායිවූද, වෙනත් අය සමග සහයෝග යෙන් කටයුතු කිරීමට ලැදිවූද, වෙනත් ජාතිවලට අයත් මිනිසුන්ගේ අදහස්, ආගම් හා දේශපාලන දර්ශනයන් කෙරෙහි යථා ගරුත්වයක් දක්වන්නාවූද, තමා වෙනුවෙන් අනිත් අයගේ උත්සාහයන් තේරුම්ගන්නාවූ හා අගයකරන්නාවූද කෙනෙකු විය යුතුය.

(xi) එක්සත් ජනපදයේ ගතකරන තෙමසක කාර්ය බහුල කාලයකට ඔරොත්තු දෙන විශිෂ්ඨ සෞඛ්‍ය තත්ත්වයක් තිබිය යුතුය.

(xii) එක්සත් ජනපදයට යාම සඳහා ගමන් වියදම පහසුවෙන් දැරිය හැකි පවුලකට අයත් වූවකු නොවිය යුතුය.

(xiii) මීට පෙර විදේශයකට ගිය අයකු නොවිය යුතුයි.

(ivx) තෝරාගනු ලැබුව හොත්, එක්සත් ජනපදයට යාම සඳහා දෙමාපියන්ගේ අවසරය ඇත්තකු විය යුතුයි.

(මේ කොන්දේසි සියල්ලක්ම තෘප්ති කළ නොහැකි අපේක්ෂකයින් අයදුම් නොකළ යුතුයි)

6. **අයදුම් පත්.**—මේ අමාත්‍යාංශයේ "විදේශීය ආයතන ශාඛාවෙන්" ලබාගත යුතු විශේෂ ආකෘතියක, අයදුම්කරුගේ අත් අකුරින්ම සම්පූර්ණ කළ යුතු අයදුම් පත් 1969.10.10 දිනට පෙර තමා ඉගෙන ගන්නා පාඨශාලාවේ පාඨශාලාධිපතිට, පහත සඳහන් ලියවිලිද සමග භාරදී 1969.10.14 දිනට පෙර පහත සඳහන් ලිපිනයට ලැබෙන පරිදි සීඝ්‍රගාමී තැපැලෙන් එවන ලෙස එතුමාගෙන්/එතුමියගෙන් ඉල්ලීමක් කළ යුතුය.

විදේශ ආයතන ශාඛාව,
අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය
මැලේ වීදිය, කොළඹ 2.

සීඝ්‍රගාමී තැපැලෙන් එවීම සඳහා තැපැල් වියදම අයදුම්කරු විසින් ගෙවිය යුතුයයි විද්‍යාලයාධිපති නියම කළ හොත්, අයදුම්කරු එම වියදම දැරිය යුතුයි.

**අයදුම් පතට ඇමිණිය යුතු ලියවිලි :**

(අ) පහත සඳහන් තොර දුරු අළලා ඉංග්‍රීසියෙන් ලියන ලද වචන 700–1000 ක පමණවූ තමාගේ ජීවිත විස්තරයක් :—

(i) පෞද්ගලික ඉතිහාසය හා පවුලේ විස්තර
(ii) ප්‍රධාන අධ්‍යයන කටයුතු, විශෙෂ ලැදිකම්, පෞරුෂත්වය හා නැඹුරුකම්
(iii) නිරතවන ක්‍රීඩා හා විනෝද ක්‍රීඩා
(iv) දක්ෂතා (ගායනය, නැටුම්, සංගීත භාණ්ඩ)
(v) ආගමික විශ්වාසයන් සහ හෝ/ශීල ධර්ම පිළිබඳ අදහස්
(vi) වෘත්තීය අපේක්ෂාවන්.

(තෝරාගනු ලබන අපේක්ෂකයාගේ ජීවිත විස්තරය පිටපත් කර වෙනත් නියෝජිතයින් හා නේවාසික වන ගෘහයේ මූලිකයින් අතර බෙද හරනු ලැබේ. ඒ නිසා එය ප්‍රසිද්ධ කිරීමට සුදුසුවන පරිද්දෙන් සකස් කළ යුතුය.)

(ආ) "මට වැටහෙන පරිදි මගේ රටේ ඉතා වැදගත් ප්‍රශ්නය හා එය විසඳීමට ඇති මාර්ග" යන මැයෙන් ස්වෝත්සාහයෙන් ඉංග්‍රීසියෙන් ලියන ලද වචන 700–1000 ක පමණ වාක්‍ය රචනයක්.

(ඉ) "මා විශ්වාස කරණ පරිදි ඉදිරි විසි වර්ෂය තුලදී අපට විසඳීමට සිදුවිය හැකි උග්‍රතම ලෝක ව්‍යාප්ත ගැටළුව කුමක් ද?" යන මාතෘකාව යටතේ ස්වෝත්සාහයෙන් ඉංග්‍රීසියෙන් ලියන ලද වචන 700–1000 ක පමණ වාක්‍ය රචනයක්.

(ඊ) පහත සඳහන් පරිදි නිර්දේශ ලිපි තුනක් :—

(i) අයදුම්කරුගේ අධ්‍යයන දක්ෂතා හා චරිතය සහතික කළ හැකි ආචාර්යවරයෙකුගෙන් එකි සහතිකයක්.
(ii) අවුරුදු කීපයක් තුල අයදුම්කරු දැන සිටි (ඥාතීන් නොවන) වැදගත් හා වගකිව හැකි වැඩි හිටියන් දෙදෙනෙකුගෙන් සහතික.

**සංලක්ෂය.**—ජීවිත විස්තරය හා වාක්‍ය රචනා දෙක අයදුම්කරු ස්වෝත්සාහයෙන්ම ලියූ ඒවා වියයුතු අතර, ඒවා අයදුම්කරු ස්වෝත්සාහයෙන්ම ලියන ලද බවට ඒවා මත විද්‍යාලයාධිපති සහතික කළ යුතුය. තෝරාගනු ලබන අපේක්ෂකයාගේ එකී ලියවිලි තුන එක්සත් ජනපදයට යවනු ලැබේ. ඒ නිසා, ඒවා දෙකට නැමූ (රූල් සහිත) ෆූල්ස්කැප් කඩදාසිවල වම්පැත්තේ අඟල් 1½ ක පමණ තීරයක් හිස්ව තබා සකස් කළ යුතුය.

අයදුම් පත් භාරගන්නා අවසාන දිනය 1969.10.14 වේ ප්‍රමාද වී ලැබෙන අයදුම් පත් භාරගනු නොලැබේ. එසේම, අසම්පූර්ණ අයදුම් පත් හා මේ නිවේදනයේ නියමයනට අනුකූල නොවන අයදුම්පත්ද ප්‍රතික්ෂේප කරනු ලැබේ. සියළුම අයදුම් පත් ලැබුණු බැව් දන්වනු ලැබේ. අයදුම් පත් භාර ගන්නා අවසාන දිනයේ සිට දින 7 ක් ඇතුලත අයදුම් පත ලද බවට දැන්වීමක් නොලදහොත්, ඒ බව වහාම මේ කාර්යාලයට දැනුම් දිය යුතු වේ.

7. **තේරීම.**—අයදුම් පත්, ජීවන විස්තර හා වාක්‍ය රචනා දෙක පරීක්ෂා කර බලා මණ්ඩලයක් විසින් මූලික තේරීම් කරනු ලැබේ. ඒ අනුව තෝරාගනු ලබන ස්වල්ප දෙනෙකු (කොළඹදී පැවැත්වෙන) සම්මුඛ පරීක්ෂණයක් සඳහා කැඳවනු ලැබේ. විනිශ්චය මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ඒ සම්මුඛ පරීක්ෂණයේදී, අයදුම්කරුවන්ගේ ඉංග්‍රීසි ප්‍රවීණත්වය හා චතුරත්වයද, ලංකාව ගැන හා ලෝක ප්‍රශ්න ගැන හිටිවනම කථාකිරීමේ පුළුවන් කමද පරීක්ෂා කරනු ලැබේ.

එදිනම, විනිශ්චය මණ්ඩලය හෝ එම මණ්ඩලය විසින් නම් කරණ පරිපාලකයකු ඉදිරියේදී, මණ්ඩලය විසින් ඒ අවස්ථාවේදී නියම කරන මාතෘකාවක් යටතේ වචන 500 ක පමණ තවත් වාක්‍ය රචනාවක් කිරීමට අයදුම්කරුවනට නියම කරනු ලැබේ. මේ වාක්‍ය රචනය, අයදුම්කරුවන්ට ඉංග්‍රීසියෙන් ලිවීමේ ප්‍රවීණත්වය හා විවිධ කරුණු ගැන ඇති දැනීම පරීක්ෂා කිරීම සඳහා අදහස් කැරෙන්නකි. මේ වාක්‍ය රචනයද, අයදුම්පත සමග කලින් එවන වාක්‍ය රචනා දෙක ගමස සසඳා බලනු ලැබේ.

8. කිසියම් අපේක්ෂකයකු තෝරා ගැනීම සම්බන්ධයෙන් කිසියම් අන්දමක බලපෑමක් සිදුවෙතොත් හුදෙක් ඒ හේතුවෙන්ම එම අයදුම්කරු නුසුදුසි ලෙස ප්‍රතික්ෂෙප කරනු ලබන්නේය.

අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1969 සැප්තැම්බර් 17 වැනි දින,
කොළඹ 2, මැලේ වීදියේ අධ්‍යාපන හා
සංස්කෘතික අමාත්‍යාංශයේදීය.

9–908—69.9.26 දින අංක 14,873 දරන ගැසට් පත්‍රය

---

## විභාග දෙපාර්තමේන්තුව

### උප මුද්‍රණාලයාධිපති තනතුර

විභාග දෙපාර්තමේන්තුවේ උප මුද්‍රණාලයාධිපති තනතුර සඳහා ඉල්ලුම් පත් එවන ලෙස මෙයින් ආරාධනය කරනු ලැබේ. මෙහි පහත දක්වා ඇති ආකෘති පත්‍රය අනුව පිළියෙල කරන ලද ඉල්ලුම් පත් 1969 ඔක්තෝබර් 15 වැනි දිනට මත්තෙන් මට ලැබෙන සේ ලියාපදිංචි කළ තැපැලෙන් එවිය යුතුය. සියළුම ඉල්ලුම් පත් ලැබුණ බැව් දන්වනු ලැබේ.

2. **වැටුප.**—තනතුරට හිමි වාර්ෂික වැටුප රු. 2,220න් පටන් ගෙන වර්ෂයකට රු. 120 බැගින් වර්ෂ 13කින් වැඩි වී රු. 3,780 තෙක් නගී. මේ වැටුප් පරිමාණයේ වර්ෂයකට රු. 3,060 වැටුපට පෙර කාර්යක්ෂමතා කඩඉමකින් සමත් විය යුතුය.

3. **සේවයට බඳවා ගැනීම පිළිබඳ කොන්දේසි.**—මෙය විශ්‍රාම වැටුප් සහිත ස්ථිර තනතුරකි. මුල් අවස්ථාවේදී මෙම තනතුර අවුරුදු 3ක කාලයක ආධුනිකත්වයට යටත් වේ. තෝරාගත් අයදුම්කරු විශ්‍රාම වැටුප් සහිත ආණ්ඩුවේ සේවයේ නියුක්තව සිටින්නේ නම් හෙතෙම වැඩ බැලීමට පත් කරනු ලැබේ. තනතුර ස්ථිර කරනු නොලැබුවහොත්, ආණ්ඩුවේ සේවයෙන් පිටතින් බඳවා ගනු ලැබුවකුට සේවයෙන් අස්වීමටද, ආණ්ඩුවේ විශ්‍රාම වැටුප් සහිත ස්ථිර සේවයේ නියුක්ත වූවකුට මුලින් ඉසිලූ ස්ථිර තනතුරට ආපසු යාමටද සිදු වේ. විශ්‍රාම වැටුප් සහිත ස්ථිර තනතුරක් උසුලන නිලධාරියෙක් මෙසේ ස්ථිර කරනු ලැබුවහොත් ඔහුට මුලින් ඉසිලූ තනතුරින් අස්වීමට සිදු වේ. පසුව එම තනතුරට ආපසු යාමටද ඔහුට නොහැකිය. තෝරාගත් අයදුම්කරුට කෙටි කාලයක් තුළදී පත්වීම බාරගැනීමට සිදුවනු ඇත.

4. **සුදුසුකම්.**—පහත දැක්වෙන සුදුසුකම් සෑම අයදුම්කරුවකුටම ඇති බැව් පෙන්වීමට සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(අ) 1969 ඔක්තෝබර් 15 වැනි දිනට වයස අවුරුදු 25කට නොඅඩුද, අවුරුදු 40කට නොවැඩිද බව, (දැනට රාජ්‍ය සේවාවෙහි නියුක්ත වූවන් සම්බන්ධයෙන් උපරිම වයස් සීමාව ක්‍රියාවේ නොයෙදේ).

(ආ) සිංහල හෝ දෙමළ හෝ ඉංග්‍රීසි හෝ පාඨශාලා ජ්‍යෙෂ්ඨ සහතික පත්‍ර විභාගයෙන් හෝ දෙකකට නොවැඩි වාර ගණනකදී සිංහල/දෙමළ භාෂාව සහ අංක ගණිතය/ගණිතය ඇතුළුව විෂයයන් හයකින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය) විභාගයෙන් හෝ සාමර්ථය ලබා තිබෙන බව සහ එම සහතික පත්‍ර ලැබූ භාෂාවෙන් හැර අනික් භාෂා දෙකින් එකක් සම්බන්ධයෙන් මනා දැනීමක් ඇති බව,

(ඉ) (i) මුද්‍රණ වෘත්තියෙහි අවුරුදු 6කට හෝ ඊට වැඩි කාලයක හෝ අත් දැකීමෙන් ලත් පළපුරුද්දක් ඇති බව,
(ii) වැඩ බෙදු දීම සහ කම්කරු පාලනය පිළිබඳව අත්දැකීමෙන් ලත් පළපුරුද්දක් ඇති බව,

(ඊ) ඉතා හොඳ චරිතයක් ඇති බව.

මුද්‍රණ වැඩ පිළිබඳ ලංකා කාර්මික විද්‍යාලයීය අවසාන සහතික පත්‍රය ලබා සිටින අයදුම්කරුවකු අතිරේක සුදුසුකමක් ඇත්තකු ලෙස සලකනු ලැබේ.

5. අයදුම්කරුවන්—

(1) තම ඉල්ලුම්පත්වලට පහත දැක්වෙන සහතිකවල පිටපත් අමුණා එවිය යුතුය (මේවා ආපසු එවනු නොලැබේ) :—

(අ) උප්පැන්න සහතික පත්‍රය,
(ආ) අධ්‍යයනය පිළිබඳ සිංහලෙන් හෝ දෙමළෙන් හෝ ඉංග්‍රීසියෙන් හෝ ලත් උසස්ම සහතික පත්‍ර,
(ඉ) මුද්‍රණ වැඩ පිළිබඳ අවුරුදු 6ක හෝ ඊට වැඩි කාලයක හෝ, අත්දැකීමෙන් ලත් පළපුරුද්ද පිළිබඳ සාක්ෂි පෙන්වන ලියකියවිලි,
(ඊ) වැඩ බෙදු දීම, කම්කරු පාලනය සම්බන්ධයෙන් අත්දැකීමෙන් ලත් පළපුරුද්ද ඇති බවට සාක්ෂි පෙන්වන ලියකියවිලි,
(උ) චරිතය පිළිබඳ මෑතදී ලබාගත් සහතික පත්‍ර තුනක් (දැනට රාජ්‍ය සේවාවේ නියුක්ත අයදුම්කරුවන්ගෙන් චරිත සහතික පත්‍ර අනවශ්‍යය).

(ii) තමාගේ චරිතය සහ මෙම තනතුරට ඇති සුදුසුකම් සම්බන්ධයෙන් කරුණු අසා දැනගත හැකි පුද්ගලයන් දෙදෙනෙකුගේ නම් සහ ලිපිනයන් සඳහන් කළ යුතුය.

6. මේ සම්බන්ධයෙන් ඉල්ලුම්පත් හෝ වෙන යම් ලියුම් කියුම් හෝ එවිය යුත්තේ කොළඹ 2, මැලේ වීදියේ විභාග කොමසාරිස් යන ලිපිනයට විනා මගේ හෝ මෙම දෙපාර්තමේන්තුවේ වෙන යම් නිලධාරියෙකුගේ හෝ පෞද්ගලික ලිපිනයට නොවේ.

7. මේ ගැසට් පත්‍රයේ I වෙනි කොටසේ (II) වැනි ඡේදයේ මුල පළ කරන ලද රාජ්‍ය සේවයෙහි තනතුරුවලට දෙන පත්වීම්වලට අදාලවූ පොදු කොන්දේසි බැලිය යුතුය.

ඉහත දක්වෙන කොන්දේසිවලට නොගැලපෙන අයදුම් පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

කේ. ටී. ඩබ්ලිව්. සුමනසූරිය,
විභාග කොමසාරිස්.

1969 සැප්තැම්බර් මස 19 වැනි දින,
කොළඹ 2, මැලේ වීදියේ,
විභාග දෙපාර්තමේන්තුවේ දීය.

## විභාග දෙපාර්තමේන්තුව

### උප මුද්‍රණාලයාධිපති තනතුර සඳහා එවන ඉල්ලුම් පත්‍රය

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන්) :————.
2. ලිපිනය :————.
3. දැන් උසුලන තනතුර සහ රාජකාරි ලිපිනය :————.
4. (අ) (i) පරම්පරාවෙන්, (ii) ලියාපදිංචි කිරීමෙන් (ලියාපදිංචි කිරීමෙන් නම් ලියාපදිංචි කිරීමේ සහතිකයේ අංකය දක්වන්න) ලංකා පුරවැසි බව ලැබූවෙක්දැයි සඳහන් කරන්න :————.
   (ආ) පහත සඳහන් අයගේ උපන් ස්ථාන—
      (1) අයදුම්කරු :————.
      (2) අයදුම්කරුගේ පියා :————.
      (3) අයදුම්කරුගේ සීයා (පිය පාර්ශ්වයෙන්) :————.
      (4) අයදුම්කරුගේ සීයාගේ (පිය පාර්ශ්වයේන්) පියා :————.
5. උපන් දිනය :————. වයස :————.
6. (අ) අධ්‍යයන සුදුසුකම් (සිංහල හෝ දෙමළ හෝ ඉංග්‍රිසි) :————.
   (ආ) අයදුම්කරුට මනා දැනීමක් ඇති අනික් භාෂාව :————.
7. මුද්‍රණ කර්මාන්තයෙහි කොපමණ කාලයක් අත්දැකීමෙන් ලත් පළපුරුද්දක් ලබා තිබේද යන වග :————.
8. වැඩ බෙද දීම සහ කම්කරු පාලනය පිළිබඳ අත්දැකීමෙන් ලත් පළපුරුද්ද :————.
9. මුද්‍රණ වැඩ පිළිබඳ ලංකා කාර්මික විද්‍යාලයීය අවසාන සහතික පත්‍රය ලබා තිබේද යන වග :————.
10. ඔබේ චරිතය පිළිබඳ සහතික පත්‍ර දුන් පුද්ගලයන්ගේ නම් සහ ලිපිනයන් :—.
    (1) ———— ————
    (2) ———— ————
    (3) ———— ————
11. ඔබ.—
    (1) රාජ්‍ය සේවයෙන් පහ කරනු ලැබූවෙක්ද ? :————.
    නැතහොත් ඔබේ සේවය නවත්වන ලදද ? :————.
    (2) උසාවියකින් වරදකරුවකු කරනු ලැබූවෙක්ද ? :————.
    (3) රාජ්‍ය සේවාවෙහි කිසියම් රාජකාරියක් අත්හැර ගොස් තිබේද ?—
12. අයදුම්කරුගේ අවංක භාවය සම්බන්ධයෙන් පුද්ගලිකව කරුණු කීමට දන්නා පුද්ගලයන් තුන්දෙනෙකුගේ නම් සහ ලිපිනයන් :————.
    (1) ———— ————
    (2) ———— ————
    (3) ———— ————
13. මෙම පදවියට කෙනකු තෝරා ගැනීමේදී ඉවහල් විය හැකි වෙනත් විශේෂ සුදුසුකම් ඔබට ඇතොත් ඒවා සඳහන් කරන්න :————.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

9–989—69.9.26 දින අංක 14,873 දරන ගැසට් පත්‍රය

---

## ලංකා පිඟන් කර්මාන්ත සංයුක්ත මණ්ඩලය

### ඇබෑර්තු

ලංකා පිඟන් කර්මාන්ත සංයුක්ත මණ්ඩලයේ පහත සඳහන් තනතුර සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

සෑම අයදුම්කරුවකු විසින්ම පහත දැක්වෙන කරුණු සනාථ කළයුතුය:–

(අ) උත්පත්තියෙන් හෝ ලියාපදිංචි වීමෙන් ලාංකිකයකු වීම;
(ආ) මනා හැසිරීමකින් යුතු බව හා ශාරීරික වශයෙන් සුදුසු බව.

**පුහුණුවීමේ නඩත්තු ෆෝර්මන් :**

**සුදුසුකම්.**—ලංකා කාර්මික විද්‍යාලයේ කණිෂ්ඨ කාර්මික නිලධාරි සහතිකය හෝ රජයේ දෙපාර්තමේන්තුවක හෝ පිළිගත් වෙනත් ආයතනයක හෝ ආධුනිකයකු වශයෙන් පස් අවුරුදු කාලසීමාවක් සාර්ථක අන්දමින් අවසන් කිරීමෙන් පසු, වැඩපලක පළපුරුද්දක් හා යන්ත්‍රෝපකරණ සහ විදුලිබල උපකරණ නඩත්තු කිරීම ඇතුලුව යාන්ත්‍රික හා විදුලිබල ශිල්පය පිළිබඳව පස් අවුරුද්දක පළපුරුද්දක් සහිතව ජොෂ්ඨ පාඨශාලා සහතිකය හෝ උසස් විභාගයකින් සමත්වීම.

**වයස.**—අවුරුදු 25—40 අතර විය යුතුය.

**වැටුප්.**—පුහුණුවීමේ කාලය තුළදී මසකට රුපියල් 250 ක දීමනාවක් ගෙවනු ලැබේ. (පුහුණුවීමේ කාලය වර්ෂ එකකි.)

තෝරාගනු ලබන අයදුම්කරු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දනට පවතින්නාවූත්, මතුවට පණවනු ලැබිය හැකිවූත් නීතිරීති හා ව්‍යවස්ථා වලටත් එකඟව කටයුතු කිරීමේ කොන්දේසි පිළිගත යුතුය. පරීක්ෂණාත්මක නියමිත කාලසීමාවෙන් පසු, තනතුරෙහි ස්ථිර කිරීම බලපවත්වනුයේ අනෙක් කරුණුත් සමඟ රාජ්‍ය භාෂා අවශ්‍යතාවයනට දක්වූවහොත් පමණි.

සෑම අයදුම්කරුවකු විසින්ම පහත සඳහන් ලියවිලි අවශ්‍ය විටෙක ඉදිරිපත් කළයුතුය:—

(අ) උප්පැන්න සහතිකය ;
(ආ) සමත්වූ උසස්ම විභාග සහතිකය ;
(ඇ) වෘත්තීය සහ/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතිකය
(ඇ) චරිත සහතික දෙකක්.

රජයේ දෙපාර්තමේන්තු හෝ සංස්ථාවන්හි සේවය කරන්නාවූ නිලධාරීන් ගෙන් වූ අයදුම්පත්, එම අය තෝරාගනු ලැබී නම් සේවයෙන් මුදහැරිය හැකිවන බවට දක්වමින්, තම දෙපාර්තමේන්තු හෝ ආයතන ප්‍රධානීන් මගින් එවිය යුතුය.

ඉල්ලුම්පත් නියමිත ආකෘති පත්‍රයෙහි පළවිය යුතුවන අතර, ආදර්ශ අයදුම්පතක් මෙහි යට දක්වේ. අයදුම්පත් 1969 ඔක්තෝබර් මස 11 වන දින හෝ ඊට ප්‍රථම සාමාන්‍යාධිකාරී තුමා වෙත ලැබිය යුතුය.

පාලන කළමනාකරු,
ලංකා පිඟන් කර්මාන්ත සංයුක්ත මණ්ඩලය.

අංක 55, රොස්මීඩ් පෙදෙස,
තැ. පෙ. 1209,
කොළඹ 7.

### ආදර්ශ ඉල්ලුම් පත්‍රය

..............සඳහා වූ තනතුර

1. සම්පූර්ණ නම (අ) වාසගම————.
   (ආ) වෙනත් නම් :————.
2. තැපැල් ලිපිනය :————.
3. උපන් ස්ථානය හා දිනය :————.
4. ජාතිය :————.
5. ඉගෙනුම ලැබූ පාඨශාලා, විද්‍යාල හා විශ්ව විද්‍යාලය (ඇතුළත්වූ හා අස්වූ දිනයන් සහිතව :————.
6. වෘත්තීය හා ශාස්ත්‍රීය සුදුසුකම්, ගත් විෂයයන් හා සුදුසුකම් ලබාගත් දිනයන් සඳහන් කරන්න :————.
7. පාසැලින් අස්වූ දින සිට කරන ලද රැකියාවන් පිළිබඳ විස්තර (බැඳුණු දිනයන් හා අස්වූ දිනයන් සඳහන් කරන්න) :————.
8. ලබා ඇති පුහුණුවීම් පිළිබඳ විස්තර දින සහිතව සඳහන් කරන්න : ————.
9. ප්‍රායෝගික පළපුරුද්ද පිළිබඳ විස්තර, විශේෂයෙන් තමන්ගේ පළපුරුද්ද හා දැනීම පිළිබඳව විස්තර සඳහන් කරන්න :————.
10. ඔබ පිළිබඳ තොරතුරු ලබාගත හැකි තිදෙනකුගේ නම්, ලිපිනය හා තනතුරු සඳහන් කරන්න.
    (1) ————.
    (2) ————.
    (3) ————.
11. සහතිකපත්‍ර ලබාගත් අයගේ නම් සහ තනතුරු සඳහන් කරන්න. (සහතිකපත්‍ර ඉදිරිපත් කළයුත්තේ සම්මුඛ පරීක්ෂණයේදීය) ————.
12. වෙනත් කරුණු :————.

මෙම අයදුම් පතෙහි මවිසින් ප්‍රකාශ කරන ලද කරුණු නිවැරදි හා සත්‍ය බවට මෙයින් ප්‍රකාශ කරමි. මෙහි ඇති කරුණු වැරදි හෝ අසත්‍ය බව තෝරා ගන්නට පෙර අනාවරණය වූවහොත් මා නුසුදුස්සකු වෙනවා පමණක් නොව, පත්වීමෙන් පසුව අනාවරණය වූවහොත්, කිසිම වන්දියක් රහිතව සේවයෙන් පහකිරීමට සිදුවන බවද මම හොඳහැටි දනිමි.

(කිසිම පත්වීමකින් මා අස්කර නොමැති බවත්, උසාවියකින් වැරදි කරුවකු වී දඬුවම් ලබා නොමැති බවත් මෙයින් දන්වමි.)

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

9–889—69.9.26 දින අංක 14,873 දරන ගැසට් පත්‍රය

## ලංකා සංචාරක මණ්ඩලය

බෙන්තොට ජාතික නිවාඩු නිකේතනයෙහි නිකේතන බලධාරියා යටතේ පහත දක්වෙන තනතුරු සඳහා ලාංකික පුරවැසියන්ගෙන් අයදුම් පත් කැඳවනු ලැබේ.

### කාර්මික කාර්යය සහායක, ලඝු ලේඛක/ලිපිකරු

(අ) කාර්මික කාර්යය සහායක

**වැටුප් ක්‍රමය.**—සියළු දීමනා සහිතව මසකට රු. 250—15—20—500.

**වයස.**—1969.10.1 දිනට අවුරුදු 25–30 අතර විය යුතුය.

**සුදුසුකම්.**—පිළිගත් ආයතනයක කණිෂ්ඨ කාර්මික නිලධාරීන්ගේ සහතිකය හෝ කාර්මික විදුලිබල හෝ සිවිල් ඉංජිනේරු විද්‍යාව පිළිබඳ ඩිප්ලෝමා සහතිකය සහිතව රජයේ දෙපාර්තමේන්තුවක, රාජ්‍ය සංස්ථාවක හෝ පිළිගත් කාර්මික ආයතනයක, ආධුනිකයෙකු ලෙස හෝ වෙනයම් සමාන නිලයක අඩු වශයෙන් තුන් අවුරුදු පළපුරුද්දක්

හෝ,

වාර දෙකකට නොවැඩි ගණනකදී විෂයයන් හයකින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙල) විභාගය සමත්වීම සහ රජයේ දෙපාර්තමේන්තුවක, රාජ්‍ය සංස්ථාවක හෝ වෙන කිසියම් පිළිගත් කාර්මික ආයතනයක සිවිල් ගොඩනැගිලි ඕවර්සියර් වරයෙකු ලෙස අඩුගණනේ අවුරුදු පහක පළපුරුද්දක්,

(කාර්මික විදුලිබල, වැඩ සහ භූ දර්ශන සැකසීම පිළිබඳව පළපුරුදු ලබා ඇති අයට විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ. සුදුසුකම් සහ පළපුරුද්ද අනුව තෝරා ගනු ලබන අපේක්ෂකයා මෙම වැටුප් ක්‍රමයේ සුදුසු මට්ටමක තැබිය හැක.)

(ආ) ලඝු ලේඛක/ලිපිකරු

**වැටුප් ක්‍රමය.**—සියළු දීමනා ඇතිව මසකට රු. 230—10—480.

**වයස.**—1969.10.1 දිනට අවුරුදු 35 ට අඩු විය යුතුය.

**සුදුසුකම්.**—විෂයයන් තුනකින් සම්මාන ඇතිව (මින් දෙකක් සිංහල සහ අංක ගණිතය විය යුතුය) වාර දෙකකට නොවැඩි ගණනකදී, අධ්‍යාපන පොදු සහතික පත්‍ර(සාමාන්‍ය පෙල) පරීක්ෂණයේ විෂයයන් හයකින්, සමත්වීම.

සහ,

ඉංග්‍රීසි ලඝු ලේඛනය සහ යතුරු ලියනය පිළිබඳ ප්‍රවීනතාවය. (සිංහල ලඝු ලේඛනය, යතුරු ලියනය සහ ඉංග්‍රීසි භාෂාවෙන් සම්මානයක්ද ලබා ඇති අපේක්ෂකයිනට විශේෂ සැළකිල්ලක් දක්වනු ලැබේ.)

සාමාන්‍ය

කාර්මික කාර්යය සහායක සහ ලඝු ලේඛක/ලිපිකරු තනතුරු තුන් අවුරුදු ආධුනික කාල සීමාවකට යටත් වේ.

තෝරාගනු ලබන අපේක්ෂකයින් :—

(1) බෙන්තොට ජාතික නිවාඩු නිකේතනයෙහි සේවය කළ යුතුය. කෙසේ වෙතත්, ඔවුන් ලංකාවේ ඕනෑම පළාතකට මාරු කළ හැක.

(2) 1966 අංක 33 දරණ රාජ්‍ය භාෂා පණතෙහි නියමයන්ට අනුකූල විය යුතුය.

(3) සේවක අර්ථ සාධක අරමුදලට දායකයකු විය යුතුය.

සුදුසුකම් වයස යනාදී සියළුම තොරතුරු දක්වෙන අයදුම් පත් කොළඹ 3, ගාලු මුවදොර මැද පාරෙහි, අංක 25 දරණ ලංකා සංචාරක මණ්ඩලයේ සභාපති වෙත 1969, ඔක්තෝබර් 14 වැනි දින හෝ ඊට පෙර ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. කුමන විධියේ හෝ අයුතු බලපෑමක් කළහොත් අපේක්ෂකයා නුසුදුස්සකු වීමට හේතු වේ.

සභාපති,
ලංකා සංචාරක මණ්ඩලය.

25, ගාලු මුවදොර මැද පාර,
කොළඹ 3,
1969 සැප්තැම්බර් 20.

9–993—69.9.26 දින අංක 14,873 දරන ගැසට් පත්‍රය

---

## සුරාබදු දෙපාර්තමේන්තුව

### III වන පන්තියේ ලේගරකරු තනතුරු

සුරාබදු දෙපාර්තමේන්තුවේ IiI වන පන්තියේ ලේගරකරු තනතුරු සඳහා මෙයින් අයදුම්පත් කැඳවනු ලැබේ. මේ සඳහා වන අයදුම්පත් පහත දක්වෙන ආදර්ශ ආකෘතිය අනුව පිළියෙළ කොට, 1969 ඔක්තෝබර් මස 15 වැනි දිනට හෝ ඊට පෙර සුරාබදු කොමසාරිස්, සුරාබදු කොමසාරිස් කාර්යාලය, ටොරින්ටන් චතුරශ්‍රය, කොළඹ 7 යන ලිපිනයට ලැබෙනසේ ලියාපදිංචි කළ තැපැලෙන් එවිය යුතුය.

2. **වැටුප් පරිමාණය.**—(අ) කොළඹ හෝ ඉංජිනේරු හා කර්මාන්ත ශාලීය ආයතනයක් හැටියට පිළිගනු ලැබූ ආයතනවල සේවය කරන්නවුන් සඳහා—පළමු හයමස තුලදී දිනකට රු. 1.80, ඉන් පසුව වර්ෂයකට රු. $540 \times 30 \times 8$ හා $24 \times 1 =$ රු. 804.

(ආ) පිටපළාත්වල හා ඉංජිනේරු හා කර්මාන්තශාලීය ආයතනයක් හැටියට පිළිනොගත් ආයතනවල සේවය කරන්නවුන් සඳහා—පළමු හයමස තුලදී දිනකට රු. 1.60, ඉන් පසු වර්ෂයකට රු. $504 \times 30 \times 8 =$ රු. 744.

3. **වයස් සීමාව.**—1969 ඔක්තෝබර් මස 15 වන දිනට වයස අවු. 20 ට අඩු නොවියයුතු අතර, 30 ට වැඩි නොවිය යුතුය. (දැනටමත් රජයේ සේවයේ යෙදී සිටින්නන්ට මේ උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.)

4. **අධ්‍යාපනික හා වෙනත් සුදුසුකම්.**—(අ) (i) අයදුම්කරුවන් 6 වන ප්‍රමාණයෙන් සමත් ව සිටිය යුතුය.

(ii) 1/16'' පරිමාණයට කියවීමට හැකියාව තිබිය යුතුය.
(iii) පීප්ප සෑදීම සම්බන්ධව සාමාන්‍ය දැනුමක් තිබිය යුතුය.
(iv) පීප්ප සෑදීම සම්බන්ධව පාවිච්චි කරන ලී සම්බන්ධව දැනුමක් සහ වඩුවැඩ සම්බන්ධව දැනුමක් තිබිය යුතුය.
(v) යකඩ පටි නැමීමට සහ රිවෙට් කිරීමට මනා දැනුමක් තිබිය යුතුය.

(ආ) ඉහත (අ) ඡෙදයේ සඳහන් I සිට V දක්වා වූ සුදුසුකම් වලට අතිරේකව අයදුම්කරුවන්ට පහත සඳහන් සේවා සුදුසුකම් වලින් එකක් තිබිය යුතුය :—

(i) කම්කරු ශ්‍රෙණියේ IV හා/හෝ V වන පන්තියේ තනතුරක අඩු ගණනේ අවුරුදු 3 ක සේවයක් තිබීම; නැතහොත්

(ii) කම්කරු ශ්‍රෙණියේ IV හෝ V පන්තියේ තනතුරක් දරන අතර ඊට පෙර පිළිගත් ආයතනයක III පංතියේ ලේගරකරු තනතුරක අඩුම වශයෙන් අවුරුදු 3 ක සේවයක් තිබීම (සහතික පත් මගින් සනාථ කළයුතුය.); නැතහොත්

(iii) පිළිගත් බාහිර ආයතනයක III වන පන්තියේ ලේගරකරුවෙකු වශයෙන් අවුරුදු 3 ක පළපුරුද්දක් තිබිය යුතුය. (සහතිකපත් මගින් සනාථ කළයුතුය.)

(ඇ) මනා චරිතයකින් යුක්ත වියයුතුය. (වගකිවයුතු පුද්ගලයින් අත්සන් කළ චරිත සහතික ඉදිරිපත් කළ යුතුය.)

5. **සේවයේ යෙදවීමේ වගන්ති.**—තනතුර ස්ථිරය. පත්කරනු ලබන්නාගේ විශ්‍රාම වැටුප් හිමි තත්ත්වය 64.2.7 දින අංක 633 දරණ භාණ්ඩාගාර චක්‍රලේඛයෙහි විධිවිධානයන්ට යටත්වනු ඇත. මාසික වැටුප් ක්‍රමයෙහි තැබීමෙන් පසු විශ්‍රාම වැටුප් හිමි තත්ත්වය ලැබෙන තුරු රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය.

6. පහත සඳහන් ලියවිලිවල පිටපත් (මුල් පිටපත් නොවේ) අයදුම්පතට ඇමිණිය යුතුය :—

(අ) උප්පැන්න සහතිකය. (සැ. යු.—බවුතීස්ම සහතිකය හෝ උපකාපාඨශාලා සඳහා වන නියෝග සංග්‍රහයෙහි කාර්යයන් සඳහා නිකුත් කරන ලද උප්පැන්න සහතිකය හෝ භාර ගනු නොලැබේ.)
(ආ) චරිත සහතික දෙකක්.
(ඇ) දැන්වීමෙහි 4 (ආ) ඡෙදයේ සඳහන් සේවා සහතිකය.
(ඈ) කලින් පලපුරුද්ද පිළිබඳ සහතික.

7. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) ඡෙදය ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවාවේ තනතුරුවලට කෙරෙන පත්කිරීම පිළිබඳ පොදු කොන්දේසි කෙරෙහි අවධානය යොමු කරවනු ලැබේ.

8. අයදුම්පත් කිසියම් පුද්ගලික නිලධාරියෙකු නමට නොඑවිය යුතුය.

කේ. ඒ. ඩී. චන්ද්‍රසේකර,
සුරාබදු කොමසාරිස් වෙනුවට.

සුරාබදු කොමසාරිස් කාර්යාලය,
ටොරින්ටන් චතුරශ්‍රය,
කොළඹ 7.

### අයදුම් පතෙහි ආකෘතිය

#### III පංතියේ ලේගරකරු තනතුරු

1. සම්පූර්ණ නම :————.
2. පුද්ගලික ලිපිනය :————.
3. (i) අයදුම්කරුගේ උපන් දිනය :————.
   (ii) 1969 ඔක්තෝබර් මස 15 දිනට වයස :—
   අවු. :————, මාස :————, දින :————.

4. ලබා ඇති උසස්ම අධ්‍යාපනික සුදුසුකම් :————.

5. දන්වීමෙහි 4 (අ) ඡෙදයෙහි සඳහන් වෙනත් සුදුසුකම් ගැන පළපුරුද්ද : ————.

6. දන්වීමෙහි 4 (ආ) ඡෙදය පිළිබඳ විස්තර (දෙපාර්තමේන්තු සේවය හා පුද්ගලික ආයතනයක සේවය වෙන් වශයෙන් සඳහන් කරන්න.) :—

| දෙපාර්තමේන්තුවේ ආයතනයේ නම | ශ්‍රෙණිය/පංතිය | බැඳුනු දිනය | සේවා කාලය |
|---|---|---|---|
| | | | |

7. චරිත සහතික ලබාගත් අයගේ නම සහ තනතුර :—
(1) ————.
(2) ————.

8. විශේෂ හිමිකම් ඇතොත් ඒවා පිළිබඳ විස්තර (උද.—මෙවැනි තනතුරක ලත් පලපුරුද්ද) :————.

ම විසින් මෙම අයදුම්පතෙහි සඳහන් කරන ලද විස්තර සත්‍ය හා නිවැරදි බව මෙයින් සහතික කරමි. මෙම අයදුම්පතෙහි කිසියම් අසත්‍ය හෝ වැරදි ප්‍රකාශයක් තිබෙන බව තෝරා ගැනීමට කලින් අනාවරණය වුවොත්, මා එයින්ම නුසුදුසු වන බවත් තෝරා ගැනීමෙන් පසු ඒ ගැන දනගන්නට ලැබුනහොත් වන්දියක් නොගෙවා මා රාජකාරියෙන් පහකර දැම්මට යටත් වන බවත් මෙයින් දන සිටිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

9–850—69.9.26 දින අංක 14,873 දරන ගැසට් පත්‍රය

---

## ගංගා නිම්න සංවර්ධන මණ්ඩලය

### පුරප්පාඩු

ගංගා නිම්න සංවර්ධන මණ්ඩලයේ පහත දක්වෙන තනතුරු සඳහා 1969.10.12 වෙනි දින දක්වා ලාංකිකයන්ගෙන් ඉල්ලුම් පත් කැඳවනු ලැබේ.

1. **ඉංජිනේරුවරු.**—සිවිල් හා යාන්ත්‍රික අවම සුදුසුකම් වශයෙන් ඉල්ලුම්කරුවන් වෙත පිළිගත් විශ්ව විද්‍යාලයක ඉංජිනේරු විද්‍යාව පිළිබඳ උපාධියක් තිබිය යුතුයි. තෝරාගත් අය මණ්ඩලයේ v වෙනි ශ්‍රෙණියේ වාර්ෂික වැටුප් පරිමාණය වූ රු. 5,760—240—7,200 මත තබනු ඇත. මේ වැටුපට අමතරව මණ්ඩලයේ ප්‍රමාණ අනුව දීමනා ගෙවනු ලැබේ. මීට අමතරව උසස් සුදුසුකම් හා/හෝ පළපුරුද්ද ඇති අය සාකච්ඡා කර තීරණය කිරීමට යටත්ව ඉහළ ශ්‍රෙණියක තැබීම ගැන සලකා බලනු ඇත.

අවුරුදු 3 ක අවම කාලසීමාවකට කොන්ත්‍රාත්තු පත්වීම්වලට ද සලකා බැලීමට පුළුවන.

2. **පිරිවැය ගණකාධිකාරී.**—ඉල්ලුම්කරුවන් පිරිවැය හා කර්මාන්ත ගණකාධිකාරී සම්පූර්ණ විභාගය (i වන කොටසේ සිට v වන කොටස දක්වා) සමත්ව සිටිය යුතු අතර පිරිවැය හා කර්මාන්ත ගණකාධිකාරීවරයෙකු වශයෙන් අවුරුදු 5 ක අවම පළපුරුද්දක් ද තිබිය යුතුයි. මෙම තනතුරට අයත් වාර්ෂික වැටුප් පරිමාණය රු. 13,200—450 ඒවා 4 හා 600 ඒවා 6—18,600 ක් වේ. මීට අමතරව මණ්ඩලයේ ගෙවීම් ප්‍රමාණ අනුව දීමනා ගෙවනු ලැබේ.

3. **සහකාර නීති නිලධාරී.**—ඉල්ලුම්කරුවන් ශ්‍රේෂ්ඨාධිකරණයේ පෙරකදෝරුවන් විය යුතු අතර පෙරකදෝරුවෙකු වශයෙන් බඳවා ගැනීමෙන් පසු අවුරුදු 5 කට නොඅඩු පළපුරුද්දක් ඔවුන් තුළ තිබිය යුතුයි. කම්කරු විනිශ්චය සභා කටයුතු පිළිබඳව තිබෙන පළපුරුද්ද වැඩිපුර සුදුසුකමක් සේ සලකනු ලැබේ. අවුරුද්දකට රු. 8,400—300—12,000 යන වැටුප් සහ මණ්ඩලයේ ගෙවීම් ප්‍රමාණයන් අනුව ගෙවන දීමනා මෙම තනතුරට හිමි වේ.

4. **කෘෂිකර්ම නිලධාරී.—**(සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම). අයදුම් කරුවන් හට පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලැබූ උපාධියක් හා කෘෂිකර්මය පිළිබඳව යටත් පිරිසෙයින් අවුරුදු 5 ක ක්ෂෙත්‍ර පළපුරුද්දක් ද තිබිය යුතුයි. අමතර සුදුසුකම් ඇති හා/හෝ පළපුරුදුකම් තිබේ නම් වැටුප පරිමාවේ එක්තරා පියවරකට පත්කරනු ලැබේ. අවුරුද්දකට රු. 8,400—300—12,000 සහ මණ්ඩලයේ ප්‍රමාණයන් අනුව ගෙවන දීමනා මෙම තනතුරට හිමි වේ.

5. **කාර්මික සහායකයින්.**—අධ්‍යාපන අමාත්‍යාංශයට අයත් ජ්‍යෙෂ්ඨ කාර්මික ආයතනයක කණිෂ්ඨ කාර්මික නිලධාරී සහතිකය අයදුම්කරුවන් හට තිබිය යුතුයි. මණ්ඩලයේ ප්‍රමාණයන් අනුව ගෙවන දීමනා ද සහිතව අවුරුද්දකට රු. 2,040—120—3,480 දරණ මණ්ඩලයේ වැටුප් පරිමාවට අයත් 7 වන ශ්‍රෙණියට මූලික පත්වීම කරනු ලැබේ. අමතර සුදුසුකම් හා/හෝ පළපුරුදුකම් ඇති අය යථෝක්ත වැටුප් පරිමාවේ එක්තරා පියවරකට පත්කිරීම ගැන සලකා බලනු ලැබේ.

6. **ලඝු ලේඛකයෝ (ඉංග්‍රීසි).**—ඉල්ලුම්කරුවන් ඉංග්‍රීසි විෂයයත් වශයෙන් ඇතිව අ.පො.ස. විභාගය හෝ ඊට සමාන විභාගයක් සමත්ව සිටිය යුතුය. ඉංග්‍රීසි ලඝුලේඛනයෙන් විනාඩියකට වචන 80 ක අවම වේගයක් ද ඉංග්‍රීසි ටයිප් ගැසීමෙන් විනාඩියකට වචන 35 ක වේගයක්ද ඔවුන් තුළ තිබිය යුතුයි.

මෙම තනතුරට හිමි වාර්ෂික වැටුප් පරිමාණය රු. 2,400—120—3,480 **ක්** වේ. ඊට අමතරව මණ්ඩලයේ ප්‍රමාණ අනුව දීමනා ගෙවනු ලැබේ.

යථෝක්ත වැටුප් වලට අමතරව රජයේ ගෙවීම් ප්‍රමාණයන් අනුව ගෙවන තාවකාලික ජීවන වියදම් දීමනා ද ගෙවල් කුලී වශයෙන් විවාහකයෙකු වෙනුවෙන් මූලික වැටුපෙන් 15% ක් ද, අවිවාහකයෙකු වෙනුවෙන් මූලික වැටුපෙන් 7½% ක්ද වන පරිදි මසකට රු. 130 ක උපරිමය දක්වා ගෙවනු ලැබේ.

තෝරාගනු ලැබූ අයදුම්කරුවෝ මණ්ඩලයේ අර්ථසාධක අරමුදලේ සාමාජිකයින් වන්නාහ. මේ සඳහා සේවකයින් සිය මූලික වැටුපෙන් 7½% ක් දායක විය යුතු අතර මණ්ඩලය මගින් 10% ක් දායකවනු ලැබේ.

තෝරාගනු ලැබූ අයදුම්කරුවෝ රජයේ රාජ්‍යභාෂා ප්‍රතිපත්තිය අනුව සිංහල භාෂාවෙන් සුදුසුකම් ලැබිය යුත්තාහ. තවද මණ්ඩලයේ සේවය යටතේ දිවයිනේ ඕනෑම පලාතක සේවය කිරීම ඔවුන්ගෙන් අපේක්ෂා කෙරේ.

රාජ්‍ය සේවයේ සහ සංස්ථා සේවයේ නියුතු වූවන්ගෙන් අයදුම් පත් නියමිත ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතු අතර, අදල නිලධාරියා තෝරාගනු ලැබුව හොත් ඔහු නිදහස් කර හැරීම පිණිස සිය එකහත්වයද දක්විය යුතුයි.

එක් එක් වර්ගයේ තනතුරු සඳහා වෙන වෙනම අයදුම්පත් ලේඛනගත තැපෑලෙන් එවිය යුතුයි. තවද තමන් විසින් අයදුම් කරන ලද තනතුර ලියුම්කවරයේ වම්පස් මුදුන් කෙලවරෙහි පැහැදිලි අකුරෙන් දක්විය යුතුයි.

අයදුම්පත් සහ වැඩිමනත් විස්තර කොළඹ 7, බෞද්ධාලෝක මාවතේ පිහිටි ගංගා නිම්න සංවර්ධන භූමිමණ්ඩලයේ ප්‍රධාන ලේකම්ගෙන් ලබාගත හැක.

ආර්. වී. ජයසූරිය,
ප්‍රධාන ලේකම්,
ගංගා නිම්න භූමි සංවර්ධන මණ්ඩලය.

854—69.9.26 දින අංක 14,873 දරන ගැසට් පත්‍රය

## මඩකලපුව දිස්ත්‍රික්කයේ කිරාන් කොට්ඨාශයේ උප්පැන්න හා මරණ සහ එරාවූර් කෝරල පත්තු කොට්ඨාශයේ විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය

කිරාන් උප්පැන්න හා මරණ ලියා පදිංචි කිරීමේ කොට්ඨාශය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හෝ එහි කාලයක් පදිංචිව සිටීම හේතු කොට ගෙන ගම්වාසීන්ගෙන් සැළකුම් ලබන, ඉල්ලුම් පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු විසි එකට නොඅඩු ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයෙන්ම ඉහත සඳහන් ධුරය සඳහා ඉල්ලුම් පත් කැඳවනු ලැබේ. රජයේ සේවයෙහි නියුතු අයදුම් කරුවන් සඳහා මෙම සීමාව අදාල නොවේ.

2. මෙම ධුරය සඳහා ඉදිරිපත් වන අයට තිබිය යුතු අධ්‍යාපනික හා අනිකුත් සුදුසුකම් ආදිය පිළිබඳ සියළු විස්තර මෙම කාර්යාලයේ සහ ප්‍රාදේශීය ආදායම් නිලධාරී කාර්යාල, ග්‍රාම සේවක කාර්යාල, පළාත් පාලන ආයතන කාර්යාල, ග්‍රාමීය උසාවි, තැපැල් කාර්යාල, පොලිස් ස්ථාන, ප්‍රජා මණ්ඩල, ප්‍රසිද්ධ වෙළඳ පොලවල් සහ සමුපකාර සමිති ආදී කොට්ඨාශයේ ප්‍රසිද්ධ ස්ථාන සහ කාර්යාලවල ප්‍රදර්ශනය කර ඇති දන්වීම්වල ඇතුළත් වේ.

3. සියළුම ඉල්ලුම් පත් මෙම කාර්යාලයෙන් ලබා ගත හැකි ආකෘති පත්‍රවල සකස් විය යුතු අතර, ඒවා 1969 ඔක්තෝබර් 17 දින හෝ එදිනට ප්‍රථම මා වෙත ලැබෙන සේ ලියා පදිංචි තැපැලෙන් එවිය යුතුය.

ඩී. තේසයියා,
දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්.

1969 සැප්තැම්බර් මස 9 වෙනි දින,
මඩකළපුව,
දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ දී ය.

සත්‍ය පිටපතකි.
දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්.

9–914—69.9.26 දින අංක 14,873 දරන ගැසට් පත්‍රය

---

## මැනුම් දෙපාර්තමේන්තුව

### ගබඩා භාරකරු තනතුර

ගබඩා භාරකරු තනතුරක් සඳහා ඉල්ලුම්පත් මෙයින් කැඳවනු ලැබේ. මීට යා කොට ඇති ආදර්ශ ආකෘති පත්‍රයට අනුව සකස් කළ ඉල්ලුම් පත් ඉල්ලුම්කරුගේ අත් අකුරින්ම පුරවා 69.10.12 දිනට හෝ ඊට පෙර ලැබෙන පරිදි ලියාපදිංචි කළ තැපැලෙන් එවිය යුතුය.

2. ඉල්ලුම්පත් ලැබුණු බව දන්වන අතර, ඉල්ලුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයකට කැඳවනු ලැබේ.

3. සහතිකපත් වල පිටපත් පමණක් ඉල්ලුම්පත්වලට අමුණා එවිය යුතුය. මුල් පිටපත් ඉල්ලුම්කරුවන් විසින් සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතුය.

4. මෙම තනතුරට හිමි වාර්ෂික වැටුප් ක්‍රමය රු. 888—72 × 17—රු. 2,112 වේ. වාර්ෂක වැටුප රු. 1,608ට පෙර කාර්යක්ෂමතා කඩඉමක් ඇත.

5. **වයස් සීමාව.**—ඉල්ලුම්කරුවන් වයස අවුරුදු 20ට අඩු නොවිය යුතු අතර අවුරුදු 35ට වැඩි නොවිය යුතුය. (මෙම වයස් සීමාවන් දැනට රජයේ සේවයේ සිටින අයට බලපාන්නේ නැත.)

6. **අධ්‍යාපනික සහ අනෙකුත් සුදුසුකම්.**—අයදුම් කරුවන්ට පහත සඳහන් සුදුසුකම් තිබිය යුතුය.

(i) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය) විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් අංක ගණිතය හෝ ගණිතය ඇතුළත්ව විෂයයන් හයකින් සමත්වී තිබිය යුතුය. එම විෂයයන් විභාග දෙකකට නොවැඩි ගණනකින් සමත් වී තිබිය යුතුයි.

(ii) පිළිගත් ආයතනයක බඩු ගබඩා කිරීම සම්බන්ධයෙන් යටත් පිරිසෙයින් අවුරුදු 3ක පුහුණුවක් ලබා තිබිය යුතුය. සුචිපත්‍ර ක්‍රමය, බඩු තොග පවත්වාගෙන යාම සහ පාලනය කිරීම සහ බඩු නිකුත් කිරීම සම්බන්ධයෙන් දැනීමක් තිබේ නම් එය අමතර සුදුසුකමක් වේ.

7. **බඳවා ගැනීමේ ක්‍රමය.**—මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතුය.

8. **සේවා කොන්දේසි.**—(i) මෙම පත්වීම අවුරුදු 3ක ආධුනික කාලයකට යටත් වේ. තෝරා ගනු ලබන අයදුම්කරුවා ලංකාවේ කවර ස්ථානයක වුවද සේවය කළයුතු අතර මුදලින් රු. 1,000 ක ඇපයක් සහ රු. 4,000 ක සහතික ඔප්පුවක්ද තැබිය යුතුය.

(ii) තෝරා ගනු ලැබූ අයදුම්කරු විසින් රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහාද විශේෂයෙන්ම 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනතේ විධි විධාන ක්‍රියාවේ යෙදීම සඳහා මෙතෙක් පනවා ඇති ව්‍යවස්ථා හෝ මින් ඉදිරියට පනවනු ලබන ව්‍යවස්ථා වලට සහ අංක 765 (අංක 543ඊ/302ඩී) සහ 1969.6.9 දින දරණ භාණ්ඩාගාර චක්‍ර ලේඛයේ 2(බී) වගන්තියේ දැක්වෙන කොන්දේසි ද අනුගමනය කළ යුතුයි.

(iii) රාජ්‍ය සේවා කොමිෂන් සභා නියෝග, මුදල් රෙගුලාසි, කාර්ය සංවිධාන සංග්‍රහයේ ව්‍යවස්ථා, දෙපාර්තමේන්තු නියෝග යන මේවාට සහ රජයෙන්ද, මෙම දෙපාර්තමේන්තුවෙන්ද කලින් කල නිකුත් කරනු ලබන සෙසු විධාන වලට හෝ රෙගුලාසිවලට යටත් විය යුතුවේ.

9. මෙම ගැසට් පත්‍රයේ (II) වැනි ඡෙදයේ I වැනි කොටසේ ආරම්භයෙහි ප්‍රකාශයට පමුණුවන ලද රජයේ සේවයේ තනතුරු සඳහා පත්වීම් වලට අදල සාමාන්‍ය කොන්දේසි වලටද ඔබේ අවධානය යොමු කරවනු ලැබේ.

සී. වී. ගුණවර්ධන,
සර්වේ ජනරාල්.

1969 සැප්තැම්බර් මස 26 වෙනි දින,
කොළඹ 5, තැ.පෙ. 506,
සර්වේ ජනරාල් කාර්යාලයේ,
ප්‍රගති අංශයේ දීය.

### යොමුකර ඇති ඉල්ලුම්පත

(මෙය ඉල්ලුම්කරුගේම අත් අකුරින් පිරවිය යුතුය)

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරින්) :————.

2. ලියුම් ලැබෙන පිළිවෙල :————.

3. (අ) උපන් දිනය :————.
(උප්පැන්න සහතිකයේ පිටපතක් අමුණා එවිය යුතුය)
(ආ) 1969 සැප්තැම්බර් මස 30 දිනට වයස :
අවු :————. මාස :————.

4. ජාතිය :————.
ඔබ ලාංකික පුරවැසියෙක්ද යන වග :
(i) පෙලපතින් :————.
(ii) ලියා පදිංචි කිරීමෙන් :————.

5. අධ්‍යාපනික සුදුසුකම් :————.
(සමත් වූ උසස්ම විභාගය සඳහන් කරන්න)

6. පළපුරුද්ද සම්බන්ධ විස්තර
(සහතික වල පිටපත් අමුණා එවිය යුතුය)

7. මීට කලින් රජයේ දෙපාර්තමේන්තුවක සේවය කර තිබේ නම්,
(i) ඇතුළත් වූ දිනය සහ අස්වූ දිනය :————.
(ii) තනතුර :————.
(iii) අස්වීමට හේතුව :————.

8. කවර කලෙක හෝ ඔබ උසාවියකින් අපරාධකරුවෙකු ලෙස ඔප්පුකර තිබේද එසේ නම් ඒ සම්බන්ධව විස්තර සඳහන් කරන්න :————.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

9–983—69.9.26 දින අංක 14,873 දරන ගැසට් පත්‍රය

---

## විශ්ව විද්‍යාලයීය සාමාන්‍ය ශාස්ත්‍රවේදී/විද්‍යාවේදී/ශාස්ත්‍රපති (අධ්‍යාපන) උපාධිය සඳහාද, ලංකා තාක්ෂණ විද්‍යාලයේ වාණිජ ඩිප්ලෝමා සහතිකය සඳහාද ගුරුවරුන්ට අධ්‍යයන නිවාඩු—1969

ඉහත සඳහන් කාරණය ගැන 1969.9.12 දින අංක 14,871 දරණ ලංකාණ්ඩු වේ ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වැනි ඡේදයේ පළකරන ලද 1969.9.4 දින දරණ නිවේදනය කෙරෙහි සැලකිල්ල යොමු කරනු ලැබේ.

අයදුම්පත් භාරගන්නා අවසාන දිනය 1969 සැප්තැම්බර් මස 30 දින දක්වා දීර්ඝ කරන ලද බව මෙයින් දන්වමි.

අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

9–1003—69.9.26 දින අංක 14,873 දරන ගැසට් පත්‍රය

## ලංකා ගුවන් විදුලි සංස්ථාව

### පුරප්පාඩු

ලංකා ගුවන් විදුලි සංස්ථාවේ මහජන සම්බන්ධතා හා සුභ සාධක නිලධාරි තනතුර සඳහා ලාංකිකයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**සුදුසුකම්.**—(අ) ප්‍රවෘත්ති කටයුතු හෝ මහජන සම්බන්ධතා කටයුතු පිළිබඳව යටත් පිරිසෙයින් අවුරුදු තුනක පළපුරුද්ද සහිතව පිළිගත් විශ්ව විද්‍යාල යක උපාධියක් හෝ ඩිප්ලෝමාවක් ;

හෝ

ප්‍රවෘත්ති පත්‍ර ආයතනයක හෝ මහජන සම්බන්ධතා කටයුතු පිළිබඳ අවුරුදු 10 කට නොඅඩු පළපුරුද්ද සහිතව, ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගය.

(ආ) සිංහල හා ඉංග්‍රීසි භාෂාවන් පිළිබඳ මනා දැනුමක් අවශ්‍යයි.

**වයස.**—අවුරුදු 30–45 දක්වා.

**වැටුප් ක්‍රමය.**—සියළුම දීමනා ඇතුළත් රු. 625—900 (25 × 5—30 × 5).

මෙම දැන්වීම අග ඇති ආකෘතිය අනුව සැපයිය යුතු අයදුම්පත් 1969 ඔක්තෝම්බර් 7 වැනි දිනට පෙර ලැබෙන සේ ලියා පදිංචි කළ තැපෑලෙන් කොළඹ 7, ලංකා ගුවන් විදුලි සංස්ථාවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත එවිය යුතුයි. ලිපි කවරයේ ඉහළ වම් කෙළවර " මහජන සම්බන්ධතා හා සුභ සාධක නිලධාරි " යන්න පැහැදිලිව ලිවිය යුතුයි.

නෙවිල් ජයවීර,
අධ්‍යක්ෂ ජනරාල්.

1969 සැප්තැම්බර් මස 14 වැනි දින,
කොළඹ 7.

### නිදර්ශන අයදුම්පත

**මහජන සම්බන්ධතා හා සුභ සාධක නිලධාරි තනතුර සඳහාවූ අයදුම්පතයි**

1. සම්පූර්ණ නම :————.
   (I) මුල් අකුරු සහිත නම, (මහත්මයාද, මහත්මියද. මෙනවියද යනවග සඳහන් කරන්න) :————.
   (II) ලිපිනය :————.

2. උපන් දිනය හා ස්ථානය :————.
   (I) 1969 ඔක්තෝම්බර් මස 7 වැනි දිනට වයස අවු :————, මාස :————, දින :————.
   (උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුයි.)

3. ජාතිය :————.

4. අධ්‍යාපන හා පුහුණුවීම් :

| ඉගෙනීම ලැබූ පැසැල් හා ආයතන | දින | | සමත් වී ඇති විභාගය | දැරූ වගකිවයුතු තත්ව හා යෙදුණු වැදගත් පරිබාහිර කටයුතු |
|---|---|---|---|---|
| | සිට | දක්වා | | |
| | | | | |

5. සමත්වී ඇති උසස්ම විභාගය :————.
   (I) සිංහල :————.
   (II) දෙමළ :————.
   (III) ඉංග්‍රීසි :————.
   (සහතික පිටපතක් ඇමිණිය යුතුයි.)

6. පළපුරුද්ද :

(ඔබගේ අතීත පළපුරුදුකම් හා රැකියා පිළිබඳ වාර්තා කාල ක්‍රමානුගතව යොදන්න).

| ආයතනයේ නම | උසුලන ලද තනතුර | දින | | අස්වීමට හේතු |
|---|---|---|---|---|
| | | සිට | දක්වා | |
| | | | | |

7. ඔබගේ පෞද්ගලික ජීවිතය ගැන හොඳින් දන්නා නෑයන් නොවන තිදෙනකුගේ නම්, ලිපින හා තත්වය :
   (I) :————.
   (II) :————.
   (III) :————.

8. චරිත සහතික ලබාගෙන ඇති අයගේ නම් සහ තනතුරු :
   (I) :————.
   (II) :————.
   (III) :————.

9. වෙනත් විස්තර :————.

10. මෙම අයදුම්පතෙහි මවිසින් ඇතුළත් කොට ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි ඒවා බව මම සහතික කරමි. තෝරා ගැනීමේදී හෝ තෝරා ගැනීමඹ පෙර මෙහි ඇතුළත් තොරතුරු අසත්‍ය හා වැරදි ඒවා බව හෙළිවුවහොත්, මා යථෝක්ත තනතුර සඳහා නුසුදුස්සකු වන බවත් පත්වීම ලද පසු වරදක් හෙළි වුවහොත් කිසිම වන්දියක් නැතිව සේවයෙන් පහකරනු ලැබීමට යටත්වන බවත් මම දනිමි.

දිනය :————.

————,
අයදුම්කරුගේ අත්සන.

9–952—69.9.26 දින අංක 14,873 දරන ගැසට් පත්‍රය

## ලංකා ගමනාගමන මණ්ඩලීය පුරප්පාඩු

මණ්ඩලීය සංවිධානයේ යාන්ත්‍රික හා සිවිල් ඉංජිනේරු කොට්ඨාශයන්හි පහත සඳහන් තනතුරු සඳහා අයදුම්පත් එවන මෙන් ලාංකික පුරවැසියන්ට මෙයින් ආරාධනය කරනු ලැබේ.

(අ) උපාධිධාරී ප්‍රවාසක ඉංජිනේරු තනතුරු

(ආ) ප්‍රවාසක ඉංජිනේරු ආධුනික තනතුරු

2. **සුදුසුකම්.**—(අ) **උපාධිධාරී ප්‍රවාසක ඉංජිනේරු තනතුරු**—

(i) **වයස.**—1969.9.1 වෙනි දිනට අවු. 21ටත් 35 ටත් අතර විය යුතුයි.

(ii) පිළිගත් විශ්ව විද්‍යාලයක බී.ඇස්සී. උපාධිය (යාන්ත්‍රික/සිවිල් ඉංජිනේරු)

පසුගිය වර පවත්වන ලද බී.ඇස්සී. ඉංජිනේරු විභාගයේ ප්‍රතිඵල බලාපොරොත්තුවෙන් සිටින අයටද ඉල්ලුම් කළ හැක.

(ආ) **ප්‍රවාසක ඉංජිනේරු ආධුනික තනතුරු**—

(i) **වයස.**—1969.9.1 වෙනි දිනට අවු. 20 ටත් 30 ටත් අතර විය යුතුයි.

(ii) ලංකා කාර්මික විද්‍යාලයේ හෝ ඊට සමාන ආයතනයක කණිෂ්ඨ කාර්මික නිලධාරීන්ගේ සහතිකය (යාන්ත්‍රික/සිවිල් ඉංජිනේරු).

3. පහත දක්වා ඇති පෝර්මය අනුව පිලියෙල කරන ලද ඉල්ලුම් පත්, කොළඹ 5, නාරාහේන්පිට, කිරුළ පාරේ, 200 වෙනි ස්ථානයේ සිටින ලංකා ගමනාගමන මණ්ඩලයේ සේවක මණ්ඩල කළමනාකාරතැන වෙත 1969 යේ ඔක්තෝම්බර් මස 11 වෙනි දිනට හෝ ඊට ප්‍රථම ලැබෙන සේ එවිය යුතුය.

ලංකා ගමනාගමන මණ්ඩලයේ
සේවක මණ්ඩල කළමනාකාරතැන.

200, කිරුළ පාර,
නාරාහේන්පිට,
කොළඹ 5,
1969 යේ සැප්තැම්බර් මස 14 වෙනි දිනදී ය.

### ලංකා ගමනාගමන මණ්ඩලය

### ඉල්ලුම්පත්‍ර පෝර්මය

1. ඉල්ලන තනතුර :————.

2. ඉල්ලුම්කරුවාගේ සම්පූර්ණ නම :————.

3. ලියුම් ලැබෙන පිළිවෙල :————.

4. උපන් දිනය :————.
(උප්පැන්න සහතිකයේ මුල් පිටපත නොව අනු පිටපතක් අමුණන්න.)

5. 1969.9.1 දිනට වයස :
අවුරුදු :————. මාස :————. දවස් :————.

6. ලාංකිකයෙකුවූයේ පෙලපතින්ද, ලියා පදිංචි වීමෙන්ද යන වග:————.

7. විවාහකද, අවිවාහකද යන බව :————
(විවාහක නම් විවාහවූ දිනයත් දරුවන් ගණනත් ඔවුන්ගේ වයසත් සඳහන් කරන්න.)

8. ද්වීතීය පාඨශාලා අධ්‍යායනය :————.
(ඉගෙනීම ලැබූ පාඨශාලාවද, සමත්වූ විභාගයද දිනයන් සහිතව සඳහන් කරන්න.)

9. උසස් අධ්‍යාපනය :—(ඔබ ඉගෙනීම ලැබූ විද්‍යාතන, සාමාර්ථය ලත් විභාග, වෘත්තීය සුදුසුකම් යන මේවා පිළිබඳ සම්පූර්ණ විස්තර දිනයන් සහිතව සඳහන් කරන්න.)
(සහතික පත්‍රවල මුල් පිටපත් නොව, අනු පිටපත් අමුණන්න.)

10. වෛධික සුදුසුකම් :—(ඔබ ඉගෙනීම ලැබූ ආයතන, සමත්වූ විභාග, ලබා ඇති සුදුසුකම් යන මේවා පිළිබඳ සම්පූර්ණ විස්තර දිනයන් සහිතව සඳහන් කරන්න.)
(සහතික පත්‍රවල මුල් පිටපත් නොව අනු පිටපත් අමුණන්න.)

11. (පාසැලෙන් අස්වූද සිට කළ රක්ෂාවන් පිළිබඳ සම්පූර්ණ විස්තර සඳහන් කරන්න. එනම් දූරු පදවියේ හා සේවා යෝජකයාගේ නම, පත්වූ දිනය, රක්ෂාවෙන් අස්වූ හෝ අස්කළ දිනය, රක්ෂාවෙන් අස්වීමට හේතු යන මේ කරුණු.)

12. වෘත්තීය පරිචය හෝ රාජ්‍ය සේවාවේ හෝ පළාත් පාලන සේවාවේ හෝ වෙළඳ ආයතනයක හෝ අන්කිසි ආයතනයක විධායක තනතුරක වැඩ කිරීමේ පළපුරුද්ද පිළිබඳ විස්තර : (දූරූ තනතුරු, කළ කටයුතු, සියළු දීමනාවන් ඇතුළුවූ පඩි යන මේවා දිනයන් සහිතව සඳහන් කරන්න.)

13. මේ තනතුර ඉල්ලීමට තමාට ඇති විශේෂ සුදුසුකම් :————.
(මේ තනතුරට ඔබේ සුදුසුකම් වැඩි කරවන්නාවූද, යථෝක්ත තනතුරු දරද්දී ඔබ කළාවූද වැඩ පිළිබඳ සංක්ෂේප විස්තරයක් ලියන්න.)

14. සිංහල භාෂාව ඉගෙනගත් ඉහලම ප්‍රමාණය :————.

15. මීට කලින් ඔබ ලංකා ගමනාගමන මණ්ඩලයේ කිසියම් තනතුරක් ඉල්ලා ඇත්තේද ? එසේනම් එහි ප්‍රතිඵලය කුමක්ද ? :————.

16. සෙසු විස්තර :————.

17. යම් ක්‍රිමිනල් වරදක් සම්බන්ධයෙන් ඔබ උසාවියකදී වරදකරුවෙකු වූයේ දැයි සඳහන් කරන්න. වරදකරුවෙකු වූයේ නම් විස්තර සඳහන් කරන්න :————.

18. ඔබ ගැන තොරතුරු දැනගැනීමට සුදුසු තැනැත්තන් දෙදෙනෙකුගේ නම හා ලිපිනයන් සඳහන් කරන්න :

1. ..................
..................
..................

2. ..................
..................
..................

මා විසින් දක්වා ඇති යථෝක්ත තොරතුරු සත්‍ය බවත් නිවැරදි බවත් මෙහි අඩංගු යම්කිසි තොරතුරක් අසත්‍ය බව හෝ වැරදි බව මා තේරීමට කලින් දැන ගතහොත් මා නුසුදුස්සෙකු විය හැකි නියාව හා තෝරා ගැනී මෙන් පසුව දැනගතහොත් වන්දි ගෙවීමක් නැතිව මා සේවාවෙන් පහකර දැමීමට සිදුවිය හැකි නියාව මා දන්නා බවත් මෙයින් ප්‍රකාශ කරමි.

————,
ඉල්ලුම්කරුවාගේ අත්සන.

දිනය :————.

9–980—69.9.26 දින අංක 14,873 දරන ගැසට් පත්‍රය

---

## රජකීය ලංකා ගුවන් හමුදාව

**රාජකීය ලංකා ගුවන් හමුදාවේ (සාමාන්‍ය රාජකාරී අංශයේ) සේවය සඳහා නියමු ආධුනිකත්ව—සංශෝධනය**

1. 1969 අගෝස්තු මස 29 වැනි දිනැති අංක 14,869 හා i වැනි කොටස ; (ii) වැනි ඡෙදය දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි 13 (ඇ) සහ 14 වැනි පරිච්ඡෙද මෙහි පහත සඳහන් අයුරු සංශෝධනය කර ඇත:—

**පරිච්ඡෙදය 13 (ඇ)** අධ්‍යාපන සුදුසුකම්—අධ්‍යාපන පොදු සහතික පත්‍ර විභාගය (සාමාන්‍ය) ඉංග්‍රීසි, සිංහල/දෙමළ, භෞතික විද්‍යාව, සහ ගණිතය සහිතව විෂයයන් හයකින් සමත්ව සිටින අපේක්ෂකයන්ගෙන් ලැබෙන ඉල්ලුම් පත් ගැන සලකා ගනු ලැබේ. නමුත් විෂයයන් ගෙන් උසස් සාමාර්ථය ලබා සිටින අය හෝ වඩා උසස් අධ්‍යාපන සුදුසුකම් ඇති අය ගැන වැඩි සැලකිල්ල දක්වනු ලැබේ. (අපේක්ෂකයින් අව සාන තෝරාගැනීමට ප්‍රථමයෙන් නිලධාරී ස්වභාවය මැනීමේ සහ සාමාන්‍ය දැනීමේ පරීක්ෂණයකින් සමත් විය යුතුයි).

**පරිච්ඡෙදය 14** නියමුවන් වශයෙන් පුහුණුවීම සඳහා අයදුම් පත් මෙම නිවේදනයේ 'අ' පරිශිෂ්ඨයේ ඇති ආකෘති පත්‍රයේ පිටපතක ලියා ගුවන් හමුදාපතිතුමා, තැ. පෙ. 594, කොළඹ කියා 1969 ඔක්තෝබර් 9 වෙනි දින දවල් 12 ට පෙර ලැබෙන සේ එවිය යුතුයි. අයදුම් පත් බහාලන කවරයේ ''අයදුම්පත නියමු ආධුනිකත්වය'' යනුවෙන් සඳහන් කළ යුතුයි.

ඊ. ආර්. අමරසේකර,
එයාර් වයිස් මාර්ෂල්,
ගුවන් හමුදාපති තැන.

1969 සැප්තැම්බර් මස 20.
ගුවන් හමුදාමූලස්ථානය,
තැ. පෙ. 594,
කොළඹ,

9–10ඵ—69.9.26 දින අංක 14,873 දරන ගැසට් පත්‍රය

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## ආයුර්වේද දෙපාර්තමේන්තුව

**භෛෂජ්‍යකයන් ලෙස පුහුණු කිරීමේ පාඨමාලාවට බඳවා ගැනීම— ආයුර්වේද වෛද්‍ය විද්‍යාලය**

භෛෂජ්‍යකයන් ලෙස පුහුණු කිරීමේ පාඨමාලාවට දැනට සේවයේ නියුක්ත අපේක්ෂකයන් බඳවා ගැනීම පිණිස, ආයුර්වේද දෙපාර්තමේන්තුවේ හා රජයේ අනුග්‍රහ ලබන පළාත් පාලන ආයතන ආයුර්වේද බෙහෙත් ශාලාවල දැනට සේවයේ යෙදී සිටින " ඩිස්පැන්සර්වරුන් " (ඖෂධ සංයෝජකයන්) ගෙන් පමණක් අයදුම්පත් කැඳවනු ලැබේ.

මෙහි පහත දැක්වෙන ආකෘතිය අනුව සකස් කළ ඉල්ලුම් පත්‍ර 1969 ඔක්තෝම්බර් මස 5 වැනි දින හෝ ඊට ප්‍රථම ලැබෙන සේ පහත සඳහන් ලිපිනයට ලේඛණ ගත තැපෑලෙන් එවිය යුතුය.

විද්‍යාලයාධිපති, රජයේ ආයුර්වේද වෛද්‍ය විද්‍යාලය, බණ්ඩාරනායක පුර, රාජගිරිය.

සෑම ඉල්ලුම් පත්‍රයක්ම අපේක්ෂකයා දැනට සේවය කරන ආයතනයේ ප්‍රධානියාගේ මාර්ගයෙන් ඉදිරිපත් කිරීමට සියළුම අපේක්ෂකයන් සටහන් කර ගත යුතුය.

මෙම පාඨමාලාව සඳා අපේක්ෂකයන් බඳවා ගැනීමේ සම්පූර්ණ පරිපාටිය මෙහි පහත පළකර ඇත. සේවයේ යෙදී සිටින ඩිස්පැන්සර්වරුන්ට අදළ කරුණු කෙරෙහි ඔවුන්ගේ අවධානය මෙයින් යොමු කරවනු ලැබේ.

විද්‍යාලයාධිපති.

රජයේ ආයුර්වේද වෛද්‍ය විද්‍යාලය,
බණ්ඩාරනායක පුර,
රාජගිරිය,
1969 සැප්තැම්බර් 16 වැනි දින.

### ඉල්ලුම් පත්‍රයේ ආදර්ශ ආකෘතිය

**ආයුර්වේද වෛද්‍ය විද්‍යාලයේ භෛෂජ්‍යකයන් පුහුණු කරවීමේ පාඨමාලාවට බඳවා ගැනීම**

(දැනට සේවයේ සිටින ආයුර්වේද ආරෝග්‍යශාලාවල හා පළාත් පාලන ආයතන ආයුර්වේද බෙහෙත් ශාලාවලසේවයේ යෙදී සිටින " ඩිස්පැන්සර් " වරුන් සඳහා පමණි)

1. සම්පූර්ණ නම :————.
2. වයස :————. උපන් දිනය :————.
3. සේවා ස්ථානය සහ ලිපිනය :————.
4. සේවයට බැඳුන දිනය :————.
5. දැනට දරණ ස්ථිර තනතුර :————.
6. දැනට දරණ තනතුරට පත්වූ දිනය :————.
7. අධ්‍යාපන සුදුසුකම් :————.
8. " ඩිස්පැන්සර්වරයකු " (ඖෂධ සංයෝජකයකු) වශයෙන් ලබා ඇති පලපුරුද්ද :— අවුරුදු :————. මාස :————.

මවිසින් ඉහත දක්වා ඇති තොරතුරු සත්‍ය බවත්, නිවැරදි බවත්, මෙයින් සහතික කරමි. සපයා ඇති තොරතුරුවල අසත්‍ය බව හෝ වැරදි බව අනාවරණය වුවහොත් මා පුහුණු කිරීමේ පාඨමාලාවට තෝරාගනු ලැබීමට නුසුදුස්සකු වන බවත්, යම් හෙයකින් තෝරාගනු ලැබීමෙන් පසුව, ඒ බව අනාවරණය වුවහොත් විනයානුකූලව ක්‍රියා කරනු ලැබීමටද, පුහුණුව ලබමින් හෝ ලැබීමට නියමිත පාඨමාලාවෙන් ඉවත් කිරීමටද, කරුණක් වන බව මම දනිමි.

————,
අත්සන.

දිනය :————.

**සේවා ස්ථාන ප්‍රධානියාගේ සහතිකය**

ඉහත 1 සිට 8 දක්වා සඳහන් කරුණු පරීක්ෂාකර බැලූ බවත්, ඒවා නිවැරදි බවත්, සහතික කරමි. ......................................................... නමැති මෙම අපේක්ෂකයා යථෝක්ත පුහුණුව ලැබීමට සෑම අතින්ම සුදුසුකම් ලබා සිටින බවද සහතික කරමි. මොහුගේ රාජකාර්‍ය කටයුතු හා හැසිරීම සතුටුදායකයි.

අත්සන :— .........................................

තනතුර :— .........................................

දිනය :————.

## ආයුර්වේද භෛෂජ්‍යකයන් ලෙස පුහුණු කිරීමේ පාඨමාලාවට අපේක්ෂකයන් බඳවා ගැනීමේ පරිපාටිය

1. **වැටුප් ක්‍රමය.**—(1) (අ) මෙම පාඨමාලාව හදරණ බාහිර අයදුම්කරුවන්ට එකී කාලසීමාව තුල කිසියම් වැටුපක් හෝ දීමනාවක් ගෙවනු නොලැබේ.

(ආ) ආයුර්වේද දෙපාර්තමේන්තුවේ හෝ රජයේ අනුග්‍රහය ලබන පළාත් පාලන සේවයේ ආයුර්වේද බෙහෙත් ශාලාවල සේවය කරණ ඩිස්පැන්සර්වරුන්ට දැනට ලබන වැටුප් හා දීමනා, පුහුණුව ලබන කාල සීමාව තුල එලෙසම ගෙවනු ලැබේ.

(2) (අ) ආයුර්වේද භෛෂජ්‍යකයින් වශයෙන් සාර්ථක ලෙස පාඨමාලාව හැදෑරූ, ආයුර්වේද දෙපාර්තමේන්තුවේ හෝ පළාත් පාලන සේවයේ නියුක්ත වූවන්, වර්ෂයකට රු. 1,380—120 × 13—2,940 වැටුප් ක්‍රමය මත ඒ ඒ ආයතනවලට පත් කෙරෙනවා ඇත.

(ආ) බාහිර අයදුම්කරුවන්ට රක්ෂා සැපයීමට බැඳී නැති නමුත් ආයුර්වේද දෙපාර්තමේන්තුවේ හෝ පළාත් පාලන සේවයේ පුරප්පාඩු ඇති වන පරිදි රක්ෂා සැපයීමේ පහසුකම් සලසන අතර, ආයුර්වේද භෛෂජ්‍යකයින් ලෙස පත්වීමෙන් පසු යථෝක්ත වැටුප් ක්‍රමය ලැබීමට සුදුස්සන් වනු ඇත.

2. **වයස් සීමාව.**—සෑම අයදුම්කරුවෙකුම ඉල්ලුම්පත්‍ර භාර ගන්නා වර්ෂයේ ඔක්තෝම්බර් මස 1 වන දිනට වයස අවුරුදු 17 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 35 ට නොවැඩි විය යුතුය. ආයුර්වේද දෙපාර්තමේන්තුවේ හෝ පළාත් පාලන සේවයේ නියුක්ත වූවන් කෙරෙහි උපරිම වයස් සීමාව බලපානු නොලැබේ. ලාංකිකයකු විය යුතුය.

3. **අධ්‍යාපනික හා වෙනත් සුදුසුකම්.**—(i) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගය හෝ දෙවරකට නොවැඩි වාර ගණනකදී අධ්‍යයන පොදු සහතික පත්‍ර විභාගයේදී (සාමාන්‍ය පෙළ) සිංහල/දෙමළ භාෂාව, ගණිතය/අංක ගණිතය, හා රසායන විද්‍යාව හෝ සංස්කෘත භාෂාව ඇතුළු විෂයයන් 6 න් සමත්ව සිටීම හෝ,

(ii) කණිෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගය හෝ ඊට සමාන වෙනත් විභාගයකින් සමත්ව ආයුර්වේද දෙපාර්තමේන්තුවේ හෝ පළාත් පාලන සේවයේ රජයේ අනුග්‍රහය ලබන ආයුර්වේද බෙහෙත් ශාලාවක අවුරුදු 5 ට නොඅඩු කාලයක් ඩිස්පැන්සර් කෙනෙකු වශයෙන් සේවයේ යෙදී සිටිය යුතුය. වෛද්‍යවරයා විසින් රෝගීන්ට නියම කරනු ලබන ඖෂධ වර්ග නිසි පරිදි කිරා බලා සකස් කරදීම ඩිස්පැන්සර්ගේ සේවයයි.

4. **බඳවා ගැනීමේ ක්‍රමය.**—(i) මෙම පාඨමාලාව හැදෑරීම පිණිස අපේක්ෂකයන් තෝරා ගැනීම සඳහා ගැසට් නිවේදනයක් මගින් ඉල්ලුම් පත්‍ර කැඳවනු ලැබේ. මෙහි පහත දැක්වෙන අයුරු ඇතුළත්වීමේ ලිඛිත පරීක්ෂණයක් පවත්වා ඒ අනුව සුදුස්සන් තෝරා ගනු ලැබේ. ඇතුළත්වීමේ ලිඛිත පරීක්ෂණය මේ අයුරු පැවැත්වේ :—

(1) භාෂාව (පැය 3 ප්‍රශ්න පත්‍රයක්)

(2) සාමාන්‍ය බුද්ධිය (පැය 1½ ප්‍රශ්න පත්‍රයක්)

(3) සාමාන්‍ය දැනීම (පැය 1½ ප්‍රශ්න පත්‍රයක්)

ආයුර්වේද දෙපාර්තමේන්තුවේ සහ පළාත් පාලන සේවයේ යෙදී සිටින ඩිස්පැන්සර්වරුන් උදෙසා ඉහත දැක්වෙන විෂයයන්ට අමතරව, ඖෂධ නිෂපාදනයේ මූලික ප්‍රතිපත්ති ගැන පැය 1½ ක ප්‍රශ්න පත්‍රයක්ද වේ.

අයදුම්කරුවන්ට සිංහළ හෝ දෙමළ මාධ්‍යයෙන් විභාගයට පෙනී සිටිය හැක.

(ii) පුහුණුවීම සඳහා තෝරා ගනු ලබන අයදුම්කරුවන් විසින් ලියාපදිංචි කිරීමේ ගාස්තු වශයෙන් රු. 15 ක්ද, පුස්තකාල ගාස්තු වශයෙන් රු. 10 ක්ද, ගෙවිය යුතුය.

5. **සේවයට බඳවා ගැනීමේ කොන්දේසි.**—ආයුර්වේද දෙපාර්තමේන්තුව යටතේ පත්වීම් ලබන ආයුර්වේද භෛෂජ්‍යක තනතුරු ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු හා අනත්දරු අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය.

පළාත් පාලන සේවය යටතේ පත්වීම් ලබන ආයුර්වේද භෛෂජ්‍යකයින්ට පළාත් පාලන සේවයේ නියුක්ත අනිකුත් නිළධාරීන්ට බලපාන සියලු අයිතිවාසිකම් හිමිවනු ඇත.

6. **සේවා කොන්දේසි.**—(අ) තෝරාගනු ලබන බාහිර අයදුම්කරුවන් දෑවුරුදු කාල සීමාවකටද, ආයුර්වේද දෙපාර්තමේන්තුවේ හා පළාත් පාලන සේවයේ අයදුම්කරුවන් අවුරුද්දකුත් මාස තුනක කාල සීමාවකටද පුහුණුව සඳහා යොදනු ලැබේ. අයදුම්කරුවන් සෑමදෙනාම අවුරුද්දක න්‍යාය පුහුණුව කළ යුතු අතර, ප්‍රායෝගික පුහුණුව මෙහි පහත දැක්වෙන අයුරු වෙන් වෙන් වශයෙන් පැවැත්වේ.

බාහිර අයදුම්කරුවන් සඳහා ප්‍රායෝගික පුහුණුව අවුරුද්දක් මෙහි පහත දැක්වෙන අයුරු පැවැත්වේ :—

1 වන වාරය—මාස 3—ඖෂධ හැඳිනීම—(මේ කොටස ඖෂධ ගබඩාවේදී දිය යුතුය.)

2 වන වාරය—මාස 3—ශෝධන ක්‍රම සහ මැනුම් කිරීම.

3 වන වාරය—මාස 3 — ඖෂධ සංස්කරණය. අංක 2, 3 සඳහන් අභ්‍යාස ඖෂධ නිෂ්පාදනාගාරයේදී දෙනු ලැබේ.

4 වන වාරය—මාස 3—බෙහෙත් ශාලාවේ (ඩිස්පැන්සරිය) පුහුණුව.

(iv) උද්භිද කාණ්ඩයට අයත් රත්නෙවුල්, හල්ලාතක, ගුග්ගුලු සහ හල්ලාතක ප්‍රධාන වශයෙන් ගෙන සාදන අමෘත හල්ලාතක ගුඩ, හල්ලාතක ක්ෂෞද්‍ර වැනි බෙහෙත් පිළිබඳ මූලික දැනුම.

(v) කිඩාරම්, හබරල, කුරුළු, කුංකුම, කස්තූරි, ගෝරෝචන, තිත්ත අබිං, පෙරුම්කායම්, ගිතෙල්, මීපැණි, වැනි දෑ පිළිබඳ මූලික දැනුම.

(vi) සංස්කරණ කරන ලද ඖෂධ සංයෝග වන සිද්ධාර්ත තෛලය වැනි තෙල් වර්ගත්, පංචතික්ත ඝෘතය වැනි ඝෘත වර්ගත්, මානිභද්‍ර වැනි මෝදක වර්ග සහ විවිධ චූර්ණ වර්ග ආදී වැඩි වශයෙන් භාවිතා වන බෙහෙත්.

මේ ඉහත සඳහන් කරුණු පිළිබඳව ඉගැන්වීම භෛෂජ්‍යක ශ්‍රේණියට අදාල වන කොටස් පමණක් විය යුතුය.

## ප්‍රායෝගික අංශය

### " ආ " පරිශිෂ්ටය

ප්‍රායෝගික පුහුණුව දෙන අවුරුද්ද, වාර 4 කට බෙදනු ලැබේ.

**1 වැනි වාරය** : ඖෂධ හැඳිනීම—මේ කොටස ඖෂධ ගබඩාවේදී දිය යුතුය.

**2 වැනි වාරය** : ශෝධන ක්‍රම සහ මැනුම් කිරීම.

**3 වැනි වාරය** : ඖෂධ සංස්කරණ.

අංක 2, 3 සඳහන් අභ්‍යාස, ඖෂධ නිෂ්පාදනාගාරයේදී දෙනු ලැබේ.

**4 වැනි වාරය** : බෙහෙත් ශාලාවේ (ඩිස්පැන්සරිය) පුහුණුව.

තෝරාගත් අයදුම්කරුවන් කොටස් 4 කට බෙද, මේ අංශ 4රේ පුහුණුවන කොටස, තුන් මාසය බැගින් මාරුවෙන් මාරුවට පුහුණු කිරීම පිණිස යැවිය හැකිය.

**සේවයේ නියුතු අය සඳහා.**—මෙය එක් එක් අංශයේ පුහුණුවක් උදෙසාය. ඒ අනුව මේ පුහුණුව පහත දැක්වෙන සේ බෙදේ.

1. සති 2—ඖෂධ හැඳිනීම.
2. සති 2—ශෝධන ක්‍රම.
3. මාස 2—ඖෂධ සංස්කරණ.

### පරීක්ෂණය

කොටස් 2 කි.

1. ලිඛිත.
2. ප්‍රායෝගික.

**ලිඛිත පරීක්ෂණය.**—පැය 2 කේ ප්‍රශ්න පත්‍රය බැගින් (ප්‍රශ්න ප්‍රත්‍රය ප්‍රශ්න 4 කට සීමා විය යුතුයි).

පත්‍රයකට ලකුණු 100 යි.
වාචික ලකුණු 100 යි.

**ප්‍රායෝගික පරීක්ෂණය.**—ප්‍රායෝගික ලකුණු 100 යි.

ප්‍රායෝගික අංශයේදී ඖෂධ හැඳිනීම, ඖෂධ සංස්කරණය ආදිය පිළිබඳව පරීක්ෂා කරනු ලැබේ. එක කොටසකින් සමත්වීමට අඩු තරමින් සියයට 40 ක් ලකුණු ලැබිය යුතුයි. යම් හෙයකින් එක් විෂයකින් පමණක් සියයට 33⅓ ට නොඅඩු ලකුණු ලැබ මුළු විභාගයේදීම සාමාන්‍ය ලකුණු සංඛ්‍යාව සියයට 40 ට නොඅඩු වුවහොත් මුළු විභාගයෙන්ම සමත් වූවාසේ සලකනු ලැබේ.

### සහතික පත්‍ර

පරීක්ෂණයෙන් සමත්වූ සැම අපේක්ෂකයකුටම විද්‍යාලයේ විද්‍යාලයාධිපති හා ලේඛකාධිකාරි විසින් අත්සන් තබන ලද සහතික පත්‍රයක් නිකුත් කරනු ලැබේ.

**9–992—69.9.26 දින අංක 14,873 දරන ගැසට් පත්‍රය**

---

## ධීවර දෙපාර්තමේන්තුව

### මීගමුවේ ධීවර අභ්‍යාස මධ්‍යස්ථානය

### ධීවර අභ්‍යාස පාඨමාලාව—දෙමළ මාධ්‍යය

1970 ජනවාරි මාසයේදී ආරම්භ වන දෙමළ මාධ්‍යයෙන් පවත්වනු ලබන ධීවර අභ්‍යාස පාඨමාලාව සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

අයදුම්පත් පහත දැක්වෙන ආදර්ශ ආකෘති පත්‍රය අනුව සකස් කොට 1969 නොවැම්බර් මස 15 වෙනි දින හෝ ඊට පෙර හෝ මීගමුවේ සාන්ත සෙබස්තියන් පටු මාවතේ ධීවර අභ්‍යාස මධ්‍යස්ථානයේ විද්‍යාලයාධිපති වෙත ලැබෙන සේ එවිය යුතුයි.

2. **විෂය ප්‍රමාණය සහ පුහුණුවීමේ කාලය.**—ධීවර ආම්පන්න, මසුන් මැරීමේ ක්‍රම, ඇන්ජින් ක්‍රියා කරවීම සහ නඩත්තු කිරීම යන මේවා පුහුණු කරවීම මෙම පාඨමාලාවලට ඇතුළත් වේ. මෙම පාඨමාලාව සඳහා ගතවන කාලය දළ වශයෙන් සමසකි. එක් පාඨමාලාවක් සඳහා අභ්‍යාස ලාභීන් 15 දෙනෙකුට ඉඩකඩ සැලසේ.

3. **පුහුණුකිරීමේ කොන්දේසි.**—(i) පුහුණුවීමේ කාලසීමාව තුළදී පුහුණු වන්නන් අභ්‍යාස මධ්‍යස්ථානයෙහිම නැවතී සිටිය යුතුයි.

(ii) නොමිළයේ ඉඳුම්, හිටුම් සැලසෙතත් කොට්ට, මෙට්ට, ඇඳ ඇතිරිලි ආදිය තමන්ම සපයාගත යුතුය.

(iii) පුහුණුවීමේ අවසාන කිරීමෙන් පසු රජය යටතේ රැකියාවක් ලබා ගැනීමේ කිසිම අයිතිවාසිකමක් පුහුණු වන්නන් හට නොමැත.

(iv) පුහුණුවීමේ කාලසීමාව තුළදී පුහුණුවන්නන් විසින් අභ්‍යාස මධ්‍යස්ථානයේ නීති රීති පිළිපැදිය යුතුය.

(v) පුහුණුවන්නන්ගෙන් ගාස්තු අයකිරීමක් නැත.

(vi) 1870 ජනවාරි මාසයේ ආරම්භ වන්නාවූ පාඨමාලාව සඳහා ඉගැන්වීමේ මාධ්‍යය දෙමළය.

(vii) මධ්‍යස්ථානයට අයත් අභ්‍යාස බෝට්ටු තුළ මුහුදෙහිදී පරීක්ෂණ පවත්වා පෙන්වීම අභ්‍යාසයට ඇතුළත් වේ.

(viii) දිනකට රු. 2ක යැපීම් දීමනාවක් අභ්‍යාසලාභීන් හට ගෙවනු ලැබේ.

4. **අවශ්‍ය සුදුසුකම්.**—(i) මෙම අභ්‍යාස පාඨමාලාව සඳහා ඉදිරිපත් වන සැම අයදුම්කරුවකු විසින්ම පහත සඳහන් කරුණු සනාථ කිරීම සඳහා සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.—

(අ) 1969 නොවැම්බර් 15 වෙනි දිනට වයස අවුරුදු 18 නොඅඩු සහ අවුරුදු 30ට නොවැඩි වේ.

(ආ) විශිෂ්ඨ චරිතයකින් සහ හොඳ ශරීර සනීපයෙන් යුක් බව

(ඇ) දෙමළ කණිෂ්ඨ දක්වා ඉගෙනීම කර ඇති බව.

**සංලක්ෂ්‍යය.**—උදොාගිමත් ධීවර කාර්මිකයින් වන්නාවූද එවැන්නන්ගේ දරුවන් වන්නාවූද අයදුම්කරුවන්ට හ විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.

5. (1) අයදුම්කරුවන් විසින් පහත සඳහන් සහතිකවල පිටපත් (මුල් පිටපත් නොවේ) තම අයදුම්පත් සමග ඉදිරිපත් කළ යුතුයි :—

(අ) උප්පැන්නය ලියාපදිංචි කිරීමේ සහතිකය,

(ආ) ලබා ඇති උසස්ම අධ්‍යාපනික සුදුසුකම් පිළිබඳ සහතිකය,

(ඇ) චරිත සහතික දෙකක්,

(ඈ) අයදුම්කරුගේ සහ ඔහුගේ පියාගේ රක්ෂාව කුමක්දැයි සඳහන් කොට ග්‍රාමසේවක තැන විසින් දෙන ලද සහතිකයක්.

6. නියමිත ස්ථානයෙකදී නියමිත වේලාවක සම්මුඛ පරීක්ෂණයකට පෙනී සිටීමට අයදුම්කරුවන් සූදනමින් සිටිය යුතුය. මෙයට අදාල ගමන් වියදම් හෝ වෙනත් වියදම් කිසිවක් ගෙවනු නොලැබේ.

7. අභ්‍යාස පාඨමාලාව ආරම්භ කෙරෙන දිනය ඒ සඳහා තෝරා ගනු ලබන අයදුම්කරුවන් හට දැනුම් දෙනු ලැබේ.

8. අයදුම්පත් සහ ඒවාට සියළු ලිපිලේඛන එවිය යුත්තේ මීගමුවේ ශාන්ත සෙබස්තියන් පටු මාවතෙක ධීවර අභ්‍යාස මධ්‍යස්ථානයේ විද්‍යාලයාධිපති වෙත විනා මෙම දෙපාර්තමේන්තුවේ කිසිම නිලධාරියකු හට පුද්ගලිකව නොවේ.

අයි. ඕ. කේ. ජී. ප්‍රනාන්දු,
ධීවර අධ්‍යක්ෂ.

1969 සැප්තැම්බර් මස 12 වැනි දින
ධීවර දෙපාර්තමේන්තුව
තැ. පෙ. 531
කොළඹ.

### අයදුම් පත්‍ර ආකෘතිය

1. සම්පූර්ණ නම :————.
   (අ) පෙළපත් නාමය :————.
   (ආ) වෙනත් නම් :————.
2. ලිපිනය :————.
3. (අ) 1969 නොවැම්බර් 15 ත්නට නියම වයස :
   අවුරුදු :————[ මාස :————. දින : ———
   (ආ) උපන් දිනය :————.
4. ජාතිය :————.
5. අයදුම්කරුගේ දන් රක්ෂාව :————.

6. අයදුම්කරු රක්ෂාවෙහි නියුක්ත ස්ථානය :————.

7. අයදුම්කරු ධීවරයෙකු නම්—

(අ) මස් මැරීමේ ආකාරය :————.

(ආ) බෝට්ටුවක් සහ/හෝ ආම්පන්න හිමියකුද යන වග :————.

(ඇ) යාන්ත්‍රික බෝට්ටු හිමියකුද යන වග :————.

8. අයදුම්කරුගේ පියාගේ දැන් රක්ෂාව :————.

9. අයදුම්කරුගේ පියා රක්ෂාව කරන ස්ථානය :————.

10. අයදුම්කරු විවාහකද අවිවාහකද වැන්දඹු පුරුෂයකුද යන වග :————
(විවාහක නම් දරුවන් ගණන සඳහන් කරන්න)

11. අධ්‍යාපනික සුදුසුකම් :————.

12. දැනට ලබා ඇති අභ්‍යාසයන් පිළිබඳ විස්තර :————.

13. මෙම පාඨමාලාව හැදෑරීම සඳහා තෝරා ගැනීම පිණිස යම් විශේෂ හිමිකමක් තිබේ නම් ඒ පිළිබඳ විස්තර :————.

————
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

9–832—69.9.26 දින අංක 14,873 දරන ගැසට් පත්‍රය.

---

## ධීවර දෙපාර්තමේන්තුව

### ධීවර අභ්‍යාස මධ්‍යස්ථානය—මීගමුව

### අළුත්වැඩියා කිරීමේ යාන්ත්‍රිකයන් පුහුණුකිරීමේ අභ්‍යාස පාඨමාලාව—දෙමළ මාධ්‍යය

1970 ජනවාරි මාසයේදී ආරම්භ කෙරෙන අළුත්වැඩියා කිරීමේ යාන්ත්‍රිකයින් පුහුණු කිරීමේ දෙමළ මාධ්‍යයෙන් පැවැත්වෙන අභ්‍යාස පාඨමාලාව සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

පහත දැක්වෙන ආදර්ශ ආකෘති පත්‍රය අනුව පිළියෙල කරගත් අයදුම්පත් 1969 නොවැම්බර් මස 15 වෙනි දින හෝ ඊට පෙර මීගමුවේ සාන්ත සෙබස්තියන් පටු මාවතේ ධීවර අභ්‍යාස මධ්‍යස්ථානයේ විද්‍යාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතුය.

2. **විෂය ප්‍රමාණය හා පුහුණුවීමේ කාල පරිච්ඡේදය.**—(i) පුහුණු කිරීමේ පාඨමාලාවට සමුද්‍ර ඇන්ජින් සර්විස් කිරීම, අළුත්වැඩියා කිරීම, නඩත්තු කිරීම, ක්‍රියා කරවීම, සිද්ධාන්ත සහ මූලධර්ම පිළිබඳ පුහුණුවක් ලබාදීම ඇතුළත් වේ. මෙම පුහුණු කිරීමේ කාලපරිච්ඡේදය දළ වශයෙන් 6 මසකි. එකවරකට එක් පාඨමාලාවක් සඳහා පුහුණුවන්නන් දස දෙදෙනකුට ඉඩකඩ සැලසේ.

3. **පුහුණු කිරීමේ කොන්දේසි.**—(i) පුහුණුවීමේ කාලසීමාව තුළදී පුහුණුවන්නන් අභ්‍යාස මධ්‍යස්ථානයෙහිම නැවතී සිටිය යුතුය.

(ii) නොමිලයේ ඉඳුම් හිටුම් සැලසෙතත් කොට්ට, මෙට්ට, ඇඳ ඇතිරිලි ආදිය තමන්ම සපයාගත යුතුය.

(iii) පුහුණුවීම අවසාන කිරීමෙන් පසු රජය යටතේ රැකියාවක් ලබා ගැනීමේ කිසිම අයිතිවාසිකමක් පුහුණුවන්නන් හට නොමැත.

(iv) පුහුණුවීමේ කාලසීමාව තුළදී පුහුණුවන්නන් විසින් අභ්‍යාස මධ්‍යස්ථානයේ නීති රීති පිළිපැදිය යුතුය.

(v) පුහුණුවන්නන්ගෙන් ගාස්තු අයකිරීමක් නැත.

(vi) පුහුණු කිරීමේ භාෂා මාධ්‍යය දෙමළ වන්නේය.

(vii) දිනකට රු. 2ක යැපීම් දීමනාවන් අභ්‍යාස ලාභීන්ට ගෙවනු ලැබේ.

4. **අවශ්‍ය සුදුසුකම්.**—මෙම පුහුණු කිරීමේ පාඨමාලාව සඳහා අයදුම්පත් එවනු ලබන සෑම අයෙක්ම පහත සඳහන් කරුණු සනාථ කිරීම සඳහා සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(අ) 1969 නොවැම්බර් මස 15 වෙනි දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා 35 ට නොවැඩි බවට,

(ආ) විශිෂ්ඨ චරිත ශුද්ධියකින් හා හොඳ ශරීර සනීපයකින් යුත් බවට,

(ඇ) ගරාජයක හෝ වැඩපොලකදී ලබාගත් අවුරුදු 3ක ප්‍රායෝගික යාන්ත්‍රික පළපුරුද්ද,

(ඈ) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකය හෝ අංක ගණිතයද ඇතුළුව විෂයයන් 4කින් ලත් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) සහතිකය.

5. අයදුම්පත් එවන්නන් විසින් පහත සඳහන් සහතිකවල පිටපත් (මුල් පිටපත් නොවේ) තම අයදුම්පත් සමග ඉදිරිපත් කළ යුතුය :—

(අ) උප්පැන්නය ලියාපදිංචි කිරීමේ සහතිකය,

(ආ) අධ්‍යාපනික සුදුසුකම් පිළිබඳ සහතිකය,

(ඇ) චරිත සහතික දෙකක්,

(ඈ) අයදුම්කරුගේ හා ඔහුගේ පියාගේ රැකියාවන් සඳහන් කරන ග්‍රාමසේවකගෙන් ලබාගත් සහතිකයක්,

(ඉ) තමන් විසින් ලබා ඇති යාන්ත්‍රික පුහුණුව පිළිබඳ සහතික.

6. නියමිත ස්ථානයකදී නියමිත වේලාවක සම්මුඛ පරීක්ෂණයකට පෙනී සිටීමට අයදුම්කරුවන්ට දැනුම් දෙනු ලැබේ.

7. අභ්‍යාස පාඨමාලා ආරම්භ කෙරෙන දිනය ඒ සඳහා තෝරාගනු ලබන අයදුම්කරුවන්ට හට දැනුම් දෙනු ලැබේ.

8. අයදුම්පත් සහ ඊට අදාල සියළු ලියකියවිලි එවිය යුත්තේ මීගමුවේ සාන්ත සෙබස්තියන් පටු මාවතේ ධීවර අභ්‍යාස මධ්‍යස්ථානයෙහි විද්‍යාලයාධිපති නමින් මිස මෙම දෙපාර්තමේන්තුවේ කිසිම නිලධාරියකු හට පුද්ගලිකව නොවේ.

අයි. ඕ. කේ. ජී. ප්‍රනාන්දු,
ධීවර අධ්‍යක්ෂ.

ධීවර දෙපාර්තමේන්තුව,
තැ. පෙ. 531, කොළඹ,
1969 සැප්තැම්බර් මස 12 වැනි දින.

### අළුත්වැඩියා කිරීමේ යාන්ත්‍රිකයින් (රෙපයාර් මිකැනික්වරුන්) පුහුණු කිරීමේ අභ්‍යාස පාඨමාලාව (දෙමළ මාධ්‍යය) සඳහා ඉල්ලුම් කිරීමේ ආකෘති පත්‍රය

1. සම්පූර්ණ නාමය :————.

(අ) පෙළපත් නාමය :————.

(ආ) වෙනත් නාමයන් :————.

2. ලිපිනය :————.

3. (අ) 1969 නොවැම්බර් මස15 වැනි දිනට වයස :—

අවු. :————. මාස :————. දින :————

(ආ) උපන් දිනය :————.

4. ජාතිය :————.

5. අයදුම්කරුගේ දැන් රැකියාව :————.

6. අයදුම්කරු රැකියාවෙහි නියුක්ත ස්ථානය :————.

7. අයදුම්කරු විවාහකද, අවිවාහකද, භාර්‍යාව මළ පුරුෂයෙක්ද යන වග :————.
(විවාහක නම් දරුවන් ගණන සඳහන් කරන්න)

8. අධ්‍යාපනික සුදුසුකම් :————.

9. අයදුම්කරු විසින් ලබා ඇති යාන්ත්‍රික පුහුණු පිළිබඳ තොරතුරු :——.

10. මෙම අභ්‍යාස පාඨමාලාව හැදෑරීම සඳහා තෝරා ගැනීමට යම් විශේෂ හිමිකමක් ඇත්නම් ඒ පිළිබඳ විස්තර :————.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

9–821—69.9.26 දින අංක 14,873 දරන ගැසට් පත්‍රය

# ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව—මහියංගන උප කොට්ඨාශය

බදුල්ල දිස්ත්‍රික්කයේ මහියංගන උප කොට්ඨාශය යටතේ විල්ලු වැව ප්‍රධාන වැ කන්ඩිය වැඩි දියුණු කිරීම සඳහා ටෙන්ඩර් පත් 1969 ඔක්තෝබර් මස 20 වැනි සඳු දින පෙරවරු 10 දක්වා බණ්ඩාරවෙල ඌව කොට්ඨාශයේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් භාරගනු ලැබේ. ටෙන්ඩර් විවෘත කිරීම එවෙලේම එහිදී සිදු කෙරේ.

2. වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රුපියල් 20,000 කට හෝ ඊට වැඩි ගණනකට ලියා පදිංචි වූ කොන්ත්‍රාත්කරුවන්ට සමුපකාර සමිතිවලට සහ ග්‍රාම සංවර්ධන සමිතිවලට පමණක් මේ වැඩය සඳහා ටෙන්ඩර් අයදුම් පත් ඉදිරිපත් කල හැකිය.

3. 1969 ඔක්තෝබර් මස 17 වැනි සිකුරාද වනතෙක් කායඝාල වේලාවන් තුලදී මහියංගන, බදුල්ල සහ මොණරාගල යන වාරිමාර්ග කායඝාලවලින් ලබාගත හැකි පෝර්මවල ටෙන්ඩර් අයදුම් පත් සකස් කල යුතුය. ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේදී ඒ සඳහා ඉදිරිපත්වන ටෙන්ඩර්කරුවන් ඔවුන්ගේ ලියා පදිංචි පොත් සහ දැනට ඔවුන් කරන වාරිමාර්ග වැඩ සහ ඒවායේ වටිනාකම දක්වෙන ප්‍රකාශයක් ඔවුනට ටෙන්ඩර් කිරීමට ඉඩ ලැබිය යුතුද නැද්ද යන්න සලකා බැලීම සඳහා වාරිමාර්ග ඉංජිනේරු තැනවෙත ඉදිරිපත් කල යුතුය. පෝර්ම නිකුත් කිරීමට පෙර රුපියල් විසි පහක (රු. 25.00) ටෙන්ඩර් තැන්පත් මුදලක් වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කායඝාලයේ හෝ ඕනෑම කච්චේරියක තැන්පත් කොට ඒ වෙනුවෙන් ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කල යුතුය.

4. මේ ටෙන්ඩරය ගැන වැඩි විස්තර, ගිවිසුම, වැඩය පිළිබඳ සැලසුම්, විශේෂ විස්තර යනාදීන් කායඝාලීය වේලාවන් තුලදී මහියංගන වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කායඝාලයෙන් ලබා ගත හැකි ය.

ඇස්. සිවලින්ගම්,
වාරිමාර්ග ඉංජිනේරු,
මහියංගන උප කොට්ඨාශය.

1969 සැපතැම්බර් මස 11 වැනි දින,
මහියංගන වාරිමාර්ග කායඝාලයේදී ය.

9–829—69.9.26 දින අංක 14,873 දරන ගැසට් පත්‍රය

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

### හක්වටුනාඔය ජලාශ ව්‍යාපාරය

වයඹ කොට්ඨාශය භාර ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරුතැන විසින් කුරුණෑගල දිස්ත්‍රික්කයේ හක්වටුනා ඔය ජලාශ ව්‍යාපාරය යටතේ බඩු ප්‍රවාහණය කිරීම සඳහා 1969 ඔකතෝබර් මස 21 වැනි අඟහරුවාද පෙරවරු 10 දක්වා ටෙන්ඩර් භාර ගනු ලැබේ.

වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රු. 15,000 කට හෝ ඊට වැඩි ගණනකට ලියාපදිංචි වී ඇති කොන්ත්‍රාත්කරුවන්ට, සමුපකාර සමිති හා ග්‍රාම සංවර්ධන සමිතිවලට මේ වැඩය සඳහා ඉල්ලුම් කළ හැක. හක්වටුනා ඔය ජලාශ ව්‍යාපාරයේ වාරිමාර්ග කාර්යාලයෙන් හෝ කුරුණෑගල/නිකවැරටිය වාරිමාර්ග කාර්යාලයෙන් ලබාගත හැකි ආකෘති පත්‍රවල පිටපත් දෙකකින් යුතුව ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය. කොළඹ වාරිමාර්ග අධ්‍යක්ෂ තැනගේ කාර්යාලයේ හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියක හෝ හක්වටුනා ඔය/කුරුණෑගල/නිකවැරටිය වාරිමාර්ග කාර්යාලයේ ටෙන්ඩර් තැන්පත් මුදල වශයෙන් රුපියල් විසි පහක් (රු. 25) තැන්පත් කොට ඒ වෙනුවෙන් ලබා ගත් මුදල් කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් ටෙන්ඩර් ආකෘති පත්‍ර 1969 ඔක්තෝබර් 17 වැනි දින පස්වරු 1 දක්වා ලබා ගත හැක.

1969 ඔක්තෝබර් මස 21 වැනි අඟහරුවාද පෙරවරු 10 ට කුරුණෑගල ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරුතැනගේ කාර්යාලයේදී ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් කරුවන්ට පැමිණ සිටීමට අවසර දෙනු ලැබේ.

ටෙන්ඩර් කොන්දේසි ඇතුලත් වැඩි විස්තර හක්වටුනා ඔය ජලාශ ව්‍යාපාරයේ වාරිමාර්ග කාර්යාලයෙන් ලබාගත හැක.

සී. අප්පදුරෙයි,
උප කොට්ඨාශ භාර නිලධාරි,
හක්වටුනා ඔය ජලාශ ව්‍යාපාරය.

වාරිමාර්ග කාර්යාලය, මකුල්පොත, 1969.9.13.

9–851—69.9.26 දින අංක 14,873 දරන ගැසට් පත්‍රය

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

### හක්වටුනාඔය ව්‍යාපාරය

හක්වටුනාඔය ව්‍යාපාරයේ පහත සඳහන් වැඩය සඳහා ටෙන්ඩර් පත් 1969 ඔක්තෝබර් 21 වෙනි අඟහරුවාද පෙරවරු 10 දක්වා කුරුණෑගල, වයඹ කොට්ඨාශයේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් භාරගනු ලැබේ. ටෙන්ඩර් විවෘත කිරීම එවෙලේම එහිදී සිදුකෙරේ.

| වැඩෙහි නම | ලියාපදිංචි ප්‍රමාණය රු. | ටෙන්ඩර් තැන්පත් මුදල රු. |
|---|---|---|
| වයඹ කොට්ඨාශයේ හක්වටුනාඔය ව්‍යාපාරයේ සියඹලාගමුව වැවේ අංක 1, 2 සහ 3 දරණ වාන් ඉස්සීම. | 96,000 ට හෝ ඊට වැඩි | 200 |

2. වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ඉහත සඳහන් ගණනට ලියාපදිංචි වී ඇති කොන්ත්‍රාත්කරුවනට සමුපකාර සමිතිවල සහ ග්‍රාම සංවර්ධන සමිතිවලට පමණක් මේ වැඩය සඳහා ටෙන්ඩර් අයැදුම්පත් ඉදිරිපත් කළ හැක.

3. 1969 ඔක්තෝබර් මස 17 වෙනි සිකුරාද වනතෙක් කාර්යාලීය වේලාවන් තුලදී කුරුණෑගල සහ නිකවැරටිය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලයන්ගෙන් හෝ හක්වටුනා ඔය ව්‍යාපාරයේ උප කොට්ඨාශ නිලධාරි තැනගේ කාර්යාලයෙන් ලබාගත හැකි පෝර්මවල ටෙන්ඩර් අයැදුම් පත් සකස් කළ යුතුයි. ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේදී ඒ සඳහා ඉදිරිපත් වන ටෙන්ඩර් කරුවන් ඔවුන්ගේ ලියාපදිංචි පොත් සහ දැනට ඔවුන් කරන වාරිමාර්ග වැඩ හා, ඒවායේ වටිනාකම දක්වෙන ප්‍රකාශයක් ඔවුනට ටෙන්ඩර් කිරීමට ඉඩ ලැබිය යුතුද නැද්ද යන්න සලකා බැලීම සඳහා වාරිමාර්ග ඉංජිනේරු උප කොට්ඨාශ නිලධාරි තැන වෙත ඉදිරිපත් කළ යුතුය. පෝර්ම නිකුත් කිරීමට ප්‍රථම රුපියල් 200 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් වාරිමාර්ග ඉංජිනේරු උප කොට්ඨාශ නිලධාරි තැනගේ කාර්යාලයේ හෝ ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කොට ඒ වෙනුවෙන් ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුය.

4. මේ ටෙන්ඩරය ගැන සියළුම වැඩි විස්තර, ගිවිසුම, වැඩය පිළිබඳ සැලසුම්, විශේෂ විස්තර යනාදිය කාර්යාලයීය වේලාවන් තුලදී මකුල්පොත හක්වටුනාඔය ව්‍යාපාරයේ උප කොට්ඨාශ නිලධාරි තැනගෙන් ලබාගත හැක.

සී. අප්පදුරෙයි,
උප කොට්ඨාශ නිලධාරි,
හක්වටුනාඔය ව්‍යාපාරය.

මකුල්පොත.

9–849—69.9.26 දින අංක 14,873 දරන ගැසට් පත්‍රය

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### පොලිතින් සැපයීම

1969–70 මුදල් වර්ෂය තුලදී කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට නලාකාර පොලිතින් සහ පොලිතීන් මළු සැපයීම සඳහා පෙරාදෙනියේ කෘෂිකර්ම අධ්‍යාපන හා ගොවිපල් අංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් 69.10.19 දින ප.ව. 2.30 දක්වා ටෙන්ඩර් භාරගනු ලැබේ.

වැඩි විස්තර සඳහා මෙම ගැසට් පතේ පලවී ඇති ඉංග්‍රීසි දැන්වීම බලන්න.

ජී. ටී. ජිනේන්ද්‍රදස,
නියෝජ්‍ය අධ්‍යක්ෂ,
(කෘෂිකර්ම අධ්‍යාපන හා ගොවිපල්).

පේරාදෙනියේ දීය,
69.9.14.

9–846—69.9.26 දින අංක 14,873 දරන ගැසට් පත්‍රය

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව—ගම්පහ උප කොටස

1969–70 යන මුදල වර්ෂයේ ගම්පහ උප කොටසේ බඩු බාහිරාදිය ප්‍රවාහනය කිරීම සඳහා " බස්නාහිර කොට්ඨාශයේ කොළඹ 5 ජාවත්ත පාරේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් 1969 ඔක්තෝබර් මස 5 වෙනි දින පෙරවරු 10 වන තෙක් දෙපාර්තමේන්තුවේ රු. 15,000 කට හෝ ඊට වැඩියෙන් ලියාපදිංචිවූ කොන්ත්‍රාත් කරුවන්ගෙන් සමුපකාර සහ ග්‍රාමසංවර්ධන සමිතිවලින් ටෙන්ඩර් කැඳවනු ලැබේ.

2. ටෙන්ඩර් කිරීමට සුදුසුකම් ඇත්තේ අඩු වශයෙන් ලොරි රථ දෙකක්වත් තමා නමින් ඇති කොන්ත්‍රාත්කරුවන්ට වන අතර ටෙන්ඩර් පත් ඉල්ලුම් කරණවිට තමා නමින් ඇති වාහන ලියාපදිංචි කිරීමේ සහතිකයද ඉදිරිපත්කල යුතුය.

3. ගම්පහ/කොළඹ/කළුතර/සහ රත්නපුර වාරිමාර්ග කායර්‍යාලයන්හි ඉංජිනේරු තැනගෙන් 1969 සැප්තැම්බර් මස 17 වෙනි දින සිට 1969 ඔක්තෝබර් 2 දින දක්වා කායර්‍යාලයීය වේලාවන් තුල ලබාගතහැකි ටෙන්ඩර් පෝරම දෙපිට පතකින් යුතුව ඉදිරිපත් කල යුතුය. දිවයිනේ ඕනෑම කච්චේරියක රු. 25 ක මුදල් තැන්පත්කොට ලබාගත් රිසිට් පතක් ඉදිරිපත් කිරීමෙන් පසු ටෙන්ඩර් පෝරම නිකුත් කරනු ලැබේ.

4. වැඩි විස්තර අවශ්‍ය වෙතොත් කායර්‍යාලයීය වේලාවන්තුලදී ගම්පහ වාරිමාර්ග ඉංජිනේරු තැන වෙතින් ලබාගත හැක.

ජෝ. පරමදස්,
වාරිමාර්ග ඉංජිනේරු තැන,
ගම්පහ උප කොටස.

1969 සැප්තැම්බර් මස 17 දින.
ගම්පහ වාරිමාර්ග කායර්‍යාලයේදී.

9–830—69.9.26 දින අංක 14,873 දරන ගැසට් පත්‍රය

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### පේරාදෙණිය ගන්නෝරුවේ බීජ පරීක්ෂණාගාරයක් ගොඩනැගීම

ඉහත සඳහන් ගොඩනැගිල්ල තැනීම සඳහා පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1969.10.23 වෙනි දින පස්වරු 2.30 වනතුරු ටෙන්ඩර් භාරගනු ලැබේ.

2. නාරාහේන්පිට, පළතුරු ටින් කිරීමේ කර්මාන්තශාලා පාරේ, පිහිටි කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ, සිවිල් ඉංජිනේරු කාර්යාලයේ, උපදේශක ඉංජිනේරු තැනගෙන් ලබාගත හැකි පෝර්ම පත්‍රවල පිටපත් දෙකකින් යුක්තව ටෙන්ඩර් පත්‍ර පිළියෙල කොට ඉදිරිපත් කළ යුතුය. ඔහුගෙන් රූප සටහන්, විශේෂ විස්තර හා වෙනත් තොරතුරුද, ලබා ගත හැක.

3. ටෙන්ඩර් කරුවන් රු. 1,50,000 කට නොඅඩු ගොඩනැගිලි කොන්ත්‍රාත් ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ රජයේ දෙපාර්තමේන්තුවක හෝ ලියා පදිංචි වූ කොන්ත්‍රාත් කරුවන් විය යුතුය.

4. පහත සඳහන් ලියකියවිලි ඉදිරිපත් කළවිට 1969.10.8 වෙනි දින දවල් 12 දක්වා ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ.

(අ) 3 වැනි ඡෙදයේ සඳහන් ලියා පදිංචි කිරීමේ ලියවිල්ලක්.

(ආ) රු. 200ක ටෙන්ඩර් තැන්පත් මුදලේ කුවිතාන්සියක්.

5. ටෙන්ඩර් තැන්පත් මුදල පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ හෝ කච්චේරියක හෝ කෘෂිකර්ම අධ්‍යක්ෂවරයාගේ අංක 37 දරණ ගිණුමට බැර කරමින් කොළඹ යෝක් වීදියේ ලංකා බැංකු ශාඛාවෙහි තැන්පත් කළ යුතුය.

ඒ. සී. පෙරේරා,
කෘෂිකර්ම අධ්‍යක්ෂ වෙනුවට.

1969.9.16 වෙනි දින,
නාරාහේන්පිට, පළතුරු ටින් කිරීමේ
කර්මාන්තශාලා පාරේ, පිහිටි
කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ,
සිවිල් ඉංජිනේරු කාර්යාලයේ දීය.

9–984—69.9.26 දින අංක 14,873 දරන ගැසට් පත්‍රය

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කෘෂිකර්ම අංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් පහත සඳහන් ද්‍රව්‍ය පේරාදෙණියේ ගන්නොරුවේ පිහිටි සේවා සංස්කරණ අභ්‍යාස ආයතනයට ලබාගැනීම සඳහා 1969–70 මුදල් වර්ෂය නිමිත්තෙන් ටෙන්ඩර් පත්‍ර 1969 ඔක්තෝබර් මස 19 වෙනි දින ප. ව. 2.30 වන තෙක් භාරගනු ලැබේ.

| | පේරාදෙණියේ සේවා සංස්කරණ අභ්‍යාස ආයතනයට දළ වශයෙන් 69–70 මුදල් වර්ෂය තුළ දී උවමනා කරන ප්‍රමාණය |
|---|---|
| (1) පාන් (අවුන්ස 16ට නොඅඩු) ... ... | රා. 10,000 පමණ |
| (2) අළුත් මස් : | |
| (i) හරක් මස් (කටු රහිත) ... | රා. 3,000 පමණ |
| (ii) එළු මස් (කටු රහිත) ... ... | රා. 1,000 පමණ |
| (3) විවිධ සැපයීම් : | |
| 1. බේකන් ගෝල්ඩ, ස්ට්‍රීකි ... ... | රා. 75 පමණ |
| 2. බේකන් ගෝල්ඩ්, බැක් ... ... | රා. 30 පමණ |
| 3. සොසේජස් (මෙරට) ... ... | රා. 200 පමණ |
| 4. අළුත් බටර් ... ... | රා. 500 පමණ |
| 5. බටර් කේක් ... ... | රා. 200 පමණ |
| 6. ෆ්‍රෘට් කේක් ... ... | රා. 100 පමණ |
| 7. ජෑම් රෝල් ... ... | රා. 100 පමණ |
| 8. විස්කෝතු රාත්තලේ පැකැට් (ජින්ජර් නට්, මාරි, නයිස්, ලෙමන් පෆ්ජ්, කස්ටඩ් ක්‍රීම්, ක්‍රිස්කෝ, වේෆර්ස්, ක්‍රීම් ක්‍රැකර් ආදිය)... | පැකට් 600 පමණ |
| 9. චීස ... ... ... | රා. 50 පමණ |

(4) රෙදි ඇපිල්ලීම :

මේස රෙදි, ඇඳ ඇතිරිලි, කොට්ට උර, අත්පිසිනා කඩ, දූවිලිපිසිනාකඩ, පෙරවැසුම්, කනප්පු රෙදි, ජනෙල් තිර, වීදුරු බඩු පිසින තුවා, ටරේ රෙදි, සහ කුස්සියේ පාවිච්චි කරන තුවා.

2. පේරාදෙණියේ ගන්නොරුවේ පිහිටි සේවා සංස්කරණ අභ්‍යාස ආයතනයෙන් පෝරම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ඒවායෙහි එවිය යුතුයි. සියළුම ටෙන්ඩර් පත්‍ර ලියුම් කවරයක දමා සීල් තබා, " සභාපති, ටෙන්ඩර් මණ්ඩලය, කෘෂිකර්ම අංශය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, පේරාදෙණිය " යනුවෙන් එහි පිට ලියා එහිම මුදුන් කෙළවරේ, " පේරාදෙණියේ සේවා සංස්කරණ අභ්‍යාස ආයතනයට දලුන් බටර් සැපයීම " (වෙනත් ද්‍රව්‍යයක් නම් ඒ ද්‍රව්‍යයෙහි නම යෙදිය යුතුයි) යන්න ලියා එවිය යුතුයි.

3. ටෙන්ඩර් පත්‍ර භාර ගන්නා අවසාන දින දවල් 12 වන තෙක් ටෙන්ඩර් පෝර්ම දෙනු ලැබේ. ඒ දීම කරනු ලබන්නේ එක් එක් ටෙන්ඩර් පත්‍රයක් වෙනුවෙන් රුපියල් 10ක් තැන්පත් කළ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ පසුවය. මේ තැන්පත් කිරීම පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කායර්‍යාලයේ හෝ ඕනෑම කච්චේරියක කළ යුතුයි. පොරොන්දු පත්‍රයක් අත්සන් කළ පසු ටෙන්ඩර් තැන්පත් මුදල ආපසු දෙනු ලැබේ. පත්කර ගනු ලැබූ ටෙන්ඩර් කරුවාට ඔහුගේ ටෙන්ඩර් පත්‍රය පිළිගත් බව දන්වා දින 7 ක් ඇතුලත දී අවශ්‍ය ඇපය තැබීමට හෝ ගිවිසුම් පත්‍රය අත්සන් කිරීමට හෝ නොහැකිවුවහොත් ඔහුගේ ටෙන්ඩර් තැන්පත් මුදල රාජසන්තක වෙනවාත් හැර, ඔහුගේ නම ආණ්ඩුවේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත් කරුවන්ගේ ලැයිස්තුවට ඇතුලත් වෙන්නට ඉඩ තිබේ.

4. ටෙන්ඩර් පත්‍ර ලියා පදිංචි කළ තැපැලෙන් එවිය යුතුයි. ටෙන්ඩර් පත්‍ර ලියාපදිංචි කළ තැපැලෙන් නොඑවුවහොත් ටෙන්ඩර්කරුවන් හෝ ඔහුන්ගේ නියෝජිතයින් විසින්, පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කෘෂිකර්ම අංශයේ ටෙන්ඩර් කටයුතු කරන ලිපිකරුට ඒවා අතින් ම භාර දිය යුතුයි. ටෙන්ඩර් බහාලන ලද කවරයෙහි, " පේරාදෙණියේ සේවා සංස්කරණ අභ්‍යාස ආයතනයට ......................(ද්‍රව්‍යයේ නම) සැපයීම" යන්න ලියා ටෙන්ඩර්කරුවාගේ නම සහ ලිපිනය ද ඇතුළත් කළ යුතුයි. ලියා පදිංචි කළ තැපැලෙන් එවන ලද ටෙන්ඩර් පත්‍ර ලැබුණ බව ඒවා විවෘත කරන දිනයේ දී සියළුම ටෙන්ඩර්කරුවන්ට දන්වනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර භාරගැනීම නැවැත්වීමට නියමිත දින සිට දින 4 ක් ඇතුළත යම් ටෙන්ඩර්කරුවෙකුට එවැනි දැන්වීමක් නොලැබුණහොත්, ඔහු පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ, කෘෂිකර්ම අංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිගෙන් ඒ ගැන කරුණු වහාම විමසිය යුතුයි.

5. ටෙන්ඩර්කරුවන්ට වුවමනා නම් ටෙන්ඩර් පත්‍ර විවෘත කරන වේලාවේ දී ඉදිරියෙහි සිටීමට අවසර දෙනු ලැබේ. ටෙන්ඩර් භාර ගැනීම නැවැත්වීමට නියමිත ඉහත කී දිනයේ දී ඉහත කී වේලාවට පේරාදේණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කෘෂිකර්ම අංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිගේ කායර්‍යාලයේ දී ඒවා විවෘත කරනු ලැබේ.

6. නියමිත පෝර්මයේ ලියා නැති, නැතහොත් එහි නියමිත කොන්දේසි සම්පූර්ණ වශයෙන් ඉටු වී නැති කිසිම ටෙන්ඩර් පත්‍රයක් ටෙන්ඩර් පත්‍රයක් ලෙස සලකනු නොලැබේ. ටෙන්ඩර් ප්‍රමාණයන් සහ ගණන් පැහැදිලි ලෙස තීන්ත වලින් ලකුණු කළ යුතුවාත් හැර, ඒවා සම්බන්ධයෙන් යම්කිසි වෙනසක් කළහොත්, ඒ තැන්වල ටෙන්ඩර්කරුගේ කෙටි අත්සන තැබිය යුතු වේ.

7. ටෙන්ඩර්කරුවන් තම ලිපිනය පැහැදිලි ලෙස අකුරෙන් ටෙන්ඩර් පත්‍රයෙහි ලිවිය යුතුයි.

8. ටෙන්ඩර් පත්‍රයේ සඳහන් වූද, පිළිගනු ලැබුවා වූ ද, දේවල මුළු වියදමෙන් සියයට 5ක ඇප මුදලක් කෘෂිකර්ම අධ්‍යක්ෂගේ නමින් තැන්පත් කිරීමටත්, පොරොන්දු පත්‍රයක් අත්සන් කිරීමටත් පත්කර ගනු ලැබූ ටෙන්ඩර්කරුවාට නියම කරනු ලැබේ. මේ මුදල ආපසු දෙනු ලබන්නේ කොන්ත්‍රාත්තුව ඉටු කළ පසුවය. මේ කොන්ත්‍රාත්තුව ඉටු නොකළහොත් ඔහුගේ ඇප මුදල රාජසන්තක වෙනවා පමණක් නොව, ඔහුගේ නම ආණ්ඩුවේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ ලැයිස්තුවට ඇතුළත් වෙනවා ද ඇත.

9. ගිවිසුම් පත්‍රයට ඇලවිය යුතු මුද්දරවල වටිනාකම පත්කර ගනු ලැබූ ටෙන්ඩර්කරුවා විසින් ගෙවිය යුතුයි. ටෙන්ඩර් පත්‍ර භාර ගැනීම නැවැත් වූ දින සිට, සති තුනක් යනතුරු ටෙන්ඩර්කරුවන් තම ටෙන්ඩර් පත්‍ර සැළකිල්ලට භාජන කිරීමට ඉඩ තැබිය යුතුයි.

10. යම්කිසි ටෙන්ඩර් පත්‍රයක් හෝ සියළුම ටෙන්ඩර් පත්‍ර හෝ ප්‍රතික්ෂේප කිරීමේත්, ටෙන්ඩර් පත්‍රයක යම්කිසි කොටසක් පිළිගැනීමේත් බලය කෘෂිකර්ම අධ්‍යක්ෂ වෙත තබා ගනු ලැබේ.

11. මේ කොන්ත්‍රාත්තුව යටතේ වූ වැඩ කරවා ගැනීමට, පුහුණු හා නුපුහුණු හා දෙවර්ගයේම ලාංකික කම්කරුවන් පමණක් යෙදවීමට කොන්ත්‍රාත්කරු මෙයින් එකඟ වෙන අතර, ඔවුහු පමණක් එසේ නියුක්ත කරනු ලබන්නාහ. ඒ කම්කරුවන් හැකි තරම් දුරට බඳවා ගනු ලබන්නේ, වැඩය කෙරෙන ප්‍රදේශයේ සිටින අය අතුරිනි.

කොන්ත්‍රාත්තුවේ මේ කොන්දේසිය සපුරාලීමට කොන්ත්‍රාත්කරුවා යම්කිසි විධියකින් අසමත් වුවහොත්, කොන්ත්‍රාත්තුව අවලංගු වීමට එය තුඩු දෙනවා ඇත. එහෙත් කොන්ත්‍රාත්තුවට එළැඹෙන ලද නිලධාරියා විසින් විශේෂ අවස්ථාවල දී කෘෂිකර්ම හා ආහාර අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්වරයාගේ එකඟත්වය ඇතිව, නිශ්චිතව ලියවිල්ලකින් එකී නිලධාරියා විසින් අනුමත කරන ලද ලාංකික නොවන කම්කරුවන් නියුක්ත කරවීමට කොන්ත්‍රාත්කරුට බලය දිය හැක.

එවැනි ලිඛිත බලයක් හා එකඟත්වයක් නොමැතිව ලාංකික නොවන කම්කරුවන් යෙදවීම තහනම් වන අතර, එය කොන්ත්‍රාත්තුව කඩ කිරීමක් ලෙස සලකනු ලැබේ.

මේ කොන්ත්‍රාත්තුවේ අභිප්‍රාය සඳහා " ලාංකික " යන්නෙන් පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කිරීමෙන් හෝ ලංකාවේ රටවැසියෙකු අදහස් කෙරෙණ අතර. එවැන්නෙක් එකී පාඨයට ඇතුලත් වෙයි.

මේ කොන්ත්‍රාත්තුවේ කටයුතු සඳහා යොදවනු ලබන සැම කම්කරු කොට්ටාශයකටම සාධාරණ වූද, කම්කරුවනට වේතන ගෙවීම සම්බන්ධයෙන් දැනට බල පවත්වන සහ මින් මතු ක්‍රියාත්මක විය හැකි සියළුම රෙගුලාසිවලට අනුකූල වූද වේතනයක් ගෙවීමට කොන්ත්‍රාත්කරු මෙයින් එකඟවෙයි.

කොන්ත්‍රාත්කරු විසින් එකී වැඩ කෙරෙහි යොදවනු ලැබූ කම්කරුවන් හා සම්බන්ධ ඔහුගේ පත පොත, චැක්රෝල් පොත්, පෙරට්වූ පොත් සහ අනිකුත් ලිපි ලේඛන පරීක්ෂාකර බැලීමට කෘෂිකර්ම අධ්‍යක්ෂ විසින් විධිමත්ව බලය දෙනු ලැබූ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ඕනෑම නිලධාරියකුට ඒවා පරීක්ෂා කිරීමට ඉඩදීමට කොන්ත්‍රාත්කරු බැඳී සිටී.

12. කොන්ත්‍රාත්කරුට භාර දිය යුතු සියළුම දැන්වීම් ඔහුගේ අතට දුනහොත් හෝ ඔහු විසින් සඳහන් කර ඇති ලිපිනයට තැපැලෙන් යැව්වහොත් හෝ ඔහුගේ අතටම භාර දුන්නා ලෙස සළකනු ලැබේ.

13. 1934 අංක 19 දරණ කම්කරු වන්දි ආඥා පනත (117 වැනි පරිච්ඡේදය) යටතේ තමාගේ යම්කිසි සේවකයෙකු වෙනුවෙන් වන්දි ඉල්ලා එවන ඉල්ලුම් පත් ගැන වගකීමෙන් කොන්ත්‍රාත්කරුවා විසින් ආණ්ඩුව නිදහස් කිළ යුතුයි.

14. වැඩට ගැනීමට නුසුදුසු යයි කල්පනා කරනු ලබන යම්කිසි කම්කරුවෙකු කොන්ත්‍රාත්කරුවා විසින් වැඩට ගැනීම ගැන විරුද්ධවීමේ බලය ආණ්ඩුව වෙත තබා ගනු ලැබේ.

15. වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන් පිළිබඳ ආණ්ඩුවේ ලැයිස්තුවේ නම් තනිව හෝ ඒ ලැයිස්තුවේ නම සඳහන් වෙන කෙනෙකුගේ නම සමඟ හෝ නම ඇතුලත් වූ හෝ තමාට සැහේයයි පෙනී යන හේතු පිට කෘෂිකර්ම අධ්‍යක්ෂ තැන විරුද්ධ වන හෝ කිසිවෙකු සමඟ කොන්ත්‍රාත්තුව කට බැඳෙනු නොලැබේ.

16. වැඩි විස්තර පේරාදෙණියේ ගන්නොරුවේ සේවා සංස්කරණ අභ්‍යාස ආයතනයේ කෘෂිකර්ම නිලධාරී තැනගෙන් දැනගත හැකිය.

පී. ටී. ජිනේන්ද්‍රදාස,
නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ,
(කෘෂිකර්ම අධ්‍ය. හා ගොවිපොලවල්)

1969.9.15 වෙනි දින,
පේරාදෙණියේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ දී ය.

9–937—69.9.26 දින අංක 14,873 දරන ගැසට් පත්‍රය

---

## ආහාර දෙපාර්තමේන්තුව

### 1969–70 තුළදී රත්නපුර දිස්ත්‍රික්කයේ ආහාර දෙපාර්තමේන්තුවට අයත් සැපයීම් ස්ථානවල ආහාර ද්‍රව්‍ය බෑම, පැටවීම හා ප්‍රවාහනය

69.11.1 සිට 70.9.30 දක්වා කාලය තුළදී පහත සඳහන් සැපයීම් ස්ථානවල ප්‍රවාහන හා කම්කරු සේවාවන් ඉටු කිරිම සඳහා ටෙන්ඩර් 69.10.11 දින ප.ව. 2.30 දක්වා කොළඹ 2, යූනියන් පෙදෙසේ අංක 330 දරණ ස්ථානයේ, ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුවේ ටැන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් භාරගනු ලැබේ.

රත්නපුර දිස්ත්‍රික්කය—ඕපනායක, කහවත්ත, රත්නපුරය යන සැපයීම් ස්ථානවල.

2. තමන් සන්තකව ලොරි රථ ඇති හෝ අවශ්‍ය වූ විට ලොරි ප්‍රමාණවත් සංඛ්‍යාවක් සැපයීමට හැකි බඩු පටවන්නන්ගෙන් පමණක් ටෙන්ඩර් භාරගනු ලැබේ. තවද, ඔවුන්ට පැවරෙන ප්‍රවාහන කොන්ත්‍රාත්තුව තමාගේ හෝ තමාට ලබාගත හැකි ලොරි වලින් ඉටු කිරීමට ඔවුන්ට හැකියාව තිබිය යුතුය.

3. කොළඹ 2, යූනියන් පෙදෙසේ අංක 330, දරණ ස්ථානයේ ආහාර කොමසාරිස් කාර්යාලයෙන් හෝ රත්නපුර දිස්ත්‍රික්කයේ නියෝජ්‍ය ආහාර පාලකගෙන් 69.10.7 දින දහවල් 12 දක්වා රු. 100 ටැන්ඩර් තැන්පත් මුදලක් ගෙවා ඉහත දෙවෙනි ඡේදයේ සඳහන් කරුණු පිළිබඳ සාක්ෂි ඉදිරිපත් කොට ලබාගත හැකි ෆෝර්මවල පිටපත් දෙකකින් යුතුව ටැන්ඩර් ඉදිරිපත් කළ යුතුයි. ටැන්ඩර් කරුවන් විසින් එක් එක් සැපයීම් ස්ථානය වෙනුවෙන් වෙන වෙනම ටැන්ඩර් ඉදිරිපත් කළ යුතුය. වැඩි විස්තර ආහාර කොමසාරිස් කාර්යාලයෙන් හෝ රත්නපුර කච්චේරියෙන් ලබාගත හැක.

බී. පී. වී. ඒ. ජේ. පී. සේනාරත්න,
ආහාර කොමසාරිස්.

1969.9.16 දින,
කොළඹ 2, ආහාර දෙපාර්තමේන්තුවේ දිය.

9–919—69.9.26 දින අංක 14,873 දරන ගැසට් පත්‍රය

---

## ජාතික නිවාස දෙපාර්තමේන්තුව

### දෙහිවල නිවාස ක්‍රමයේ සාප්පු සහ තට්ටු නිවාස ඉදිකිරීම

දෙහිවල නිවාස ක්‍රමයේ සාප්පු සහ තට්ටු නිවාස ඉදිකිරීම සඳහා විද්‍යාත්මක පර්යේෂණ සහ නිවාස අමාත්‍යාංශයේ, ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1969 ඔක්තෝබර් 31 දින පෙරවරු 10 තෙක් ටෙන්ඩර් පත්‍ර බාරගනු ලබන අතර, එදින එකී වේලාවට ඒවා විවෘත කරන විට ටෙන්ඩර් කරුවන්ට පැමිණ සිටිය හැක.

පිටපත් දෙකකින් යුත් ටෙන්ඩර් පත්‍ර මෙම දෙපාර්තමේන්තුවේ අධිකාරී ඉංජිනේරු තැනගෙන් ලබාගත හැකිවාක් මෙන්ම අවශ්‍ය වෙනත් විස්තර ඔහුගෙන් ලබාගත හැක.

රජයේ වැඩ දෙපාර්තමේන්තුව, වාරිමාර්ග දෙපාර්තමේන්තුව, රජයේ සංයුක්ත මණ්ඩල, රජයේ වෙනත් දෙපාර්තමේන්තුවල ඉදිකිරීමේ වැඩ සඳහා රු. 10,00,000 කට හෝ ඊට වැඩි ගණනකට ලියාපදිංචි වී ඇති කොන්ත්‍රාත්කරුවන් ටෙන්ඩර් කිරීමට සුදුසුසෝ වෙති. මෙසේ ලියාපදිංචි වීමේ සහතිකය සහ මෙම දෙපාර්තමේන්තුවේ සරප් තැන වෙත රු. 250 ක මුදලක් තැන්පත් කර ඒ සඳහා කුවිතාන්සියක් ඉදිරිපත් කරන ටෙන්ඩර්කරුවන්ට 1969 ඔක්තෝබර් 27 දින දවල් 12 වනතෙක් ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ.

ඩී. රාජේන්ද්‍රා,
ජාතික නිවාස කොමසාරිස්.

1969 සැප්තැම්බර් 12 දින,
ජාතික නිවාස දෙපාර්තමේන්තුව,
තැ. පෙ. 544,
ශ්‍රීමත් සිත්තම්පලම් ගාඩිනර් මාවත,
කොළඹ 2.

9–887—69.9.26 දින අංක 14,873 දරන ගැසට් පත්‍රය

## ගොවිජන සේවා දෙපාර්තමේන්තුව

**කුරුණෑගල දිස්ත්‍රික්කයේ යක්විල පිහිටි පූර්ව නිර්මිත නි. මි. යෝ. ක්‍රෑ. ගබඩාව ගැලවීම, ප්‍රවාහනය කිරීම හා එය මොණරාගල දිස්ත්‍රික්කයේ මැදගම නැවත ඉදිකිරීම**

කුරුණෑගල දිස්ත්‍රික්කයේ යක්විල පිහිටි පූර්ව නිර්මිත නි.මි.යෝ.ක්‍රෑ. ගබඩාව ගලවා, ප්‍රවාහණය කර එය මොණරාගල දිස්ත්‍රික්කයේ මැදගම නැවත සවි කිරීම සඳහා ටෙන්ඩර් පත් 1969 ඔක්තෝබර් මස 16 වෙනි දින සවස 2.30 දක්වා කොළඹ 7, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවතේ අංක 42 දරණ ස්ථානයේ පිහිටි ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මංඩලයේ සභාපති විසින් භාරගනු ලැබේ.

2. රුපියල් 250 ක් (රුපියල් දෙසිය පණහක්) තැන්පත්කර ඒ සඳහා ලබා ගන්නා ලද කුවිතාන්සි ඉදිරිපත් කර කොළඹ 7, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවතේ අංක 42 දරණ ස්ථානයේ ගොවිජන සේවා කොමසාරිස් ගෙන් ලබා ගන්නා ලද ආකෘති පත්‍රවල පිටපත් දෙකකින් යුක්තව ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය. කොළඹ 7, හෝර්ටන් පෙදෙසේ අංක. 60 දරණ ස්ථානයේ ගණකාධිකාරිට හෝ කොළඹින් බැහැර ඕනෑම කච්චේරියක මුදල් තැන්පත් කළ හැක.

3. රුපියල් 25,000 ක් හෝ ඊට වැඩි ගොඩනැගිලි ඉදිකිරීමේ වැඩ සඳහා රජයේ බලය ලත් කොන්ත්‍රාත්කරුවනට පමණක් " කොන්ත්‍රාත් කරුවන්ගේ සටහන් පොත " ඉදිරිපත් කිරීමෙන් 1969 ඔක්තෝබර් මස 15 වෙනි දින දවල් 12 වන තෙක් ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරනු ලැබේ. තැපැලෙන් ටෙන්ඩර් ආකෘති පත්‍ර ඉල්ලා සිටින ටෙන්ඩර්කරුවන් විසින් ඒවා ලබාගෙන අවසාන දිනට ප්‍රථම එවීමට හැකිවන පරිදි කල් වේලා ඇතිව එසේ කළ යුතුය.

4. වැඩි විස්තර කොළඹ 7, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවතේ අංක 42 දරණ ස්ථානයේ ගොවිජන සේවා කොමසාරිස්ගෙන් ලබා ගත හැකිය.

වී. තී. නවරත්න,
ගොවිජන සේවා කොමසාරිස් වෙනුවට.

1969 සැප්තැම්බර් මස 26 වෙනි දින,
කොළඹ 7,
42, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවතේ,
ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ දීය.

9–944—69.9.26 දින අංක 14,873 දරන ගැසට් පත්‍රය

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව—මහියංගන උප කොට්ඨාශය

1969–70 වර්ෂයේ මහියංගන උප කොට්ඨාශයේ ගබඩා ප්‍රවාහනය කිරීම සඳහා ටෙන්ඩර් 1969 ඔක්තෝබර් මස 17 වෙනි සිකුරාද දවල් 12 තෙක් බණ්ඩාරවෙල ඌව කොට්ඨාශයේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් භාරගනු ලැබේ. ටෙන්ඩර් විවෘත කිරීම එවේලේම එහිදී සිදුකෙරේ.

2. වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රු. 75,000 කට හෝ ඊට වැඩි ගණනකට ලියා පදිංචි වූ කොන්ත්‍රාත්කරුවන්, සමුපකාර සමිති හා ග්‍රාම සංවර්ධන සමිති වලට පමණක් මෙම වැඩය සඳහා ටෙන්ඩර් කළ හැකිය.

3. මේ සඳහා ඉදිරිපත් වන ටෙන්ඩර් කරුවන්ට යටත් පිරිසෙයින් ලොරි තුනක් සහ පාම් ට්‍රැක්ටර්යක් තිබිය යුතු අතර, ඔවුන් විසින් ඒවායේ ලියාපදිංචි බලපත්‍ර ඉදිරිපත් කල යුතුය.

4. 1969 ඔක්තෝබර් මස 16 වෙනි බ්‍රහස්පතින්ද දහවල් 12 දක්වා මහියංගන, බදුල්ල හෝ මොණරාගල වාරිමාර්ග ඉංජිනේරුවරුන්ගේ කායඕාල වලින් ලබාගත හැකි ආකෘති පත්‍ර වල ටෙන්ඩර් දෙපිටපතකින් යුතුව ඉදිරිපත් කළ යුතුය. ටෙන්ඩර් ආකෘති ඉල්ලුම් කිරීමේදී ඒ සඳහා ඉදිරිපත් වන ටෙන්ඩර්කරුවන් ඔවුන්ගේ ලියා පදිංචි පොත් සහ දනට ඔවුන් කරන වාරිමාර්ග වැඩ සහ ඒවායේ වටිනාකම දක්වෙන ප්‍රකාශනයක්, ඔවුන්ට ටෙන්ඩර් කිරීමට ඉඩ දිය යුතුද නැද්ද යන්න සලකා බැලීම සඳහා වාරිමාර්ග ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළ යුතුය. ටෙන්ඩර් ආකෘති නිකුත් කිරිමට ප්‍රථම රු. 100 ක තැන්පත් මුදලක් එම වාරිමාර්ග ඉංජිනේරුතැනගේ කායඕාලයේ හෝ ඕනෑම කච්චේරියක තැන්පත් කොට ඒ සඳහා ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කල යුතුය.

5. මේ සම්බන්ධයෙන් ඕනෑම විස්තරයක් කායඕාල වේලාවන් තුළදී මහියංගන වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කායඕාලයෙන් ලබාගත හැකිය.

එස්. සිවලිංගම්,
වාරිමාර්ග ඉංජිනේරු,
මහියංගන උප කොට්ඨාශය.

1969 සැප්තැම්බර් මස 14 වෙනි දින,
මහියංගන වාරිමාර්ග කායඕාලයේ දීය.

9–915—69.9.26 දින අංක 14,873 දරන ගැසට් පත්‍රය

---

## ලංකා ගමනාගමන මණ්ඩලය

තිරිංග තෙල් සැපයීම සඳහා සීල් තැබූ ටෙන්ඩර් පත්‍ර, කොළඹ 5, කිරුළ පාරේ අංක 200 වෙනි ස්ථානයෙහි වූ ලංකා ගමනාගමන මණ්ඩලීය ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් 1969 නොවැම්බර් මස 26 වන බදාදා පෙරවරු 10 වන තෙක් භාරගනු ලැබේ.

ටෙන්ඩර් පත්‍ර නියමිත පෝර්මවල ලියා අනු පිටපතකින්ද යුක්ත කොට එවිය යුතුය. එම පෝරම කොල මාගේ කායඕාලයෙන් 1969 නොවැම්බර් මස 25 වෙනිද දහවල් 12 වනතෙක් ලබාගත හැක. ඒවා නිකුත් කරනු ලබන්නේ ඉහත සඳහන් ලිපිනයෙහි පිහිටි ලංකා ගමනාගමන මණ්ඩලයේ ප්‍රධාන ගිණුම් නිලධාරි තැන වෙත මුදලින් රු. 100 ක් තැන්පත් කොට ඒ සඳහා ලබාගත් කුවිතාන්සිය මා වෙත ඉදිරිපත් කළ විටය.

වැඩි විස්තර මගේ කායඕාලයෙන් ලබාගත හැක.

ප්‍රධාන සම්පාදක නිලධාරි තැන,
ලංකා ගමනාගමන මණ්ඩලය.

200, කිරුල පාර,
කොළඹ 5.

9–962—69.9.26 දින අංක 14,873 දරන ගැසට් පත්‍රය

---

## රජයේ වැඩ දෙපාර්තමේන්තුව

කලවානේ මැදි බෙහෙත් හල සහ මෘතශරීරාගාරය ආදිය තැනීම සඳහා වූ ටෙන්ඩර් පත්, කොළඹ 1, රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කායඕාල යේ ටෙන්ඩර් මණ්ඩලයෙහි සභාපතිවරයා විසින් වර්ෂ 1969 ඔක්තෝබර් මස 28 වැනි අඟහරුවාද පෙරවරු 11 වන තෙක් භාර ගනු ලැබේ.

2. රත්නපුරයේ රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ විධායක ඉංජිනේරු වරයාගෙන් ලබාගත් ආකෘති පත්වල ටෙන්ඩර් පත් පිළියෙල කොට අනු පිටපතක් ද සහිතව ඉදිරිපත් කළ යුතුයි. මේ පිළිබඳ සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකි වන අතර, සැලැස්ම ද ඔහුගේ කායඕාල යේදී බලා ගැනීමට පිළිවන.

3. රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 70,000 කට නොඅඩු ගණනකට ලියා පදිංචි වූ කොන්ත්‍රාත් කරුවන් පමණක් ඉහත සඳහන් ඉංජිනේරුවරයා වෙත ටෙන්ඩර් පත් තැන්පත් මුදල වන රු. 100 ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය වර්ෂ 1969 ඔක් තෝබර් මස 11 වැනි සෙනසුරාද පස්වරු 4.30 ට පෙර ඉදිරිපත් කළ විට මේ සඳහා ටෙන්ඩර් පත් එවීමට සුදුසු වනවා ඇත. ටෙන්ඩර් පත් සඳහා ප්‍රමාද වී අයදුම් කරන්නන් විසින් එක් දිනකට හෝ ඉන් අඩකට රු. 10 බැගින් ආපසු ගෙවනු නොලබන පමා වීමේ ගාස්තුවක් නිකුත් කරන නිලධාරි තැනට ගෙවා ඒ සඳහා කුවිතාන්සියක් ලබාගත යුතුයි.

4. ටෙන්ඩර් පත් නිකුත් කිරීමට පෙර අයදුම් කරු විසින් කොන්ත්‍රාත් කරුගේ සටහන් පොත හෝ පිරික්සුම් ලිපිය ඉදිරිපත් කළ යුතු වේ.

5. ටෙන්ඩර් ලබා ගැනීමට බලාපොරොත්තු වන අය, ටෙන්ඩර් තැන්පත් මුදල් කුවිතාන්සිය ඉදිරිපත් කරන අවස්ථාවේදී දනට කරගෙන යන වැඩ පිළිබඳ සියලු විස්තර අඩංගු කළ යුතු ආකෘති පත්‍ර, නිකුත් කරන නිලධාරියාගෙන් ලබාගෙන නියමිත ටෙන්ඩර් මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය.

6. ටෙන්ඩර් තැන්පත් මුදල කොළඹ කොටුවේ රජයේ වැඩ දෙපාර්ත මේන්තුවේ ප්‍රධාන කායඕාලයේදී හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක දී හෝ තැන්පත් කළ හැක.

වී. ගුණරත්නම්,
රජයේ වැඩ අධ්‍යක්ෂ වෙනුවට.

ර.වැ.දෙ. ප්‍රධාන කාර්යාලය,
කොළඹ 1.
1969.9.19.

9–990—69.9.26 දින අංක 14,873 දරන ගැසට් පත්‍රය

යොමුව : පීඑස්සී 2/25/69.

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

### ඒසීඩී බෝතල ආදිය සැපයීම සඳහා ටෙන්ඩර් පත්‍ර

සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ විසින් ඒසීඩී බෝතල ආදිය සැපයීම සඳහා පහත සඳහන් උපලේඛනයේ ප්‍රකාශිත අයවලුන්ගෙන් ටෙන්ඩර් පත්‍ර කැඳවනු ලැබේ :—

(i) අංක 14,843 හා 28.2.69 වැනි දිනැති රජයේ ගැසට් පත්‍රයේ පළකොට ඇති නාමාවලියෙහි සඳහන් මා විසින් ලේඛනගත කල වෙළඳ සමාගම්,

(ii) ලන්ඩනයේ රාජ්‍ය නියෝජිතයින්,

(iii) ඉන්දියාවේ කල්කටා නියෝජිතයින්,

(iv) ඕස්ට්‍රියාව, පෝලන්තය, සෙකෝස්ලෝවැකියාව, මහජන චීන සමූහාණ්ඩුව, ස.සෝ.රු.ස., යුගෝස්ලේවියාව, එක්සත් අරාබි ජනරජය, බල්ගේරියාව, ජර්මානු ප්‍රජාතන්ත්‍රවාදී ජනරජය, හංගේරියාව හා රුමේනියාව.

2. සැපයීම් සඳහා ටෙන්ඩර් පත්‍ර, කොළඹ, සෙලින්කෝ මන්දිරයේ, තැ.පෙ. 584, අමාත්‍යාංශ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් 1969 නොවැම්බර් 25 දින පෙරවරු 10 තෙක් භාරගනු ලැබේ.

3. මෙම ටෙන්ඩරයට අදල, ටෙන්ඩර් ආකෘති, කොන්දේසි ආදිය නිකුත් කරනු ලබන්නේ,

(i) මා විසින්ම හෝ විදේශවල ඇති ලංකා නියෝජිතයන් මගින්, ලේඛණගත කොට ඇති වෙළඳ සමාගම්වලටත්,

(ii) 1 වැනි ඡේදයේ iv වැනි උප ඡේදයේ සඳහන් රාජ්‍යයනට ,ඔවුන්ගේ ලංකා නයෝජතයන් මගනුත් පමණකි.

4. ඉහත 2 වැනි ඡේදයේ සඳහන් දින නියමිත වේලාවට නියමිත ස්ථානයේදී, ටෙන්ඩර් පත්‍ර විවෘත කරන අවස්ථාවේදී, ටෙන්ඩර්කරුවන්ට හෝ ඔවුන්ගේ අනුමත නියෝජිතයින්ට පැමිණීමට ඉඩදෙනු ලැබේ.

5. මේ සම්බන්ධ වැඩි විස්තර, කොළඹ 10, ඩීන්ස් පාරේ අංක 355 හි, සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ (සැපයීම්) ගෙන් ලබාගත හැක.

එන්. කේ. පී. විජයසිංගම්,
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙනුවට.

කොළඹ,
1969 සැප්තැම්බර් 15 වන ද.

SCHEDULE REFERRED TO

| *Item No.* | *Description* | *Estimated requirements* | *Packing required* |
|---|---|---|---|
| 1 .. | Sterile A.C.D. bottles—Siliconized with vacuum containing 120 ml. A.C.D. Solution B (U.S.P.) for 480 ml. blood | 60,000 Bottles | In cartons of 12 bottles |
| 2 .. | Disposable Plastic Blood Administration Sets—Sterile and Non-Pyrogenic, with 18 G × 1 1/2″ Luer cone needle, complete with air way | 60,000 Sets | In cartons of 12 sets |
| 3 .. | Disposable Sterile Plastic Donor Sets with 17 G 2″ donor needle, luer cone, and 15G puncture needle | 50,000 Sets | do. |
| 4 .. | Sterile Dry Vacuum bottles (for Plasma or Serum) capacity 600 ml. | 5,000 Bottles | In cartons of 12 bottles |

9–918—69.9.26 දින අංක 14,873 දරන ගැසට් පත්‍රය

---

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

### මහජන සෞඛ්‍ය ඉංජිනේරු අංශය

කොළඹ, තැ.පෙ. අංක 584 සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වරකාපොල නව රෝහලේ පල්දෝරු ක්‍රමය I වෙනි පියවර ඉදි කිරීම සඳහා මුද්‍රා තබන ලද ටෙන්ඩර් පත් 1969 ඔක්තෝම්බර් මස 28 වන අඟහරුවාද පෙරවරු 10 වන තෙක් භාරගනු ලැබේ.

2. කොළඹ 7, පිහිටි මහජන සෞඛ්‍ය ඉංජිනේරු අංශයේ, ප්‍රධාන මහජන සෞඛ්‍ය ඉංජිනේරු තැනගේ කාර්යාලයෙන් ලබාගත හැකි පෝරම් වල පිටපත් දෙකකින් යුතුව ටෙන්ඩර් ඉදිරපත් කළ යුතුය. ටෙන්ඩර් පත්‍රිකා ප්‍රධාන මහජන සෞඛ්‍ය ඉංජනේරු තැන විසින් 1969 ඔක්තෝම්බර් මස 16 වන බ්‍රහස්පත්න්ද පස්වරු 4 වන තෙක් නිකුත් කරනු ලබන්නේ පල්දෝරු ක්‍රම ඉදි කිරම සඳහා මහජන සෞඛ්‍ය ඉංජනේරු අංශයේ ''ඊ'' කොටස යටතේ ල්යාපදිංචි වී සිටින කොන්ත්‍රාත් කරුවන්ට පමණි. ටෙන්-ඩර් සත්‍රිකා ලබා ගැනීමට පෙර ප්‍රධාන මහජන සෞඛ්‍ය ඉංජිනේරු තැන ගේ නමට අය වන ලෙස කොළඹ, ලංකා බැංකුවේ හෝ කොළඹින් පිටත නම් කච්චේරියක හෝ රුපියල් 100 ක මුදලක් තැන්පත් කොට ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුය.

3. ටෙන්ඩර් පත් ලබා ගැනීම වෙනුවෙන් මුදල් තැන්පත් කිරීමෙන් නිදහස් කොට ඇති පහත සඳහන් සංගම් වලට ද ටෙන්ඩර් පත් නිකුත් කරනු ලැබේ :—

(අ) සමූපකාර තොග වෙළඳ ආයතනය,

(ආ) ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂ විසින් අනුමත කොට ඇති ග්‍රාම සංවර්ධන සමිති,

(ඇ) සමුපකාර සංගම් රෙජිස්ට්‍රාර් තැන විසින් ලියා පදිංචි කොට ඇති සමුපකාර සංගම්.

4. ටෙන්ඩර් පත් කොළඹ, සෙලින්කෝ මන්දිරයේ 5 වැනි මාලයේ සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩල කාර්යාලයේ තබා ඇති පෙට්ටියේ තැන්පත් කළ යුතුය. නැතහොත් ලියා පදිංචි කළ තැපැලෙන් යැවිය යුතු ය. ටෙන්ඩර් කරුවන් හෝ ඔවුනගෙ න්යෝපතයන් හෝ විසින් මුද්‍රා තබන ලද ටෙන්ඩර් ඉහත සඳහන් ස්ථානයේ ටෙන්ඩර් පත් පිළිගැනමේ බලය ලබා ඇත් න්ළධරයෙකුට භාර දිය හැකි ය. සේවයේ විස්තර ද, ටෙන්ඩර් කංුවන්ගෙ නම් සහ ලිපිනය ද, කවරයේ සඳහන් කළ යුතුය. ටෙන්ඩරය භාරගත් බවට ඉහත සඳහන් නිළධාරි තැන විසින් කුවිතාන්සියක් නිකුත් කරනවා ඇත.

5. පළමුවැනි ඡේදයේ සඳහන් ස්ථානයේ දී නියමිත දින එකී වේලාවට කෙරෙන ටෙන්ඩර් විවෘත කිරමේ දී සැම ඉල්ලුම් කරුවෙකුටම පෙනී සිටීමට අවසර ලැබෙනවා ඇත. ටෙන්ඩර් කංුවන්ගෙ නම සහ මිළ ගණන් පැමිණ ස්ටන ටෙන්ඩර් කරුවන් ඉදිරියෙහ් දී කියවනු ලැබේ. ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමන්ගෙ අනුමැතය අනුව කිසයම් ටෙන්ඩර-යක් පරක්ෂා කර බැලීමට ටෙන්ඩර් කංුවකුට අවශ්‍ය වුවහොත් එකී ටෙන්ඩංයේ පිටපත පංක්ෂා කර බැලීම සඳහා අවසර දෙනු ලැබේ.

6. මෙම වැඩයට උවමනා සිමෙන්ති ප්‍රමාණය මිළ දී ගැනීමට අවශ්‍ය අවසර පත්තරය ලංකා සිමෙන්ත් සංයුක්ත මණ්ඩලයෙන් හෝ සමූපකාර තොග වෙළඳ ආයතනයෙන් හෝ ලංා ගැනීම සඳහා නියමිත නිංදේශය සාර්ථක ටෙන්ඩර් කරු වෙත නිකුත් කරනු ලැබේ.

7. මෙම වැඩය සඳහා අවශ්‍ය, මෙරටින් ලබාගත නොහැකි බඩු බාහිරාදිය ආනයනය කිරිම සඳහා බලපත්‍ර ලබා ගැනීම ද නිර්දේශ කංනු ලැබේ.

8. වැඩය පිළිබඳ තව දුරටත් විස්තර කොළඹ 7, ප්‍රධාන මහජන සෞඛ්‍ය ඉංජිනේරු තැනගෙන් ලබාගත හැක.

ඇස්. ඊ. ජේ. මේතර්,
ප්‍රධාන මහජන සෞඛ්‍ය ඉංජිනේරු තැන.

1969 සැප්තැම්බර් මස 19 වනද,
කොළඹ 7, තැ.පෙ. 1434 දී.

9–938—69.9.26 දින අංක 14,873 දරන ගැසට් පත්‍රය

---

## ගංගා නිම්න භූමි සංවර්ධන මණ්ඩලය

මණ්ඩලයට අවශ්‍ය මුද්‍රණ පිටපත් හා ලේඛන සඳහා සීල් කරන ලද ටෙන්ඩර් පත්‍රිකා කැඳවනු ලැබේ.

මෙම ටෙන්ඩර් පත්‍රිකා ''ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන (ගල්ඔය), ගංගා නිම්න භූමි සංවර්ධන මණ්ඩලය, අම්පාර'' යන ලිපිනයට එවිය යුතුයි.

මෙම ටෙන්ඩරයේ අවසාන දිනය වන 1969.10.23 සවස 2.15 ට ඒවා විවෘත කරනු ඇත. මේ අවස්ථාවේ ටෙන්ඩරකරුට හෝ ඔහුගේ නියෝජිතයකුට පෙනී සිටිය හැක.

ටෙන්ඩර පත්‍රිකා හෝ එහි කොන්දේසිය පහත අත්සන් කර ඇති තැනැත්තාගෙන් හෝ අම්පාරේ, ගංගා නිම්න භූමි සංවර්ධන මණ්ඩලයේ, සැපයුම් නිලධාරි (ගල්ඔය) තැනගෙන් හෝ ලබා ගත හැක.

සභාපති,
මධ්‍යම ටෙන්ඩර් මණ්ඩලය,
ගංගා නිම්න භූමි සංවර්ධන මණ්ඩලය.

415, බෞද්ධාලෝක මාවත,
කොළඹ.

9–855/1—69.9.26 දින අංක 14,873 දරන ගැසට් පත්‍රය

## ගංගා නිම්න භූමි සංවර්ධන මණ්ඩලය

මණ්ඩලයට අවශ්‍ය ලිපි ද්‍රව්‍ය සඳහා සීල් කරන ලද ටෙන්ඩර් පත්‍රිකා කැඳවනු ලැබේ.

මෙම ටෙන්ඩර පත්‍රිකා ''ටෙන්ඩර මණ්ඩලයේ සභාපති තැන (ගල්ඔය), ගංගා නිම්න භූමි සංවර්ධන මණ්ඩලය, අම්පාර'' යන ලිපිනයට එවිය යුතුයි.

මෙම ටෙන්ඩරයේ අවසාන දිනය වන 1969.10.23 සවස 2.15 ට ඒවා විවෘත කරනු ඇත. මේ අවස්ථාවේ ටෙන්ඩර කරුට හෝ ඔහුගේ නියෝජිතයෙකුට පෙනී සිටිය හැක.

ටෙන්ඩර පත්‍රිකා හෝ එහි කොන්දේසි පහත අත්සන් කර ඇති තැනැත්තාගෙන් හෝ අම්පාරේ, ගංගා නිම්න භූමි සංවර්ධන මණ්ඩලයේ, සැපයුම් නිලධාරි (ගල්ඔය) තැනගෙන් හෝ ලබා ගත හැක.

සභාපති,
මධ්‍යම ටෙන්ඩර් මන්ඩලය,
ගංගා නිම්න භූමි සංවර්ධන මණ්ඩලය.

415, බෞද්ධාලෝක මාවත, කොළඹ.

9—855/2—69.9.26 දින අංක 14,873 දරන ගැසට් පත්‍රය

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව—අම්පාර උප කොටස

පහත දක්වෙන වැඩ කිරීම සඳහා ඉදිරිපත් කරනු ලබන ටෙන්ඩර් අයදුම් පත් 1969 ඔක්තෝම්බර් මස 20 වෙනි සඳුද පෙරවරු 10 දක්වා මඩකළපුව නැගෙනහිර කොට්ඨාශයේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් භාරගනු ලැබේ. ටෙන්ඩර් විවෘත කිරීම එවලේම එහිදී සිදුකෙරේ.

2. වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ එම වැඩ ඉදිරියේ දක්වා ඇති අයුරු හෝ ඊට වැඩි ගණන් වලට ලියා පදිංචි වූ කොන්ත්‍රාත්කරුවන්ට, සමුපකාර සමිතිවලට හා ග්‍රාම සංවර්ධණ සමිති වලට පමණක් මෙම වැඩ සඳහා අයදුම්පත් ඉදිරිපත් කළහැක.

| ටෙන්ඩර් අංකය | වැඩයේ නම | ලියාපදිංචි වූ ගණන | තැන්පත් මුදල |
|---|---|---|---|
| | | රු. | රු. |
| අ/41/68–69 ... | අම්පාර උප කොටසේ මල්වත්ත සූරිපොඩ පාරේ පළමු වන සැතපුම් කණුව දක්වා සක්ක ගල් කුඩා ගල් හා වැලි සැපයීම ... ... | 25,000 ... | 25 |
| අ/42/68–69 ... | අම්පාර උප කොටසේ මල්වත්ත සූරිපොඩ පාරේ පළවෙනි සැතපුමේ සිට 2.0 සැතපුම දක්වා සක්ක ගල් කුඩා ගල් සහ වැලි සැපයීම ... | 20,000 ... | 25 |
| අ/43/68–69 ... | අම්පාර උප කොටසේ මල්වත්ත සූරිපොඩ පාරේ 2.5 සැතපුමේ සිට 3.3 සැතපුම දක්වා සක්ක ගල්, කුඩා ගල්, වැලි හා බොරලු සැපයීම සහ පස් දමා පාර ගොඩ කිරීම... | 25,000 ... | 25 |
| අ/44/68–69 ... | අම්පාර උප කොටසේ මල්වත්ත සූරිපොඩ පාරේ 2 වන සැතපුමේ සිට 2.5 සැතපුම දක්වා කුඩා ගල් සහ වැලි සැපයීම ... ... | 15,000 ... | නැත |

1969 ඔක්තෝම්බර් මස 15 වෙනි බදාදා සවස 1.00 දක්වා අම්පාර, කල්මුණ හා වෙන්කල්අඩි උප කොට්ඨාශයන්හි වාරිමාර්ග ඉංජිනේරුවරුන්ගේ කාර්‍යාලයන්ගෙන් කාර්‍යාල වේලාවන් තුලදී ලබාගත හැකි ආකෘති පත්‍රවල ටෙන්ඩර් අයදුම්පත් සකස් කොට එවිය යුතුය. ටෙන්ඩර් ආකෘති පත් සඳහා ඉල්ලුම් කිරීමේදී ඒ සඳහා ඉදිරිපත් වන ටෙන්ඩර්කරුවන් ඔවුන්ගේ ලියාපදිංචි වීමේ පොත් සහ දැනට ඔවුන් කරන දෙපාර්තමේන්තුවේ වැඩ සහ ඒවායේ වටිනාකම පිළිබඳව ප්‍රකාශයක් ඔවුන්ට ටෙන්ඩර් කිරීමට ඉඩ තිබේද යන්න සලකා බැලීම සඳහා වාරිමාර්ග ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළ යුතුය. ටෙන්ඩර් ආකෘති නිකුත් කිරීමට පෙර, වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කාර්‍යාලයේ ඉහත සඳහන් ප්‍රකාර ටෙන්ඩර් තැන්පත් මුදල් තැන්පත් කළයුතුව ඇති අතර, එසේ නැතහොත් දිසාපති කාර්‍යාලයක එවැනි තැන්පත් කිරීමක් කළ බවට ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුය.

3. මෙම ටෙන්ඩර් පිළිබඳ වැඩි විස්තර අම්පාර උප කොටසේ වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කාර්‍යාලයෙන් කාර්‍යාල වේලාවන් තුළදී ලබාගත හැක.

ජී. ඇම්. චන්ද්‍රදස,
වාරිමාර්ග ඉංජිනේරු තැන,
අම්පාර උප කොට්ඨාශය.

1969 සැප්තැම්බර් මස 15 වෙනි දින,
උප කොට්ඨාශ වාරිමාර්ග කාර්‍යාලයේ දීය.

9—942—69.9.26 දින අංක 14,873 දරන ගැසට් පත්‍රය

---

## රාජ්‍ය දැව සංස්ථාව

**විදුලි බලයෙන් ක්‍රියා කරන වුඩ් වර්කිං යන්ත්‍රයක් (An Electrically Operated Woodworking Machine For Turning Out Tongue & Grooving Floor Boards and Ceiling Boards.) සැපයීම**

ඉහත සඳහන් සැපයීම උදෙසා 1969.11.20 දින පෙරවරු 10 වන තෙක් සැපයීම් නිලධාරි විසින් ටෙන්ඩර් භාරගනු ලැබේ.

ආපසු ලබා ගත හැකි රු. 100 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් කොළඹ 4, විශාඛා පාරේ, අංක 29/3 දරණ ස්ථානයේ අපගේ ගණකාධිකාරි (මුදල්), වෙත ගෙවා ගත් කුවිතාන්සි පත මා වෙත ඉදිරිපත් කිරීමෙන් ලබා ගත හැකි ටෙන්ඩර් පත්‍රවල ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය. ටෙන්ඩර් වසනු ලබන දිනයේ ටෙන්ඩර් පත් නිකුත් කරනු නොලබන අතර එම දිනට පෙර දින දහවල් 12 න් පසු ටෙන්ඩර් තැන්පත් මුදල් භාර ගනු නොලැබේ. පරීශිලනය උදෙසා ටෙන්ඩර් පත්‍ර මෙම කාර්යාලයෙහි තබා ඇත.

ආර්. ජී. ද සොයිසා,
සැපයීම් නිලධාරී.

30, අශෝක උයන,
කොළඹ 4.

9–890/1—69.9.26 දින අංක 14,873 දරන ගැසට් පත්‍රය

---

## රාජ්‍ය දැව සංස්ථාව

**වරායෙන් බඩු ඉවත් කිරීම, ප්‍රවාහණය කිරීම, බෑම සහ අඩුක් කිරීම**

වරායෙන් බඩු ඉවත් කිරීම, පැටවීම, රත්මලාන දක්වා ප්‍රවාහණය කිරීම, බෑම සහ අඩුක් කිරීම, සඳහා 1969.10.2 දින උදේ 10 දක්වා සැපයීම් නිලධාරි විසින් ටෙන්ඩර් භාර ගනු ලැබේ.

ආපසු ලබා ගත හැකි රු. 100 ක ටෙන්ඩර් තැන්පත් මුදලක්, කොළඹ 4, විශාඛා පාරේ අංක 29/3 දරණ ස්ථානයේ අපගේ ගණකාධිකාරි (මුදල්), වෙත ගෙවා ගත් කුවිතාන්සි පත මා වෙත ඉදිරිපත් කිරීමෙන් ලබා ගත හැකි ටෙන්ඩර් පත්‍රවල ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය. ටෙන්ඩර් වසනු ලබන දිනයේ ටෙන්ඩර් පත් නිකුත් කරනු නොලබන අතර එම දිනට පෙර දින දහවල් 12 න් පසු ටෙන්ඩර් තැන්පත් මුදල් භාර ගනු නොලැබේ. වැඩි විස්තර මගෙන් ලබා ගත හැක. (දුර කථන අංක : 81565).

ආර්. ජී. ද සොයිසා,
සැපයීම් නිලධාරී.

30, අශෝක උයන,
කොළඹ 4.

9–890/2—69.9.26 දින අංක 14,873 දරන ගැසට් පත්‍රය

## ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව

දුම්රිය දෙපාර්තමේන්තුවේ එකතුවෙන යකඩ හා ලී කුඩු විකිණීම සම්බන්ධයෙන්, දුම්රිය දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩල සභාපති (ලිපිනය : දුම්රිය සාමාන්‍යාධිකාරිගේ කාර්යාලය, තැ.පෙ. 355, කොළඹ 10) 1969 ඔක්තෝබර් මස 27 වැනි සඳුදා පෙරවරු 11 දක්වා ටෙන්ඩර් පත් භාරගනු ලැබේ.

2. ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කිරීමට පෙර, අවශ්‍යවුවහොත් ටෙන්ඩර් කරු විසින් ඉහත සඳහන් සේවාව භාරගැනීමට සහ හරිහැටි ඉටුකිරීමට තමාගේ මුදල් තත්ත්වය ප්‍රමාණවත් බව ඔප්පු කිරීමට අවශ්‍ය ලියකියවිලි ඉදිරිපත් කළ යුතුයි.

3. මරදානේ දුම්රිය ගබඩා අධිකාරිගේ කාර්යාලයෙන් ලබාගත හැකි ෆෝරම් කොළවල ටෙන්ඩරය ලියා අනුපිටපතක් සහිතව එවිය යුතුයි.

4. ටෙන්ඩර් තැන්පත් මුදල වශයෙන් රු. 100ක් මරදානේ දුම්රිය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගණකාධිකාරී කාර්යාලයේ හෝ කොළඹින් පිට නම් ඕනෑම කච්චේරියක තැන්පත් කර ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට 1969 ඔක්තෝබර් මස 26 වැනි ඉරිදා දවල් 12 දක්වා ටෙන්ඩර් ෆෝරම ලබාගත හැකිය.

5. 1969 ඔක්තෝබර් මස 27 වැනි සඳුදා පෙරවරු 11.05 ට දුම්රිය සාමාන්‍යාධිකාරී තැනගේ කාර්යාලයේදී ටෙන්ඩර් පත්‍ර විවෘත කරන විට ටෙන්ඩර් කරුවන්ට පෙනී සිටීමට අවසර ඇත.

6. වැඩි විස්තර දුම්රිය ගබඩා අධිකාරිගේ කාර්යාලයෙන් ලබාගත හැකිය.

ඇම්. සරීන්,
දුම්රිය සාමාන්‍යාධිකාරී වෙනුවට.

1969 සැප්තැම්බර් මස 26 දින,
කොළඹ දී ය.

9–988—69.9.26 දින අංක 14,873 දරන ගැසට් පත්‍රය

---

## ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුව

කොළඹ, ඕල්කොට් මාවතේ, දුම්රිය සාමාන්‍යාධිකාරී කාර්යාලයේ (තැ.පෙ. 335) ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුවේ මූලස්ථාන ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් පුත්තලමේ සිට පෙරියනාගවිල්ලු දක්වා දල වශයෙන් හැතැප්ම 15 ක් පමණ දුම්රිය මාර්ගය අයිනේත්, වැඩිලටි, දුර කථන හා විදුලි සංඥා සම්ප්‍රේෂණ උඩ මාර්ග හා පෙරියනාගවිල්ලු සිට අරුවකාලු හා පෙරියනාගවිල්ලු සිට ඉලවන්කුළම දක්වා ඳදමාර්ගයේම දල වශයෙන් හැතැප්ම 6 ක් පමණ දුරට දුරකථන සම්ප්‍රේෂණ උඩ මාර්ග ඇදීම සඳහා ටෙන්ඩර් පත්, 1969 ඔක්තෝබර් මස 22 වැනි බදාදා පෙ.ව. 11 දක්වා භාරගනු ලැබේ.

එදින ප.ව. 2.30 ට කොළඹ දුම්රිය සාමාන්‍යාධිකාරී කාර්යාලයේ දී ටෙන්ඩර් පත් විවෘත කරන විට ටෙන්ඩර්කරුවන්ට එහි පැමිණිය හැකිය.

2. කොළඹ, ඩී. ආර්. විජේවර්ධන මාවතේ පිහිටි දුම්රිය මාර්ග හා කර්මාන්ත පිළිබඳ අංශයේ ප්‍රධාන ඉංජිනේරුතැනගෙන් (තැ.පෙ. 370) මේ සඳහා අවශ්‍ය ටෙන්ඩර් ෆෝරම ලබා ගෙන සම්පූර්ණ කොට අනුපිට පතක් ද සමඟ එවිය යුතුය. මේ සම්බන්ධයෙන් සියලු විස්තර එම නිළධාරී තැනගෙන් ලබාගත හැකිය.

3. රජයේ කවර දෙපාර්තමේන්තුවක හෝ රජයේ අනුග්‍රාහික සංස්ථාවක රු. 1,50,000 කට නොඅඩු ගණනකට ලියා පදිංචි වූ හෝ මෙම මුදලට වඩා වටිනාකම් ඇති නිර්මාන වැඩක් දෙපාර්තමේන්තුවට සතුටුදායක අන්දමින් නිම කර ඇති කොන්ත්‍රාත්කරුවනට පමණක් පහත සඳහන් ඉංජිනේරුතැන වෙත (අ) තමාගේ ලියාපදිංචිය පිළිබඳ ලියකියවිලි හා (ආ) ටෙන්ඩරය සඳහා තැන්පත් කළයුතු වන මුදල වන රු. 200 සහ ටෙන්ඩර් ගාස්තුව වන රු. 10 ක් ද තැන්පත් කර ලබාගත් රිසිට් පත්, 1969 ඔක්තෝබර් මස 8 වෙනි දින ප.ව. 4 ට පෙර ඉදිරිපත් කළ විට ටෙන්ඩර් ෆෝරම ලබාගත හැකිය.

මෙම මුදල් තැන්පත් කළ යුත්තේ කොළඹ දුම්රිය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගණකාධිකාරී කාර්යාලයේ දීය.

ජේ. පී. සේනාරත්න,
ප්‍රධාන ඉංජිනේරු, ල.දු.දෙ.

තැ.පෙ. 370,
1969 සැප්තැම්බර් 17 දින,
කොළඹ දීය.

9–1005—69.9.26 දින අංක 14,873 දරන ගැසට් පත්‍රය

---

## ලංකා ගමනාගමන මණ්ඩලය

කොළඹ 5, කිරුළ පාරේ අංක 200 දරණ ස්ථානයෙහි පිහිටි ලංකා ගමනා ගමන මණ්ඩලීය ප්‍රධාන කාර්යාලයෙහි නියුක්ත ටෙන්ඩර් මණ්ඩලීය සභාපති තැන විසින් පහත සඳහන් කර්මාන්තය සඳහා මුද්‍රා තබා ඉදිරිපත් කරන ටෙන්ඩර් පත්‍රිකා, 1969 ඔක්තෝබර් මස 8 වන බදාදා පූ.භා. 10 වන තෙක් භාරගනු ලැබේ:—

(1) ගාල්ල.—ප්‍රාදේශීය වැඩපොළ ඉදිකිරීම.

ප්‍රධාන සිවිල් ඉංජිනේරු තැනගෙන් ලබාගත් ආකෘති පත්‍රවල පිළියෙල කොට අනුපිටපතින් යුතුව ටෙන්ඩර් පත්‍රිකා ඉදිරිපත් කළ යුතුය. මේ පිළිබඳව අවශ්‍ය සියලු විස්තර සහ තොරතුරු ඔහුගෙන් ලබාගත හැකි අතර, අදාල සැලසුම් පත් ඔහුගේ කාර්යාලයේදී පරීක්ෂා කර බැලීමට පුළුවන. ලංකා ගමනාගමන මණ්ඩලයට හෝ රජයේ දෙපාර්තමේන්තුවල සිවිල් ඉංජිනේරු වැඩ සම්බන්ධයෙන් රු. 1,50,000ට නොඅඩු ගණනකට ලියාපදිංචිවී සිටින කොන්ත්‍රාත්කරුවන් පමණක් ටෙන්ඩර් පත්‍රිකා එවීමට සුදුස්සන් වන අතර, ඔවුන්ගේ සහතික පත් යනාදිය ප්‍රධාන සිවිල් ඉංජිනේරු තැන පරීක්ෂා කිරීමෙන් අනතුරුව අනුමත කළහොත් පමණක් රු. 200ක ටෙන්ඩර් ඇප මුදල සහ ආපසු නොගෙවනු ලබන ටෙන්ඩර් ගාස්තු වශයෙන් රු. 25 ක මුදලක් මුදලින් පමණක් ප්‍රධාන ගිණුම් නිලධාරී තැන වෙත තැන්පත් කොට ඒ සඳහා නිකුත් කරන කුවිතාන්සි ප්‍රධාන සිවිල් ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළ විට 1969.10.4 වන සෙනසුරාද මධ්‍යාහ්න 12 දක්වා ටෙන්ඩර් පත්‍රිකා නිකුත් කරනු ලැබේ.

ප්‍රධාන සිවිල් ඉංජිනේරු තැන,
200, කිරුළ පාර, කොළඹ 5. ලංකා ගමනාගමන මණ්ඩලය.

9–981/1—69.9.26 දින අංක 14,873 දරන ගැසට් පත්‍රය

---

## ලංකා ගමනාගමන මණ්ඩලය

කොළඹ 5, කිරුළ පාරේ අංක 200 දරණ ස්ථානයෙහි පිහිටි ලංකා ගමනා ගමන මණ්ඩලීය ප්‍රධාන කාර්යාලයෙහි නියුක්ත ටෙන්ඩර් මණ්ඩලීය සභාපති තැන විසින් පහත සඳහන් කර්මාන්තයන් සඳහා මුද්‍රා තබා වෙන වෙනම ඉදිරිපත් කරන ටෙන්ඩර් පත්‍රිකා 1969 ඔක්තෝබර් මස 8 වන බදාදා පූ.භා. 10 වන තෙක් භාර ගනු ලැබේ:—

(1) කුලියාපිටිය. (2) මාතලේ.

ඉහත සඳහන් නව ඩිපෝ ගොඩනැගිලි වල විදුලි උපකරණ සපයා සවි කිරීම.

ප්‍රධාන සිවිල් ඉංජිනේරු තැනගෙන් ලබාගත් ආකෘති පත්‍රවල පිළියෙල කොට අනුපිටපතින් යුතුව ටෙන්ඩර් පත්‍රිකා ඉදිරිපත් කළ යුතුය. මේ පිළිබඳව අවශ්‍ය සියලු විස්තර සහ තොරතුරු ඔහුගෙන් ලබාගත හැකි අතර, අදාල සැලසුම් පත් ඔහුගේ කාර්යාලයේදී පරීක්ෂා කර බැලීමට පුළුවන. ලංකා ගමනා ගමන මණ්ඩලයේ හෝ රජයේ දෙපාර්තමේන්තුවල විදුලි ඉංජිනේරු වැඩ සම්බන්ධයෙන් රු. 45,000 ට නොඅඩු ගණනකට ලියා පදිංචිවී සිටින කොන්ත්‍රාත්කරුවන් පමණක් ටෙන්ඩර් පත්‍රිකා එවීමට සුදුස්සන් වන අතර ඔවුන්ගේ සහතික පත් යනාදිය ප්‍රධාන සිවිල් ඉංජිනේරු තැන පරීක්ෂා කිරීමෙන් අනතුරුව අනුමත කළහොත් පමණක් අංක 1 සහ 2 දරණ කර්මාන්තයන් සඳහා රු. 100 බැගින් වන ටෙන්ඩර් ඇප මුදල් සහ ආපසු නොගෙවනු ලබන ටෙන්ඩර් පෝර් ා ගාස්තු වශයෙන් රු. 25 ක මුදලක් මුදලින් පමණක් ප්‍රධාන ගිණුම් නිලධාරී තැන වෙත තැන්පත් කොට ඒ සඳහා නිකුත් කරන කුවිතාන්සි ප්‍රධාන සිවිල් ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළ විට 1969.10.4 වන සෙනසුරාද මධ්‍යාහ්න 12 දක්වා ටෙන්ඩර් පත්‍රිකා නිකුත් කරනු ලැබේ.

ප්‍රධාන සිවිල් ඉංජිනේරු තැන,
ලංකා ගමනාගමන මණ්ඩලය.

200, කිරුළ පාර,
කොළඹ 5.

9–981/2—69.9.26 දින අංක 14,873 දරන ගැසට් පත්‍රය

## රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව

### පානලුව පිහිටි සංස්ථා භූමියේ රබර් ගස් බදුදීම

රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාවේ සභාපති විසින් පානලුව පිහිටි සංස්ථා භූමියේ ඇති රබර් ගස් 2,000 ක කිරි ගැනීම පිණිස බදුදීම සඳහා 1969.10.12 දින පෙරවරු 9.30 වන තෙක් මිළ ගණන් කැඳවනු ලැබේ.

ටෙන්ඩර් පෝර්ම සංස්ථාවේ ලේකම් ගෙන් ලබාගෙන ඒවායේ ටෙන්ඩර් පත්‍ර අනුපිටපතක් ද, සහිතව ලියුම් කවරයක බහා, සීල් තබා එහි මුදුන් වම් කොනේ '' පානලුව මුද්‍රණ සංස්ථා භූමියේ රබර් ගස් බදුදීම '' යන්න ලියා කොළඹ 5, 2 බී., ද පොන්සේකා පාරේ රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාවේ සභාපති වෙත ලියාපදිංචි කළ තැපැලෙන් එවිය යුතුයි. නොඑසේ නම්, ඒවා සංස්ථාවේ ප්‍රධාන කාර්යාලයයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ බහාලිය හැක.

ටෙන්ඩර් පත් විවෘත කිරීමට නියමිත දිනට පෙර දින ප.ව. 4.30 වන තෙක් ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ. පෝර්ම නිකුත් කිරීම සඳහා එක් එක් ටෙන්ඩර් පත්‍රයක් වෙනුවෙන් රු. 25 ක් මෙම කාර්යාලයයේ තැන්පත් කළ යුතුය. පොරොන්දු පත්‍රයට අත්සන් කළ පසු ටෙන්ඩර් තැන්පත් මුදල ආපසු දෙනු ලැබේ.

රබර් ගස් පරීක්ෂාකර බැලීමට අවශ්‍ය ටෙන්ඩර් කරුවන්ට ලේකම් ගෙන් ලබාගත් බලපත්‍රයක් උඩ එසේ කළ හැක.

එස්. ඩී. සපරමාදු,
සභාපති.

1969.9.16 වන දින,
2 බී, ද පොන්සේකා පාරේ,
රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාවේදී ය.

9–991—69.9.26 දින අංක 14,873 දරන ගැසට් පත්‍රය

---

## ගොඩනැගිලි දෙපාර්තමේන්තුව

වැලිමඩ ප්‍රාදේශීය ආදයම් නිළධාරි කාර්යාලයක් හා නිළ නිවාසයක් තැනීම සඳහාවූ ටෙන්ඩර් පත්, බදුල්ලේ ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ අධිකාරි ඉංජිනේරු කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයෙහි සභාපතිවරයා විසින්, වර්ෂ 1969 ක්වූ ඔක්තෝබර් මස 29 වැනි බදද පෙරවරු 11 වන තෙක් භාර ගනු ලැබේ.

2. බදුල්ලේ ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ දිස්ත්‍රික් ඉංජිනේරු වරයාගෙන් ලබාගත් ආකෘති පත්වල ටෙන්ඩර් පත් පිළියෙල කොට අනු පිටපතක්ද සහිතව ඉදිරිපත් කළ යුතුයි. මේ පිළිබඳ සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබා ගත හැකි වන අතර, සැළැස්ම ද ඔහුගේ කාර්යාලයේදී බලා ගැණීමට පිළිවන.

3. රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 99,000 කට නොඅඩු ගණනකට ලියා පදිංචි වූ කොන්ත්‍රාත්කරුවන් පමණක් ඉහත සඳහන් ඉංජිනේරු වරයා වෙත ටෙන්ඩර් පත් තැන්පත් මුදල වන රු. 100 ක් තැන්පත් කර ලබා ගත් කුවිතාන්සිය වර්ෂ 1969 ක්වූ ඔක්තෝබර් මස 17 වැනි සිකුරාද පස්වරු 4.30 ට පෙර ඉදිරිපත් කළ විට මේ සඳහා ටෙන්ඩර් පත් එවීමට සුදුසු වනවා ඇත. ටෙන්ඩර් පත් සඳහා ප්‍රමාදවී අයදුම් කරන්නන් විසින් එක් දිනකට හෝ ඉන් අඩකට රු. 10 බැගින් ආපසු ගෙවනු නොලබන පමාවීමේ ගාස්තුවක් නිකුත් කරන නිළධාරීතැනට ගෙවා ඒ සඳහා කුවිතාන්සියක් ලබා ගත යුතුයි.

4. ටෙන්ඩර් පත් නිකුත් කිරීමට පෙර අයදුම් කරු විසින් කොන්ත්‍රාත් කරුගේ සටහන් පොත හෝ පිරික්සුම් ලිපිය ඉදිරිපත් කළ යුතු වේ.

5. ටෙන්ඩර් ලබා ගැනීමට බලාපොරොත්තු වන අය, ටෙන්ඩර් තැන්පත් මුදල් කුවිතාන්සිය ඉදිරිපත් කරන අවස්ථාවේදී, දනට කරගෙන යන වැඩ පිළිබඳ සියලු විස්තර අඩංගු කළ යුතු ආකෘති පත්‍ර, නිකුත් කරන නිළධාරියාගෙන් ලබා ගෙන නියමිත ටෙන්ඩර් මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය.

6. ටෙන්ඩර් තැන්පත් මුදල කොළඹ කොටුවේ ගොඩනැගිලි අධ්‍යක්ෂ තැන ගේ ප්‍රධාන කාර්යාලයේදී හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියකදී හෝ තැන්පත් කළ හැක.

ඇන්. පී. ඒ. විජේසේකර,
ඌව කොට්ඨාශයේ අධිකාරි ඉංජිනේරු,
බදුල්ල.

1969 සැප්තැම්බර් මස 15 වැනි දින,
අධිකාරි ඉංජිනේරු කාර්‍යාලය,
බදුල්ල.

9–840—69.9.26 දින අංක 14,873 දරන ගැසට් පත්‍රය

---

## ජාතික නිවාස දෙපාර්තමේන්තුව

### දෙහිවල නිවාස ක්‍රමයේ සාප්පු සහ තට්ටු නිවාස ඉදිකිරීම

දෙහිවල නිවාස ක්‍රමයේ සාප්පු සහ තට්ටු නිවාස ඉදිකිරීම සඳහා විද්‍යාත්මක පර්යේෂණ සහ නිවාස අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1969 ඔක්තෝබර් 31 දින පෙරවරු 10 තෙක් ටෙන්ඩර්පත්‍ර භාරගනු ලබන අතර, එදින එකී වේලාවට ඒවා විවෘත කරන විට ටෙන්ඩර්කරුවන්ට පැමිණ සිටිය හැක.

පිටපත් දෙකකින් යුත් ටෙන්ඩර්පත්‍ර මෙම දෙපාර්තමේන්තුවේ අධිකාරී ඉංජිනේරු තැනගෙන් ලබාගත හැකිවාක් මෙන්ම අවශ්‍ය වෙනත් විස්තර ඔහුගෙන් ලබාගත හැක.

රජයේ වැඩ දෙපාර්තමේන්තුව, වාරිමාර්ග දෙපාර්තමේන්තුව, රජයේ සංයුක්ත මණ්ඩල, රජයේ වෙනත් දෙපාර්තමේන්තුවල ඉදිකිරීමේ වැඩ සඳහා රු. 10,00,000 කට හෝ ඊට වැඩි ගණනකට ලියාපදිංචි වී ඇති කොන්ත්‍රාත්කරුවන් ටෙන්ඩර් කිරීමට සුදුසුස්සෝ වෙති. මෙසේ ලියාපදිංචි වීමේ සහතිකය සහ මෙම දෙපාර්තමේන්තුවේ සරප් තැන වෙත රු. 250 ක මුදලක් තැන්පත් කර ඒ සඳහා කුවිතාන්සියක් ඉදිරිපත් කරන ටෙනඩර්කරුවනට 1969 ඔක්තෝබර් 27 දින දවල් 12 වනතෙක් ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ.

වී. රාජේන්ද්‍රා,
ජාතික නිවාස කොමසාරිස්.

1969 සැප්තැම්බර් 12 දින,
ජාතික නිවාස දෙපාර්තමේන්තුව,
තැ. පෙ. 544,
ශ්‍රීමත් සිත්තම්පලම් ගාඩිනර් මාවත,
කොළඹ 2.

9–887—69.9.26 දින අංක 14,873 දරන ගැසට් පත්‍රය

---

# තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම

## පොලිස් දෙපාර්තමේන්තුව

### කොම්පඤ්ඤවීදියේ පොලිස් නිරෝධායන කඳවුරේ අයථා ආගමිකයින්ට පිසින ලද ආහාර සැපයීමේ ටෙන්ඩර් වල ප්‍රතිඵල

(අ) ලත් ටෙන්ඩර් වල මුළු ගණන ... 2

(ආ) පිළිගත් ටෙන්ඩර්කරුගේ නම ... නාගූර් මීරා-ජෙයිනුල් ආබ්දීන් මහතා, අංක 42, කුමාරන් රත්නම් පාර, කොම්පඤ්ඤවීදිය, කොළඹ 2

(ඇ) පිළිගත් මිළ ගණන්

| | කෑම වේලක මිල ගණන රු. ශ. |
|---|---|
| (1) (අ) උදේ තේ ... ... ... | 0 32 |
| (ආ) දවල් කෑම : | |
| (i) දින 3ක් තුළ එළවළු ව්‍යංජන දෙකක් සහ සම්බල් සමග බත් ... ... ... | 0 51 |
| (ii) දින 2ක් තුල එළවළු ව්‍යංජන දෙකක් හා කරවල සමග බත් ... ... ... | 0 53 |
| (iii) දින 2 ක් තුල එළවළු ව්‍යංජන දෙකක් හා මාළු සමග බත් | 0 54 |
| (ඇ) සවස තේ හෝ කෝපි ... ... | 0 05 |
| (ඈ) රාත්‍රී කෑම ... ... | 0 35 |
| (2) රෝගීන්ගේ කෑම... ... ... | 0 65 |

කොළඹ පොලිස් අධිකාරී.

පොලිස් කාර්‍යාලය,
එච්වලන් චතුරශ්‍රය,
කොළඹ 1, 1969 සැප්තැම්බර් 14.

9–841—69.9.26 දින අංක 14,873 දරන ගැසට් පත්‍රය

## පොලිස් දෙපාර්තමේන්තුව

### තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම

1969.7.11 දින අංක 14,862 දරණ රජයේ ගැසට් පත්‍රයේ පලවුනු දැන්වීම පරිදි—තලෙයිමන්නාරිහි පිහිටි අයථා ආගමිකයින් රඳවා සිටින කඳවුරට සහ නිරෝධායන කඳවුරට කෑම සැපයීම සඳහා ලැබුනු ටෙන්ඩර් සම්බන්ධ තීරණයන්.

| ලැබුණු ටෙන්ඩර් ගණන | | පිළිගත් ටෙන්ඩර්කරුගේ නම | | පිළිගත් මිල ගණන |
|---|---|---|---|---|
| | | | | රු. ශ. |
| 2 | ... | කේ. වේලුප්පිල්ලෙයි මයා., කළපූම්, කරෙයිනගර්. | උදේ කෑම | 0 40 |
| | | | දවල් කෑම | 0 60 |
| | | | සවස තේ | 0 05 |
| | | | රෑ කෑම | 0 30 |
| | | | රෝගීන්ගේ කෑම | 0 50 |

ආර්. සුන්දරලිංගම්,
පොලිස් අධිකාරි, උතුරු පලාත.

පොලිස් කාර්‍යාලය,
යාපනය,
69.9.16.

9–926—69.9.26 දින අංක 14,873 දරන ගැසට් පත්‍රය

---

# බඩු බාහිරාදිය විකිණීම්

## පොලිස් දෙපාර්තමේන්තුව

### වෙන්දේසියේ විකිණීම

පාවිච්චියට නුසුදුසු පහත සඳහන් බඩු 1969 ඔක්තෝබර් මස 31 වැනි දින පෙරවරු 9 ට නුවරඑළිය පොලිස් කාර්‍යාලයේදී වෙන්දේසියේ විකුණනු ලැබේ :—

| | බඩුවල නම් | | | බඩුවල ගණන |
|---|---|---|---|---|
| 1. | නිල් වැහි කබා | ... | ... | ... 20යි |
| 2. | උණ්ඩ උර | ... | ... | ... 38යි |
| 3. | හම් පටි | ... | ... | ... 41යි |
| 4. | බයිසිකල් | ... | ... | ... 4යි |
| 5. | කැරන් ලැලි | ... | ... | ... 1යි |
| 6. | බ්ලැන්කට්ටු | ... | ... | ... 82යි |
| 7. | බලක්ලාවාකැප්ස් | ... | ... | ... 34යි |
| 8. | බූට්ස් ජෝඩු | ... | ... | ... 167යි |
| 9. | බයිසිකල් මඩිගාඩ | ... | ... | ... 1යි |
| 10. | බයිසිකල් ටයර් | ... | ... | ... 2යි |
| 11. | බයිසිකල් ටියුබ | ... | ... | ... 2යි |
| 12. | බෙරේට් තොප්පි | ... | ... | ... 9යි |
| 13. | සට්ටන තොප්පි | ... | ... | ... 2යි |
| 14. | රෙදි ඉස්තිරික්ක | ... | ... | ... 1යි |
| 15. | ලැගේජ් කැරියර් | ... | ... | ... 1යි |
| 16. | මැටි බඳුන් | ... | ... | ... 4යි |
| 17. | කැන්වස් සපත්තු කුට්ටම් | | ... | ... 39යි |
| 18. | ප්ලැනල් කමිස | ... | ... | ... 100යි |
| 19. | ප්ලැනල් දිග කලිසම් | | ... | ... 26යි |
| 20. | තණකොල කපන අත් යන්ත්‍ර | | ... | ... 1යි |
| 21. | කාකි දිග කලිසම් | ... | ... | ... 12යි |
| 22. | කාකි කැලෑ කබා | ... | ... | ... 32යි |
| 23. | කාකි කොට කලිසම් | ... | ... | ... 113යි |
| 24. | කාකි හට කබා | ... | ... | ... 74යි |
| 25. | නිල ඇඳුම් පෙට්ටි | ... | ... | ... 17යි |
| 26. | නිල ඇඳුම් පලස් | ... | ... | ... 26යි |
| 27. | හම් පටි | ... | ... | ... 1යි |
| 28. | කුඩා උණ්ඩ උර | ... | ... | ... 2යි |
| 29. | පිස්තෝල කොපු | ... | ... | ... 5යි |
| 30. | අත් මේස් කුට්ටම් | ... | ... | ... 39යි |
| 31. | මෙට්ට | ... | ... | ... 33යි |
| 32. | ප්‍රීකැප් | ... | ... | ... 1යි |
| 33. | රබර් වැහි කබා | ... | ... | ... 13යි |
| 34. | ඇල තොප්පි | ... | ... | ... 209යි |
| 35. | සපත්තු කුට්ටම් | ... | ... | ... 608යි |
| 36. | සර්ජ් කෝට් | ... | ... | ... 20යි |
| 37. | ස්වෙටර්ස් | ... | ... | ... 129යි |
| 38. | නිල් දිග මේස් කුට්ටම් | | ... | ... 60යි |
| 39. | ගැලොම් 1 ටින් | ... | ... | ... 22යි |
| 40. | ගැලොම් 4 ටින් | ... | ... | ... 62යි |
| 41. | කාකි තොප්පි | ... | ... | ... 5යි |
| 42. | ගැලෝම් 50 බැරල් | ... | ... | ... 1යි |
| 43. | ගුවන් විදුලි යන්ත්‍ර | ... | ... | ... 1යි |

වෙන්දේසියට පෙර දිනක නුවරඑළිය පොලිස් කාර්‍යාලයේදී මෙම බඩු පරික්ෂා කර බැලිය හැක. වෙන්දේසිය අවසාන වූ විගසම මුදල් ගෙවීම සහ ඉවත්කර ගැනීම කළ යුතුය.

ඩී. ඩී. ඇස්. කේ. රණසිංහ,
පොලිස් අධිකාරි,
මධ්‍යම පළාත දකුණ, නුවරඑළිය.

පොලිස් කාර්‍යාලය,
නුවරඑළිය,
1969.9.9 දින.

9–801—69.9.26 දින අංක 14,873 දරන ගැසට් පත්‍රය

---

## ධීවර දෙපාර්තමේන්තුව

### ඇන්ජින් සහිතවූ/රහිතවූ/පාවිච්චි කරන ලද ධීවර යාත්‍රා වෙන්දේසියේ විකිණීම

ඇන්ජින් සහිතවූ/රහිත වූ ටොන් 3½ රේ පාවිච්චි කරන ලද ධීවර යාත්‍රා පහත සඳහන් උපලේඛනයෙහි දැක්වෙන දිනයන්හිදී සහ ස්ථානයන්හි දී පෙ.ව. 9.30 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

උපලේඛනයෙහි සඳහන් ස්ථානයේදී මෙම යාත්‍රා පරික්ෂාකර බැලිය හැකිය. ගෙවීම් පහත සඳහන් පරිදි මුදලින්ම කළ යුතුය :—

(අ) යාත්‍රාවේ විකුණුම් මිළෙන් ¼ ක් විකිණීම අවසන් වූ වහාම ;

(ආ) විකුණුම් මිළෙන් ඉතිරි ¾ කොටස දින 3 ක් ඇතුළත දී ;

(ඇ) කෙසේ වුවද, යම් යාත්‍රාවක්/ඇන්ජිමක් වෙනුවෙන් යමෙකු විසින් ඉදිරිපත් කරනු ලබන ලන්සුවක් තාවකාලික වශයෙන් පිළිගැනීමට ඉඩ තිබේ. එම ලන්සුව අවසාන වශයෙන් පිළිගැනීම හෝ ප්‍රතික්ෂෙප කිරීම හෝ දින 14 ක කාලයකට සීමා කරනු ලැබේ. එවැනි අවස්ථාවලදී යාත්‍රාවේ/ඇන්ජිමේ විකුණුම් මිළෙන් ¼ ක තැන්පත් මුදලක් වෙන්දේසිය අවසන් වූ වහාම ගෙවිය යුතුය. එම ලන්සුව පිළිගනු ලැබුවහොත් විකුණුම් මිළෙන් ඉතිරි ¾ මුදල අවසාන පිළිගැනීමේ දැන්වීම එවා දින 3 ක් ඇතුළත ගෙවිය යුතුය. මෙම මුදල ගෙවීමට අපොහොසත් වුවහොත් එහි ප්‍රතිඵලය වන්නේ තැන්පත් මුදල අහිමිවීමයි. ලන්සුව ප්‍රතික්ෂේප කරනු ලැබුවහොත් තැන්පත් මුදල ආපසු ගෙවනු ලැබේ.

වෙන්දේසියේ විකුණන ලද යාත්‍රා මුදල් ගෙවීමෙන් පසු ඉවත් කරගෙන යන තෙක් ජයග්‍රාහී ඉල්ලුම්කරුවන්ගේ සම්පූර්ණ වගකීම මත එම භූමිභාග යෙහි තිබෙන්නට හරිනු ලැබේ.

## උපලේඛනය

| යාත්‍රා අංකය | ඇන්ජිමේ වර්ගය | තිබෙන ස්ථානය | වෙන්දේසි කරන දිනය |
|---|---|---|---|
| එස් 275 | — | ලංකා ධීවර සංස්ථාවේ යාත්‍ර දියත් කරන ස්ථානය, මට්ටක්කුලිය | |
| එස්අයිසී 42 | ටෝර්පිඩෝ — | එම | 69.10.30 |
| ටී 46 | ලිස්ටර් අ. බ. 22 | එම | |
| එස් 10 | — | විම්ස්ටාර් යාත්‍රාංගනය, මට්ටක්කුලිය | 69.10.31 |
| ටී 346 | — | ලූකස් යාත්‍රාංගනය, පානදුර | 69.11. 2 |
| ටී 175 | යන්මාර් අ. බ. 8 | කටුකුරුන්ද ධීවර යාත්‍රා සාදන්නන්ගේ සමුපකාර සමිතියේ යාත්‍රාංගනය, උතුරු කළුතර | |
| කේබීබී 1 | — | එම | 69.11. 3 |
| එල් 2 | ලිස්ටර් | එම | |
| වීජේ 6 | — | එම | |
| ජේපීඑප් 38 | කෙල්වින් අ. බ. 20 | නවලංකා යාත්‍රාංගනය. බේරුවල | |
| එස් 189 | — | එම | |
| එම්සී 58 | — | එම | 69.11. 4 |
| ජේබී 43 | — | එම | |
| ඕඑස් 7 | — | එම | |
| එම්සී 4 | — | බේරුවල වෙරළ | |
| එස් 172 | — | එම | |
| පීජ්සී 3 | — | බලපිටිය ධීවර කාර්යාලය අසල | |
| ජේබී 10 | — | එම | |
| එස් 162 | — | බලපිටිය පාලම අසල | 69.11. 5 |
| එස් 247 | — | එම | |
| එම්සී 15 | — | බලපිටිය වෙරළ | |
| ටී 403 | — | හික්කඩුව වෙරළ | 69.11. 6 |
| එස් 107 | — | එම | |
| එස් 3 | — | ජේපීඑප් යාත්‍රාංගනය, මීගමුව | 69.11. 7 |
| වීජේ 1 | — | වීජේ යාත්‍රාංගනය, මීගමුව | 69.11.11 |
| ටී 14 | — | මීගමුව වෙරළ | 69.11.12 |
| එස් 38 | ඩියුට්ස් | එම | |
| ටී 122 | පාර්සන්ස් | අළුත්කුරුව, මීගමුව | 69.11.13 |
| එස් 28 | — | ඩබ්ලිව්එප් යාත්‍රාංගනය, මීගමුව | 69.11.14 |
| වීජේ 2 | — | මඩකලපුව බාර් | 69.11.15 |
| ඩබ්ලිව් 5 | — | උප්පොඩෙයි | 69.11.17 |
| ටී 7 | — | පොතුවිල් වෙරළ | 69.11.18 |
| ටී 410 | — | ගං. නි. සංවර්ධන මණ්ඩලයේ යාත්‍රාංගනය අම්පාරේ | |
| ටී 233 | — | එම | 69.11.19 |
| එස් 92 | යන්මාර් අ. බ. 8 | එම | |
| ජේබී 27 | — | උප්පුවෙලි | 69.11. 2 |
| එම්සී 82 | — | ධීවර කාර්යාලය, ත්‍රිකුණාමලය | 69.11. 3 |
| ටී 53 | යන්මාර් අ. බ. 8 | රා. ලං. නා. හමුදා භූමිභාගය, ත්‍රිකුණාමලය | 69.11. 4 |

අයි. ඕ. කේ. ජී. ප්‍රනාන්දු,
ධීවර අධ්‍යක්ෂ.

1969 සැප්තැම්බර් මස 17 වෙනි දින,
කොළඹ, ධීවර දෙපාර්තමේන්තුවේ දී ය.

9–945—69.9.26 දින අංක 14,873 දරන ගැසට් පත්‍රය

---

## ධීවර දෙපාර්තමේන්තුව

### පාවිච්චි කරන ලද නාවික ඩීසල් එන්ජින් වෙන්දේසියේ විකිණීම

පාවිච්චි කරන ලද නාවික ඩීසල් එන්ජින්, වෙන්දේසියේ විකිණීම පහත සඳහන් උපලේඛනයේ දක්වෙන ස්ථානවලදී සහ දිනවලදී පෙ. ව. 9.30 ට සිදු කරනු ලැබේ.

2. උපලේඛනයේ සඳහන් ස්ථානයන්හිදී මෙම එන්ජින් පරීක්ෂා කර බැලිය හැකිය.

3. ගෙවීම් පහත දක්වෙන පරිදි මුදලින්ම කළ යුතුය :—

(අ) ඇන්ජිමේ විකුණුම් මිළෙන් $\frac{1}{4}$ ක් විකිණීම අවසන් වූ වහාම ;

(ආ) විකුණුම් මිළෙන් ඉතිරි $\frac{3}{4}$ කොටස දින 3 ක් ඇතුළත දී ;

(ඇ) කෙසේ වුවද, යම් ඇන්ජිමක් වෙනුවෙන් යමෙකු විසින් ඉදිරිපත් කරනු ලබන ලන්සුවක් තාවකාලික වශයෙන් පිළිගැනීමට ඉඩ තිබේ. එම ලන්සුව අවසාන වශයෙන් පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීම හෝ දින 14 ක කාලයකට සීමා කරනු ලැබේ. එවැනි අවස්ථාවලදී ඇන්ජිමේ විකුණුම් මිළෙන් $\frac{1}{4}$ ක තැන්පත් මුදලක් වෙන්දේසිය අවසන් වූ වහාම ගෙවිය යුතුය. එම ලන්සුව පිළිගනු ලැබුවහොත් විකුණුම් මිළෙන් ඉතිරි $\frac{3}{4}$ මුදල අවසාන පිළිගැනීමේ දැන්වීම එවා දින 3 ක් ඇතුළත ගෙවිය යුතුය. මෙම මුදල ගෙවීමට අපොහොසත් වුවහොත් එහි ප්‍රතිඵලය වන්නේ තැන්පත් මුදල අහිමිවීමයි. ලන්සුව ප්‍රතික්ෂේප කරනු ලැබුවහොත් තැන්පත් මුදල ආපසු ගෙවනු ලැබේ.

4. වෙන්දේසියේ විකුණන ලද එන්ජින් මුදල් ගෙවීමෙන් පසු ඉවත් කරගෙන යන තෙක් ජයග්‍රාහී ඉල්ලුම්කරුවන්ගේ සම්පූර්ණ වගකීම මත එම භූමියෙහිම තිබෙන්නට හරිනු ලැබේ.

## උපලේඛනය

| යාත්‍රා අංකය | ඇන්ජිමේ වර්ගය | තිබෙන ස්ථානය | වෙන්දේසි කරන දිනය |
|---|---|---|---|
| ජේබී 26 | කුබෝටා | ධීවර කාර්යාලය, පානදුර | 69.10.30 |
| ටී 80 | බුක් | ධීවර කාර්යාලය, කටුනේරිය | |
| එප් 21 | බුක් | එම | |
| ටී 331 | අ. බ. 16 පෙටර් | එම | 69.10.31 |
| එප් 20 | පාර්සන්ස් සිලින් 2 | එම | |
| ජේපිඑප් 48 | කුබෝටා අ. බ. 17 | එම | |
| ටී 150 | බුක් අ. බ. 11 | ප්‍රාදේශීය ධීවර කාර්යාලය, මීගමුව | |
| එප් 22 | බුක් | එම | |
| ටී 230 | කුබෝටා | එම | |
| — | ලිස්ටර් එච්ඒ 2 (අංකය 607 එච්ඒ 2 එම 10) | එම | |
| ටී 133 | බුක් | එම | 69.11. 2 |
| ටී 106 | බුක් අ. බ. 11 | එම | |
| ටී 115 | ලිස්ටර් අ. බ. 12¾ | එම | |
| ටී 88 | ඩියුට්ස් අ. බ. 9 | එම | |
| ටී 222 | බුක් | එම | |
| ටී 116 | ලිස්ටර් අ. බ. 12¾ | එම | |
| — | යන්මාර් අ. බ. 18 (අංකය 3347) | ධීවර අභ්‍යාස මධ්‍යස්ථානය, මීගමුව | 69.11. 3 |
| එස්අයිසී 43 | ටෝර්පිඩෝ | ධීවර කාර්යාලය, ත්‍රිකුණාමලය | |
| එස්අයිසී 96 | ටෝර්පිඩෝ | එම | |
| ජේබී 27 | යන්මාර් අ. බ. 8 | එම | 69.11. 3 |
| ටී 286 | යන්මාර් | එම | |
| ටීඑස් 11 | පාර්සන්ස් අ. බ. 11 | එම | |
| එස්අයිසී 77 | ටෝර්පිඩෝ | ධීවර කාර්යාලය, කන්කසන්තුරේ | 69.11. 4 |
| එස්අයිසී 127 | ටෝර්පිඩෝ | ධීවර කාර්යාලය, මුලතිවු | 69.11. 5 |

අයි. ඔ. කේ. ජී. ප්‍රනාන්දු,
ධීවර අධ්‍යක්ෂ.

1969 සැප්තැම්බර් මස 17 වෙනි දින,
කොළඹ, ධීවර දෙපාර්තමේන්තුවේ දී ය.

9–946–69.9.26 දින අංක 14,873 දරණ ගැසට් පත්‍රය

---

# තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම්

## රේන්ද බද්ද කේරතිව්—සංගුපිඩ්ඩි පාලම් පාරු සේවය 1969 නොවැම්බර් සිට 1970 ඔක්තෝබර් 31 වැනිද දක්වා

1969 නොවැම්බර් මස 1 වෙනි දින සිට 1970 ඔක්තෝබර් මස 31 වැනි දින දක්වා කාලය තුළ කේරතිව්—සංගුපිඩ්ඩි අතර පාලම් පාරු සේවයේ රේන්ද බද්ද මිළදී ගැනීම සඳහා ටෙන්ඩර් පත් යාපනය දිස්ත්‍රික්කයේ දිසාපති තැන විසින් 1969 ඔක්තෝබර් මස 12 වැනි කිවි දින පෙරවරු 10 දක්වා යාපනය කච්චේරියේදී භාරගනු ලැබේ.

2. රුපියල් 100ක ටෙන්ඩර් තැන්පත් මුදලක් යාපනය කච්චේරියට භාරදී ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් පසු කච්චේරියෙන් ලබා ගතහැකි ටෙන්ඩර් ෆෝර්මවල පිටපත් දෙකකින් යුතුව ටෙන්ඩර් පත් පිළියෙල කළයුතුය. මින්පසු සඳහන් කරනු ලබන ඇප මුදල නියමිත කාල සීමාව තුළදී බැඳීමට හෝ විකිණීමේ කොන්දේසි ඇප බැඳුම්කරය යනාදිය අත්සන් කිරීමට පිළිගත් ටෙන්ඩර්කරු අපොහොසත් වුවහොත් හෝ ප්‍රතික්ෂෙප කළහොත් ඔහුගේ තැන්පත් මුදල රාජසන්තක කරනු ලබන අතර,මින් මතු රජයේ කොන්ත්‍රාත් බදු යනාදිය ලබා ගැනීමට නොහැකි වන පරිදී ඔහුගේ නම කොන්ත්‍රාත් පැහැර හරින්නන්ගේ නාම ලේඛණයට ද ඇතුළත් කරනු ඇත. අනික් සෑම ටෙන්ඩර්කරුවන්ගේම තැන්පත් මුදල් ජයග්‍රාහක ටෙන්ඩර්කරු විසින් විකිණීමේ කොන්දේසි හා ඇප බැඳුම්කරය අත්සන් කළපසු ආපසු ගෙවනු ඇත.

3. සීල් තබන ලද ටෙන්ඩර් පත් 1969 ඔක්තෝබර් මස 12 වැනි දින පෙරවරු 10 ට පෙර යාපනය මහලේකම් කාර්යාලයේ දී කච්චේරියේ මගේ කාර්යාල සහකාර තැන වෙත පැමිණ භාරදීමට පුළුවන. සේවයේ විස්තර හා ටෙන්ඩර්කරුගේ නම හා ලිපිනය කවරයේ පිට සඳහන් කළ යුතුය.

4. 1969 ඔක්තෝබර් මස 12 වැනි දින පෙරවරු 10 ට මගේ කාර්යාල සහකාර තැනගේ කාර්යාලයේදී ටෙන්ඩර් පත් විවෘත කරන අතර ටෙන්ඩර් පත් විවෘත කරන වේලාවේ ටෙන්ඩර්කරුවන්ට සැමිණ සිටීමටද අවසර දෙනු ඇත.

5. ඉහතින් සඳහන් කර ඇති දිනය හා වේලාවෙන් පසුව ලැබෙන කිසිම ටෙන්ඩර් පත්‍රයක් සලකා බලනු නොලැබේ.

6. කච්චේරියේ දී පරික්ෂා කළහැකි විකිණීමේ කොන්දේසි කෙරෙහි ටෙන්ඩර් පත් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන අයගේ අවධානය යොමු කෙරේ.

-7. ටෙන්ඩරය මිළදී ගන්නා මුදලින් දහයෙන් එකක් වහාම තැන්පත් කිරීමටත්, මුදලින් භාගයක් සඳහා පිළිගත් ඇපයක් ඉදිරිපත් කිරීමට හෝ මිළදී ගත් මුදලින් තුනෙන් එකක් මුදලින් තැන්පත් කිරීමටත් හෝ ටෙන්ඩරය පිළිගෙන දින දහයක් ඇතුළත පිළිගත් ටෙන්ඩර්කරුට සිදුවනු ඇත.

8. පිළිගත් ටෙන්ඩර්කරු විසින් ඇප බැඳුම්කරය වෙනුවෙන් ඉදිරිපත් කරන දේපොළවල ඔප්පු පරික්ෂාකර බලා ඒ පිළිබඳව සිය අදහස් දැක්වීමටත්, ඇප බැඳුම්කරය පරික්ෂා කොට නිරවුල් කිරීමටත් ලියකියවිලි පරික්ෂා කොට, ඇප බැඳුම්කරය පිළියෙල කිර්මත්, වෙනුවෙන් රජයේ නීතිඥ තැනට ගෙවිය යුතු ගාස්තුව සඳහා සෑහෙන මුදලක් ද පිළිගත් ටෙන්ඩර්කරු විසින් තැන්පත් කළයුතු අතර. දේපොළ තක්සේරු කිරීමේ ගාස්තු හා මුද්දර ආඥාපණත යටතේ බැඳුම්කරය වෙනුවෙන් ගෙවියයුතු මුද්දර ගාස්තුව ගෙවීමටත් ඔහුට සිදුවනු ඇත.

9. ඇප වෙනුවෙන් ඉදිරිපත් කරන සියළු ඔප්පු සමග එකී දේපොළ නිරවුල් බවට ඉඩම් රෙජිස්ට්‍රාර් තැනගෙන් ලබාගත් සහතිකයක් ද ඉදිරිපත් කළ යුතුය. මෙම සහතිකය ලබාගත යුත්තේ ඇප බැඳුම්කරය ඉදිරිපත් කරන්නාගේ වියදමෙනි.

10. ටෙන්ඩර් පත් කිසිවක් නොලැබුණ හොත් හෝ ඉදිරිපත් කොට ඇති ටෙන්ඩර් අසතුටුදායක වුවහොත් ටෙන්ඩර් භාර ගැනීමට නියමිත දින ටෙන්ඩර් පත් විවෘත කිරීමෙන් පසුව මෙම බද්ද ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට ඉඩ ඇත.

11. කිසියම් ටෙන්ඩරයක් හෝ සියළුම ටෙන්ඩර් පත් කිසිම ප්‍රශ්නයක් නොමැතිව ප්‍රතික්ෂෙප කිරීමේ බලය ආණ්ඩුවේ ඒජන්ත සතුය.

12. ටෙන්ඩර් කර ඇති බද්ද නිසි පරිදී කරගෙන යෑම සඳහා පිළිගත් ටෙන්ඩර්කරු විසින් සේවයෙහි යෙදවිය යුත්තේ ලාංකික කම්කරුවන් පමණකි.

13. ටෙන්ඩර් කර ඇති රේන්ද බද්ද පවත්වාගෙන යාමේදී ලාංකික කම්කරුවන්ම පමණක් සේවයේ යෙදවීම එම බද්දේ කොන්දේසියක් වන අතර පිළිගත් ටෙන්ඩර්කරු විසින් මෙම කොන්දේසි ක්‍රියාත්මක කිරීමට අපොහොසත් වුවහොත් එය එකී බද්දේ ව්‍යවස්ථා කඩ කිරීමක් ලෙස සලකනු ලබන අතර එකී කොන්ත්‍රාත්තුව අවලංගු කිරීමට ඉඩ ඇත.

කෙසේ වුවද විශේෂ අවස්ථාවන්හිදී ආණ්ඩුවේ ඒජන්ත විසින් භාණ්ඩාගාරයේ ද එකඟත්වය ඇතිව තමා විසින් කලින් ලියවිල්ලකින් අනුමත කරන ලද ලාංකික නොවන කම්කරුවන් සේවයේ යෙදවීමට අවසරයක් දීමට ඉඩ ඇත. එවැනි ලිඛිත අවසරයක් හා එකඟත්වයක් නොමැතිව ලාංකික නොවන කම්කරුවන් සේවයේ යෙදවීම තහනම්ය.

14. මේ පිළිබඳ වෙනත් විස්තර යාපනය ආණ්ඩුවේ ඒජන්ත තැනට ඉල්ලුම් කිරීමෙන් ලබාගත හැක.

එප්. සී. පීටර්ස්,
යාපනය දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්ත.

1969 සැප්තැම්බර් මස 16 වැනි දින,
යාපනය දිසාපති කාර්යාලයේ දීය.

9–920–69.9.26 දින අංක 14,873 දරණ ගැසට් පත්‍රය

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

## වෙන්දේසියේ විකිණීමයි

**ගම්පහ පරාක්‍රම පාරේ අංක 12 දරණ නිවසේ පදිංචි හේවා රාජගේ මිවෙල් මහත්මයාට අයිති බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ සියනෑ කෝරළේ මැද පත්තුවේ ගම්පහ පළාත් ආණ්ඩු සභා සීමාව තුළ බැණ්ඩියමුල්ලේ පිහිටි කෝන්ගහවත්ත නමැති ඉඩමේ "බී" අක්ෂරය දරණ රු. 1, පර්. 08.27 ක ප්‍රමාණයෙන් යුත් වටිනා බිම් කැබැල්ල සහ එහි පිහිටි පරාක්‍රම පාරට අයිති වරිපනම් අංක 12 දරණ ගොඩනැගිල්ල ඇතුළු සියළු දේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමයි**

ලංකා රජයේ උකස් බැංකු ආඥපනතේ 62 (1) දරණ වගන්තිය යටතේ ලංකා රජයේ උකස් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද විශේෂ තීරණයක් විධිමත්ව ගැසට් පත්‍රයේ පළ කර ප්‍රසිද්ධ කිරීමෙන් ඒ යටතේ ලැබී ඇති බලතල අනුව සහ එකී අධ්‍යක්ෂ මණ්ඩලයෙන් බලය ලත් පරිදි—

1960 මාර්තු මස 3 වෙනි දින එම්. වී. ගුණවර්ධන ප්‍රසිද්ධ නොතාරිස් තැන විසින් සහතික කරන ලද අංක 408 දරණ උකස්කරය පිට ගම්පහ පරාක්‍රම පාරේ අංක 12 දරණ නිවසේ පදිංචි හේවා රාජගේ මිවෙල් මහත්මයා විසින් මෙම බැංකුවට උකස් කරන ලද, එම්. එස්. සල්ගාදු බලය ලත් මිනින්දෝරු තැන විසින් 1955.10.20 දින සාදන ලද අංක 188 දරණ මිනුම් සැලැස්මේ ප්‍රකාර රූඩ් එකකුත් පර්චස් අටයි දශම දෙකයි හත (රූ. 1 පර්, 08.27) ක ප්‍රමාණයෙන් යුත් ඉහත කී බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ සියනෑ කෝරළේ මැද පත්තුවේ ගම්පහ පළාත් ආණ්ඩු සභා සීමාව තුළ බැන්ඩිය මුල්ලේ පිහිටි කෝන්ගහවත්ත යන ඉඩමේ "බී" අක්ෂරය දරණ බිම් කැබැල්ල සහ එහි පිහිටි පරාක්‍රම පාරට අයිති වරිපනම් අංක 12 දරණ ගොඩනැගිල්ල ඇතුළුව සියළු දේත් සමග ඉහතකී උකස්කරය පිට අය විය යුතු මුදල වන රු. 28,353.82 ක් අය කර ගනු සඳහා සහ 1963.11.21 වෙනි දින සිට වෙන්දේසිය සිදු කරන දින දක්වා රු. 26,173.56 කට අවුරුද්දකට සියයට 5½ බැගින් පොළිය අය කරගනු සඳහා සහ ලංකා රජයේ උකස් බැංකු ආඥපනතේ 63 වන වගන්තිය යටතේ අය කර ගත හැකි වියදම් සහ අනිකුත් මුදල්ද අය කර ගනු සඳහා 1969 ඔක්තෝබර් 31 වෙනි සිකුරාද පස්වරු 4 ට එය පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

වැඩි විස්තර කොළඹ හෝටන් පෙදෙසේ අංක 91 දරණ තැන පිහිටි ලංකා රජයේ උකස් බැංකුවෙන් ලබාගත හැකිය.

ඩබ්ලිව්. ඒ. සෝමපාල දිසානායක,
බලයලත් වෙන්දේසිකරු.

අංක 20, උසාවිය පාර,
ගම්පහ.
1969.9.14

9–885—69.9.26 දින අංක 14,873 දරන ගැසට් පත්‍රය

# විවිධ දැන්වීම්

## සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව

### ජාතික සංස්කෘතික ත්‍යාග පිරිනැමීම

මෙරට සාහිත්‍යය හා ලලිත කලා වර්ධනය කිරීමේ හා උසස් නිර්මාණ බිහි කිරීමට කලාකරුවන් උනන්දු කරවීමේ පරමාර්ථයෙන්, සාහිත්‍යය නාට්‍ය, මුද්‍රානාට්‍ය, ගුවන්විදුලි නාට්‍ය, චිත්‍රපට, චිත්‍ර, මූර්ති හා සංගීතය යන කලා විෂයයන්ට අයත් කෘතීන් සඳහා පිරිනැමෙන ජාතික සංස්කෘතික ත්‍යාග පිළිබඳ විස්තර පහත පළවේ.

2. ත්‍යාග ප්‍රදානය සඳහා සලකා බලනු ලබන්නේ 1969 ජනවාරි 1 වැනි දින සිට 1969 දෙසැම්බර් 31 වැනි දින දක්වා වූ කාලය තුළ නිර්මිත කරන ලද කෘතීන් පමණි.

3. තරඟය සඳහා කලා කෘතීන් සලකා බැලීමේ ක්‍රමය ඒ ඒ අංශය යටතේ විස්තර කර ඇත.

4. ත්‍යාග පිරිනැමීමට අදළ සෑම කාර්යයක් සම්බන්ධයෙන් ජාතික සංස්කෘතික ත්‍යාග මණ්ඩලයේ තීරණය අවසාන තීරණය වේ.

(අ) **ගරු අග්‍රාමාත්‍යතුමාගේ සාහිත්‍ය ත්‍යාගය**—රු. 25,000.00
මෙය ශ්‍රේෂ්ඨතම සාහිත්‍ය කෘතිය (මුද්‍රිත) සඳහා පිරිනමනු ලැබේ. මේ ත්‍යාගය සඳහා නිර්මාණාත්මක කෘති හැරුණු විට පර්යේෂණ, විවේචන ආදී ක්ෂෙත්‍රයන්ට අයත් මුද්‍රිත ග්‍රන්ථ ද සලකා බලනු ලැබේ.

(ආ) **සාහිත්‍යය**—
**සිංහල**
හොඳම නවකථාවට ... රු. 2,500.00 ත්‍යාග 1 යි
හොඳම කෙටිකථා සංග්‍රහයට ... රු. 2,500.00 ත්‍යාග 1 යි
හොඳම පද්‍යග්‍රන්ථයට ... රු. 2,500.00 ත්‍යාග 1 යි
හොඳම පරිවර්තනයට ... රු. 2,000.00 ත්‍යාග 1 යි
හොඳම නාට්‍ය ග්‍රන්ථයට ... රු. 2,500.00 ත්‍යාග 1 යි
හොඳම ළමා පොතට ... රු. 2,500.00 ත්‍යාග 1 යි
විවිධ (පර්යේෂණ විවේචන ආදිය) ... රු. 2,500.00 ත්‍යාග 4 යි
**දෙමළ**
හොඳම නවකථාවට ... රු. 2,500.00 ත්‍යාග 1 යි
හොඳම කෙටිකථා සංග්‍රහයට ... රු. 2,500.00 ත්‍යාග 1 යි
හොඳම පද්‍යග්‍රන්ථයට ... රු. 2,500.00 ත්‍යාග 1 යි
විවිධ (පර්යේෂණ, විවේචන, ළමා පොත් ආදිය) රු. 2,500.00 ත්‍යාග 2 යි

**සංලක්ෂ්‍යය :** ත්‍යාග පිරිනැමීම පිණිස සලකා බලනු ලබන්නේ 2 වැනි ඡෙදයේ සඳහන් කාල පරිච්ඡෙදය තුළ මුද්‍රණයකොට, මුද්‍රණ ශිල්පීන්ගේ හා ප්‍රකාශකයින්ගේ ආඥපණත (179 පරිච්ඡෙදය) යටතේ පොත් හා ප්‍රවෘත්ති පත්‍ර රෙජිස්ත්‍රාර් කාර්යාලයේ ලියාපදිංචි කරන ලද ග්‍රන්ථ පමණි. තරඟකරුවන් ග්‍රන්ථ පිටපත් ඉදිරිපත් කිරීම අවශ්‍ය නොවේ. ත්‍යාග පිරිනැමීමට සුදුසු පොත් තෝරා ගැනීම ශ්‍රී ලංකා සාහිත්‍ය මණ්ඩලය විසින් කරනු ලැබේ.

(ඇ) **වේදිකා නාට්‍ය**—
**සිංහල**
හොඳම වේදිකා නාට්‍ය දෙක සඳහා ... රු. 2,500.00 ත්‍යාග 1 යි
රු. 1,000.00 ත්‍යාග 1 යි
**දෙමළ**
හොඳම වේදිකා නාට්‍යය සඳහා ... රු. 2,500.00 ත්‍යාග 1 යි

**සංලක්ෂ්‍යය :** ත්‍යාග ප්‍රදනය සඳහා සලකා බලනු ලබන්නේ ස්වතන්ත්‍ර නිර්මාණ පමණි. වර්ෂය තුළ නිෂ්පාදනය කරනු ලබන නාට්‍ය ද, ලංකා කලා මණ්ඩලය විසින් දනට සංවිධානය කරගෙන යනු ලබන නාට්‍ය ද මේ සඳහා සලකා බලනු ලැබේ. ත්‍යාග පිරිනැමීමට සුදුසු නාට්‍ය තෝරා ගැනීමට වර්ෂය අවසානයේ දී නාට්‍ය උත්සවයක් පැවැත්වීමට කටයුතු සලකනු ඇත.

(ඈ) **මුද්‍රා නාට්‍ය**—
හොඳම මුද්‍රා නාට්‍යයට ... රු. 2,500.00 ත්‍යාග 1 යි

**සංලක්ෂ්‍යය :** ත්‍යාග ප්‍රදනය සඳහා සුදුසු මුද්‍රා නාට්‍ය තෝරාගැනීම පිණිස ඒවා ඉහත සඳහන් නාට්‍ය උත්සවයේ දී වේදිකා ගතකිරීමට විධිවිධාන යොදනු ඇත.

(ඉ) **ගුවන්විදුලි නාට්‍ය**—
**සිංහල**
හොඳම ගුවන්විදුලි නාට්‍යයට ... රු. 1,000.00 ත්‍යාග 1 යි
**දෙමළ**
හොඳම ගුවන්විදුලි නාට්‍යයට ... රු. 1,000.00 ත්‍යාග 1 යි

**සංලක්ෂ්‍යය :** මෙම ත්‍යාග ලංකා ගුවන්විදුලි සංස්ථාවේ අධ්‍යක්ෂ ජනරාල් තුමාගේ නිර්දේශ පිට පිරිනමනු ලැබේ.

(ඊ) **චිත්‍රපට**—
**සිංහල**
හොඳම අධ්‍යක්ෂණයට ... රු. 1,500.00 ත්‍යාග 1 යි
හොඳම කැමරා ශිල්පියාට ... රු. 1,000.00 ත්‍යාග 1 යි
හොඳම රචකයාට ... රු. 1,000.00 ත්‍යාග 1 යි

මෙරට නිෂ්පාදනය කරන ස්වතන්ත්‍ර ද්‍රවිඩ චිත්‍රපටවලට ද මෙවැනි ම ත්‍යාග තුනක් පිරිනමනු ලැබේ.

(උ) **චිත්‍ර**—
හොඳම චිත්‍ර දෙක සඳහා ... රු. 2,000.00 ත්‍යාග 1 යි
රු. 1,000.00 ත්‍යාග 1 යි

(ඌ) **මූර්ති**—
හොඳම නිර්මාණ දෙක සඳහා ... රු. 2,500.00 ත්‍යාග 1 යි
රු. 1,000.00 ත්‍යාග 1 යි

**සංලක්ෂ්‍යය :** පළාත්බද චිත්‍ර හා මූර්ති ප්‍රදර්ශන පවත්වා, එහි දී තෝරෙන කෘතීන් අඩංගු ප්‍රදර්ශනයක් වර්ෂය අවසානයේ කොළඹ දී පැවැත් වෙනු ඇත. ත්‍යාග පිරිනැමීමට සුදුසු කෘතීන් තෝරා ගනු ලබන්නේ එහිදී ය.

(එ) **සංගීතය**—
**සිංහල**
හොඳම සංගීත නිර්මාණයට ... රු. 2,000.00 ත්‍යාග 1 යි
**දෙමළ**
හොඳම සංගීත නිර්මාණයට ... රු. 2,000.00 ත්‍යාග 1 යි

**සංලක්ෂ්‍යය :** ත්‍යාග සඳහා සමූහ ගායන, සමූහ වාදන, චිත්‍රපටයක, නාට්‍යයක හෝ මුද්‍රා නාට්‍යයක යොදගෙන ඇති සංගීතය ද සලකා බලනු ලැබේ. මෙම ත්‍යාගය හොඳම ගීතයකට වුව ද පිරිනැමීමට ඉඩ ඇත. ත්‍යාග පිරිනැමීමට සුදුසු කෘති තෝරාගැනීම සඳහා සංගීත සන්දර්ශනයක් සංවිධානය කරනු ලැබේ.

එච්. එච්. බණ්ඩාර,
ජාතික සංස්කෘතික ත්‍යාග මණ්ඩලයේ ලේකම්
හා සහකාර සංස්කෘතික අධ්‍යක්ෂ.

සංස්කෘතික කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව,
135, ධර්මපාල මාවත,
කොළඹ 7, 1969 සැප්තැම්බර් 22 දින.

9–1081—69.9.26 දින අංක 14,873 දරන ගැසට් පත්‍රය

# ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳ වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව, එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුලත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවට ද හේතුවන බව සලකන්න.

ආණ්ඩුවේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දායක මුදල් භාර නොගනී. සියළුම දායක මුදල් කොළඹ මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙළින්ම ගෙවිය යුතුය.

## උපලේඛනය

### 1969

| මාසය | | පළ කිරීමේ දිනය | | ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | |
|---|---|---|---|---|---|---|
| ජූනි | ... | 69. 6. 6 සිකුරාද | ... | 69. 5.30 සිකුරාද | දවල් | 12.00 |
| | | 69. 6.13 සිකුරාද | ... | 69. 6. 6 සිකුරාද | දවල් | 12.00 |
| | | 69. 6.20 සිකුරාද | ... | 69. 6.13 සිකුරාද | දවල් | 12.00 |
| | | 69. 6.27 සිකුරාද | ... | 69. 6.20 සිකුරාද | ප.ව | 3.30 |
| ජූලි | ... | 69. 7. 4 සිකුරාද | ... | 69. 6.27 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 69. 7.11 සිකුරාද | ... | 69. 7. 4 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 69. 7.18 සිකුරාද | ... | 69. 7.11 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 69. 7.25 සිකුරාද | ... | 69. 7.18 සිකුරාද | ප.ව. | 3.30 |
| අගෝස්තු | ... | 69. 8. 1 සිකුරාද | ... | 69. 7.25 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 69. 8. 8 සිකුරාද | ... | 69. 8. 1 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 69. 8.15 සිකුරාද | ... | 69. 8. 8 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 69. 8.22 සිකුරාද | ... | 69. 8.15 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 69. 8.29 සිකුරාද | ... | 69. 8.22 සිකුරාද | ප.ව. | 3.30 |
| සැප්තැම්බර් | ... | 69. 9. 5 සිකුරාද | ... | 69. 8.29 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 69. 9.12 සිකුරාද | ... | 69. 9. 5 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 69. 9.19 සිකුරාද | ... | 69. 9.12 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 69. 9.26 සිකුරාද | ... | 69. 9.19 සිකුරාද | ප.ව. | 3.30 |
| ඔක්තෝබර් | ... | 69.10. 2 බ්‍රහස්පතින්ද | ... | 69. 9.26 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 69.10. 9 බ්‍රහස්පතින්ද | ... | 69.10. 2 බ්‍රහස්පතින්ද | දවල් | 12.00 |
| | | 69.10.17 සිකුරාද | ... | 69.10. 9 බ්‍රහස්පතින්ද | දවල් | 12.00 |
| | | 69.10.24 සිකුරාද | ... | 69.10.17 සිකුරාද | දවල් | 12.00 |
| | | 69.10.31 සිකුරාද | ... | 69.10.24 සිකුරාද | දවල් | 12.00 |
| නොවැම්බර් | ... | 69.11. 7 සිකුරාද | ... | 69.10.31 සිකුරාද | දවල් | 12.00 |
| | | 69.11.14 සිකුරාද | ... | 69.11. 6 බ්‍රහස්පතින්ද | දවල් | 12.00 |
| | | 69.11.21 සිකුරාද | ... | 69.11.14 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 69.11.28 සිකුරාද | ... | 69.11.21 සිකුරාද | ප.ව. | 3.30 |
| දෙසැම්බර් | ... | 69.12. 5 සිකුරාද | ... | 69.11.28 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 69.12.12 සිකුරාද | ... | 69.12. 4 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| | | 69.12.19 සිකුරාද | ... | 69.12.12 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 69.12.26 සිකුරාද | ... | 69.12.18 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1969 ජූනි මස 13 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලය, කොළඹ.



ලංකාණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රිතයි